**<u>වෂර් 2022 ක් වූ ජූලි මස 12 වන දින පෙ.ව. 10.00 ට සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද</u>**

**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාතර්ාව</u>**

සහභාගිත්වය :- සභිකවරු

**01.** ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
**02.** ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
**03.** මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**04.** කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**05.** කසුන් හිරෝෂන මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**06.** විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**07.** කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**08.** චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**09.** පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**10.** සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**11.** කේ. ප්‍රියන්කා දමයන්ති ගුණවධර්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**12.** කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**13.** සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**14.** ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**15.** එච්.ඩී. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**16.** සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**17.** සූරියආරච්චිගේ සුජීව නිමර්ාන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**18.** පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**19.** සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**20.** ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**21.** අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**22.** තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**23.** මද්දගේ හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**24.** මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
**25.** ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**26.** එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**27.** කේ.ඩබ්. නිලූකා දශර්නී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභාමන්ත්‍රිනි
**28.** දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**29.** හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නොපැමිණි සභිකවරු :-

**01.** වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**02.** අධිකාරිවත්තගේ ප්‍රියන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
**03.** දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

04. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05.කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නිලධාරීන් :-

01.ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මිය - ලේකම් (වැ.බ.)
02.ජී.ඩී දුලානි සෙනෙවිරත්න මිය - සංවර්ධන නිලධාරී (සභා කටයුතු)

මෙදින පෙ.ව. 10.00 ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල්මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ. පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්, නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

1.2022.06.15 වන දින පැවති මහ සභා රැස්වීමේ වාතර්ාව සභා අනුමැතිය සලකා බැලීම
ඉහත සභා වාතර්ාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් පහත සංශෝධනයට යටත්ව සභා සම්මත විය.
මතුගම නැබඩ පාරට මුහුණ ලා ඉදි කරන ලද කඩ කාමර සඳහා තාවකාලික තක්සේරු මුදලක් ලෙස රු 15000 ක මුදලක් අය කල යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ කාන්ත සිරිවධර්න මහතා විසින් ස්ථිර කරන ලදී.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
නැබඩ පාරේ කඩ කාමර සඳහා විධිමත් තක්සේරුව ලැබෙන තෙක් රු.15000ක මුදලක් අය කරන්න තමයි සභා තීරණය වුණේ.

2.ගරු සභාපතිතුමාගේ නිවේදන - අද දින ප්‍රවාහන පහසුකම් පිළිබඳ ගැටළුවක් තියෙන නිසා සභාවට එන්න බැරි වුනොත් ඒ ගැන සලකලා බලලා සියලු මන්ත්‍රීවරුන් ගැන කටයුතු කරමු. ඒ ගැන කවුරුත් විරුද්ධ නැනේ.

3.නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නඳුන් ද සිල්වා මහතා අද දින සභාවට නොපැමිණීම දන්වන ලදී.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

මම කිව්වා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට තෙල් ටිකක් ගන්න ඉල්ලන්න කටයුතු කරන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඉල්ලන්නේ කොහොමද?IOC ඒවායින් අපිට තෙල් දෙන්නේ නෑ.සමූපකාරෙන් විතරයි දෙන්නේ.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

අපිට සභාවට එන්නවත් තෙල් නෑ.පෝලිම් වලට යන්න බෑ.ප්‍රශ්න ඇති වෙනවා.ඒක නිසා සතියකට දෙකකටවත් පෙට්‍රල් ටිකක් ලබා දෙන්න.නැත්නම් ගැටළුවක් වෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමා අපි සෑම පිරවුම්හලකටම දැනුම් දුන්නා සභාවට ප්‍රමුඛත්වය දෙන්න කියලා.සමුපකාරයට ආවොත් අපිට තෙල් දුන්නොත් දෙන්න පුළුවන්.වැරදි වංචා වෙනවා.අපිට බෑ ඒවාට කටයුතු කරන්න.

4. සංදේශ හා පෙත්සම් -

4.1 යටි බිම් හරස් මාර්ගයේ අවහිරතාවය සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යවන ලද ලිපියට එවන ලද පිළිතුරු ලිපිය සභාගත කරන ලදී.

4.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ලීලා මුණසිංහ මහත්මිය විසින් විදේශ නිවාඩු ඉල්ලුම් කල ලිපිය සභාගත කරන ලදී.

5. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න :-

5.1 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

5.1.1 හොරවල ඉඩම සඳහා ගෙන ඇති ක්‍රියාමාගර් මොනවාද?

5.1.2 I වාහන රක්ෂණය සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙල කුමක්ද?

ii එය ඊට වඩා අඩු සමාගමකට ලබා දීමට කටයුතු කරන්නේද?

5.1.3 ZA-0452 JCB යන්ත්‍රයේ වතර්මාන තත්වය කුමක්ද?
පිළිතුරු ලබා දී ඇත.

6. යථා පරිදි කල්දී ඇති යෝජනා :-

6.1 ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:

6.1.1 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත්ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.05.01 දින සිට 2022.05.30 දින දක්වා, කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියළු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | නම | වවුචර් අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|---|
| | **2022.05.05** | | | |
| 01 | ලංකා විදුලි බල මණ්ඩලය | 01 | සභාව සතු ආයතන සඳහා 2022 මාතර්ු විදුලි බිල්පත් ගෙවීම | 110230.20 |
| 02 | A.E. ආදිහෙට්ටි | 02 | යටදොලවත්ත ක්‍රීඩාපිටි තැන්පත් ආපසු ගෙවීම් | 2000.00 |
| 03 | L.A.I.C.ලියනාරච්චි | 03 | යටදොලවත්ත ක්‍රීඩාපිටි තැන්පත් ආපසු ගෙවීම් | 4000.00 |
| 04 | චතුම් ඇඩ්වටයිසින් | 04 | නවුත්තුඩුව මහජන පුස්තකාලය හා යටදොලවත්ත සුසානභූමිය සඳහා නාම පුවරු 02 ක් සකස් කිරිම | 25500.00 |
| 05 | කල්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 05 | පුස්තකාලයට අවශ්‍ය කෙම්පෙක්ස් ගම් ලීටර 4 ක් මිලදී ගැනීම | 6850.00 |
| 06 | සිතිජ ට්‍රේඩ් සෙන්ටර් | 06 | කොම්පෝස්ට් අංගනයට ප්ලාස්ටික් මේස 1ක් ලබා ගැනීම | 13500.00 |
| 07 | සිතිජ ට්‍රේඩ් සෙන්ටර් | 07 | කොස්ගහකන්ද පෙරපාසලට ප්ලාස්ටික් මේස 1ක් ලබා ගැනීම | 9850.00 |
| 08 | G.D.මලිත් ඩිල්ෂාන් | 08 | 2022 මාතර්ු වැලිපැන්න මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම | 8670.00 |
| 09 | H.D.K.B.D ද අල්විස් | 09 | 2022 මාතර්ු ගල්මත්ත පුස්තකාලයට පුවත්පත් සැපයීම | 10000.00 |
| 10 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 10 | 2022 මාතර්ු හේනේගම පුස්තකාලයට පුවත්පත් සැපයීම | 7920.00 |
| 11 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 11 | 2022 මාතර්ු හොරවල උප කායර්ාලීය පුස්තකාලයට පුවත්පත් සැපයීම | 9550.00 |
| 12 | ගයාන් මධුරංග තෙවරප්පෙරුම | 12 | 2022 මාතර්ු නවුත්තුඩුව පුස්තකාලයට පුවත්පත් සැපයීම | 7920.00 |
| 13 | නාමල් හාඩ්වෙයාර් | 13 | මතුගම ආයුවෙර්දයේ දොර අළුත්වැඩියා කිරීමට ද්‍රව්‍ය ලබා ගැනීම | 955.00 |
| 14 | ජෙනරල් ඇන්ඩ් මෝටර් ට්‍රේඩසර් | 14 | PE 6914 කැබ් රථයට බැටරි 1ක් මිලදී ගැනීම | 29700.00 |
| 15 | D.M.A.I.කල්දේරා | 15 | විෂබීජනාශක අත් සේදුම් දියර මිලදී ගැනීම 2022.03.22 | 26160.00 |
| 16 | D.M.A.I.කල්දේරා | 16 | විෂබීජනාශක අත් සේදුම් දියර මිලදී ගැනීම 2022.04.24 | 5400.00 |
| 17 | N.S.T.N.විරාජිනි | 17 | සෞඛ්‍ය අංශයට ග්ලවුස් මිලදී ගැනීම | 17500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | N.S.T.N.විරාජිනි | 18 | සෞඛ්‍ය අංශයට ඉදල්, කොසු මොබ් මිලදී ගැනීම | 13475.00 |
| 19 | ශ්‍රී ලංකා ආයුවෙර්ද ඖෂධ සංස්ථාව | 19 | ඖෂධ මිලදී ගැනීම සහා ආයුවෙර්ද සඳහා | 500000.00 |
| 20 | ගුණවර්ධන ගරාජ් | 20 | ABU 3966 ත්‍රීරෝද රථයේ බ්‍රේක් පද්ධතිය සෑදීම | 2000.00 |
| 21 | P.V.කපිල | 21 | ප්‍රධාන කායර්ාලයේ හා වැලිපැන්න උපකායර්ාලයේ ජල සැපයුම් අළුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම | 4795.00 |
| 22 | ඉන්ෆොබිට් ලංකා | 22 | පරිගණක ටෝනර් 10 ක් මිලදී ගැනීම (ගබඩාව සඳහා) | 32500.00 |
| 23 | ශ්‍රීපාලි ප්‍රින්ටසර් | 23 | පොල බිල්පොත් මුද්‍රණය කිරීම | 22000.00 |
| 24 | සෆාස්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 24 | ABU 3966 ත්‍රී රෝද රථයේ බ්‍රේක් පද්ධතිය සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම | 4570.00 |
| 25 | I.B.සුසන්ත | 25 | ZA 0452 JCB යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් අළුත්වැඩියාව | 1200.00 |
| 26 | P.S.K.සවර්ස් සෙන්ටර් | 26 | L J 6098 ටිපර් රථය සේවා කිරීම | 37400.00 |
| 27 | කල්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 27 | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | 29400.00 |
| 28 | P.A.D.V.C.ගුණතිලක | 28 | වැලිපැන්න උප කායර්ාලයේ සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය | 3000.00 |
| 29 | අජර්ුන කිරිඇල්ල | 29 | 2022 අප්‍රේල් මහ සහා සංග්‍රහ අත්තිකාරම් පියවීම | 17162.00 |
| 30 | W.A.සුනිල් ප්‍රසන්න | 30 | ආදායම් පරීක්ෂක 2022 පෙබරවාරි නිවාඩු දින වැටුප් | 5665.00 |
| 31 | W.A.සුනිල් ප්‍රසන්න | 31 | ආදායම් පරීක්ෂක 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 5665.00 |
| 32 | W.A.M.I.S.තෙන්නකෝන් | 32 | ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 2 ක් ලබා ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල් ප්‍රතිපූණර්ය කිරීම | 34386.00 |
| 33 | W.A.M.I.S.තෙන්නකෝන් | 33 | ආදාහනාගාරය සඳහා ගෑස් ලබා ගැනීමට අත්තිකාරම් ගැනීම | 86250.00 |
| 34 | 805 ඒ මතුගම බටහිර මිහිඳු වැඩිහිටි සමිතිය | 34 | ධමර්රාජ මාවත හිල්ටොප් අතුරු මාගර්ය කොන්ක්‍රීට් දමා සංවධර්නය කිරීම අවසාන ගෙවීම | 448317.51 |
| 35 | සභාපති,මතුගම ප්‍රාදේශිය සභාව | 35 | විශ්‍රාම පාරිතෝෂික මුදලින් පොදු ගිණුමට තැන්පත් කරන ලද සේවක ණය මුදල් නැවත සේවක ණය ගිණුමට බැර කිරීම | 932492.75 |
| | **2022.05.09** | | | |
| 36 | කේ.කේ.ඩී.ආර් සංජීව | 36 | 2022 අප්‍රේල් විශේෂ සතිපොල සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම | 60000.00 |
| 37 | නෙක්ෆා ඔස්ට්‍රේලියා පුද්ගලික සමාගම | 37 | 2021 අප්‍රේල් සිට 2022 ජනවාරි දක්වා වෙබ් අඩවි බිල්පත් | 49500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 38 | අජර්ුන කිරිඇල්ල | 38 | තණකොල කපන යන්ත්‍ර සඳහා තංගුස් නූල් ලබා ගැනීම වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් පියවීම | 23996.00 |
| 39 | ජයසිරි එන්ටප්‍රයිසස් | 39 | ගල්මත්ත හා මතුගම තණකොල කපන යනත්‍ර හා යාන්ත්‍රික කියත් අළුත්වැඩියාව | 6755.00 |
| 40 | දසුන් උපේන්ද්‍ර කළුතරගේ | 40 | මතුගම ඩිපෝ පාර අළුත්වැඩියාව සඳහා චිප්ස් ගල් කියුබ් 03 ක් හා 3/4 ගල් කියුබ් 03 ක් මිලදී ගැනීම | 60000.00 |
| 41 | මතුගම ඒජන්සීස් පුද්ගලික සමාගම | 41 | ආදාහනාගාරය සඳහා 37 1/2 ලිටර්ෝ ගෑස් සිලින්ඩර් 02 ක් ලබා ගැනීම | 34500.00 |
| 42 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 42 | 2022 අප්‍රේල් ව්‍යාපෘති වැටුප් හොරවල උපකායර්ාලය | 158755.44 |
| 43 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 43 | 2022 අප්‍රේල් දෛනික වැටුප් හොරවල උපකායර්ාලය | 75923.39 |
| 44 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 44 | 2022 අප්‍රේල් ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උපකායර්ාලය | 54149.04 |
| 45 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 45 | 2022 අප්‍රේල් ඩෙංගු මධර්න වැඩසටහන දෛනික වැටුප් | 225210.98 |
| 46 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 46 | 2022 අප්‍රේල් දෛනික වැටුප් වැලිපැන්න උපකායර්ාලය | 95903.43 |
| 47 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 47 | 2022 අප්‍රේල් ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 376581.36 |
| 48 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 48 | 2022 අප්‍රේල් දෛනික වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 201796.39 |
| 49 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 49 | 2022 අප්‍රේල් විෂබීජහරණ වැඩසටහන වැටුප් | 175984.38 |
| 50 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 49 A | 2022 මැයි වැටුප් අත්තිකාරම් හොරවල උපකායර්ාලය | 1500.00 |
| 51 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 49 B | 2022 මැයි වැටුප් අත්තිකාරම් වැලිපැන්න උපකායර්ාලය | 1000.00 |
| 52 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 49 C | 2022 මැයි වැටුප් අත්තිකාරම් මතුගම ප්‍රධාන කායර්ාලය | 14600.00 |
| | **2022.05.17** | | | |
| 53 | එස්.එම් අයෝනා | 50 | කා.කා.ස 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7545.96 |
| 54 | පී.වී සීතා රංජනී | 51 | ක.සේ.නි 2022 ජනවාරි/පෙබරවාරි/මාතර්ු අතිකාල | 9269.32 |

| | | | | |
|---|---|---|---|---|
| 55 | කේ.එල් රංජිත් | 52 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (විදුලි අංශය) | 573.10 |
| 56 | ඩබ්.ඩී රන්දික නදීශාන් | 53 | පොදු වෙළඳපොල භාරකරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7603.30 |
| 57 | කේ.එල් රංජිත් | 54 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා (විදුලි අංශය) | 802.34 |
| 58 | කේ.එල් රංජිත් | 55 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා (විදුලි අංශය) | 1318.13 |
| 59 | චන්දන පුෂ්පකුමාර | 56 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (ප්‍රධාන කායර්ාලය හා ආදාහනාගාර මුර රාජකාරී) | 17166.60 |
| 60 | එල් .ඒ ගාමිණී | 57 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (ශ්‍රවණාගාරය මුර රාජකාරී ආවරණය) | 15301.20 |
| 61 | බී.කේ.සුරාජ් | 58 | රියදුරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 6895.70 |
| 62 | එස්.ඒ ඩී රංගජීව | 59 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (පොදු වෙළඳපල රාජකාරී) | 9722.00 |
| 63 | ඊ.ඒ කසුන් | 60 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (ආදාහනාගාරය මුර රාජකාරී) | 11221.20 |
| 64 | ජේ.ඩී ප්‍රභාත් කුමාර | 61 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (යටදොලවත්ත උප කායර්ාලය මුර රාජකාරී) | 2524.77 |
| 65 | කරුණාලාල් ඇපා | 62 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 22959.00 |
| 66 | ජේ.ඩී ප්‍රභාත් කුමාර | 63 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 3085.83 |
| 67 | සී.පී මුණසිංහ | 64 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (ප්‍රධාන කායර්ාලය දිවා මුර රාජකාරී) | 11666.40 |
| 68 | එම්.ඒ දමිත් | 65 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 4005.54 |
| 69 | ජානක රුවන් දයාරත්න | 66 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7703.20 |
| 70 | කේ.ඒ සරත් | 67 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 2155.44 |
| 71 | උදාර සමරමාන්න | 68 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 6066.27 |
| 72 | එම්.ඒ සේනාරත්න | 69 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 11383.20 |
| 73 | සංජය එරික් ලසන්ත | 70 | මුරකරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7066.08 |
| 74 | එච්.ඩබ්.ඩී ඉන්දිකා ප්‍රියදශර්නී | 71 | කා.කා.ස2022 අප්‍රේල් අතිකාල දීමනා | 3890.52 |
| 75 | එම්.ඒ.පී.එස්.කේ.කුලරත්න | 72 | ක.සේ.නි 2022 අප්‍රේල් අතිකාල | 4440.32 |
| 76 | ආර්.එම්.සන්දනායක | 73 | ක.සේ.නි 2022 අප්‍රේල් අතිකාල | 10009.68 |

| | | | | |
|---|---|---|---|---|
| 77 | යු.කේ.ඩී සුමිත් | 74 | කා.කා.ස 2022 අප්‍රේල් අතිකාල දීමනා | 13441.54 |
| 78 | එච්.ඩබ්.ඩී නීල් ප්‍රසන්න | 75 | ක.සේ.නි 2022 අප්‍රේල් අතිකාල | 3004.68 |
| 79 | ජයන්තද සිල්වා | 76 | ආදාහනාගාර ක්‍රියාකරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 8679.10 |
| 80 | ඩී.එස් ගුණරත්න | 77 | කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 6066.27 |
| 81 | නීරංග පුෂ්පකුමාර | 78 | ආදාහනාගාර ක්‍රියාකරු සහයක 2022 අප්‍රේල් අතිකාල දීමනා | 5595.95 |
| 82 | ඩී.ඒ.කේ.සේනානායක | 79 | සෞඛ්‍ය කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 3057.20 |
| 83 | එම්.ජී ප්‍රදීප් කුමාර | 80 | සෞඛ්‍ය කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 5533.69 |
| 84 | එම්.ජී ප්‍රදීප් කුමාර | 81 | සෞඛ්‍ය කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7508.27 |
| 85 | බී.එස් සුනේන්ද්‍ර | 82 | කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7097.06 |
| 86 | එම්.ඩී.එන් ශාන්ත | 83 | සෞඛ්‍ය කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 7380.72 |
| 87 | එස්.කේ.අතුකෝරාල | 84 | සෞඛ්‍ය කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 4490.50 |
| 88 | එම්.කේ.එන් ලංකා | 85 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා (කොම්පෝස්ට් අංගනය) | 4453.41 |
| 89 | එම්.කේ.එන් ලංකා | 86 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා (කොම්පෝස්ට් අංගනය) | 6258.85 |
| 90 | එම්.කේ.එන් ලංකා | 87 | වැඩ කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (කොම්පෝස්ට් අංගනය) | 5777.40 |
| 91 | කේ.වී අරුණ ශාන්ත | 88 | මුරකරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (කොම්පෝස්ට් අංගනය මුර) | 8088.36 |
| 92 | ඩී.එච් සිරිල් ජයන්ත | 89 | දෛනික කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (සෞඛ්‍ය අංශය) | 4960.85 |
| 93 | ටී.ඩී අජිත් | 90 | දෛනික කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා (සෞඛ්‍ය අංශය) | 5383.05 |
| 94 | නන්දසේන ලියනගේ | 91 | මහජන සම්බන්ධතා නිලධාරී දීමනා 2022 අප්‍රේල් | 14000.00 |
| 95 | ඩබ්.ඒ සුනිල් ප්‍රසන්න | 92 | ආදායම් පරීක්ෂක නිවාඩු දින වැටුප් 2022 අප්‍රේල් | 5665.00 |
| 96 | ආර්.පී වරුණ ඉෂාන්ත | 93 | සෞඛ්‍ය පරිපාලක 2022 අප්‍රේල් පරිවතරීත ගමන් වියදම් | 1500.00 |
| 97 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 94 | කේෂ්ත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 6355.14 |
| 98 | ආර්.පී වරුණ ඉෂාන්ත | 95 | සෞඛ්‍ය පරිපාලක 2022 අප්‍රේල් නිවාඩු දින වැටුප් | 4923.33 |
| 99 | ගයාන් මධුසංක | 96 | රාජකාරි ගමන් වියදම් | 1400.00 |
| 100 | එම්.කේ.සමන් ජානක | 97 | රියදුරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 10661.53 |
| 101 | ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් | 98 | 2022 අප්‍රේල් නිවාඩු දින වැටුප් | 10677.50 |

| | | | | |
|---|---|---|---|---|
| | **2022.05.18** | | | |
| 102 | චමින්ද ටයර් හවුස් | 99 | සභාවට අයත් වාහන වල පැච් දැමීම | 4050.00 |
| 103 | මොහොමඩ් හම්දූන් මොහොමඩ් නිෆ්ලාස් | 100 | 2021 මස්කඩ ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීම | 50000.00 |
| 104 | එම්.ජී.එන් මුත්තාස් | 101 | 2022 මස්කඩ සඳහා ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීම | 50000.00 |
| 105 | මොහොමඩ් හම්දූන් මොහොමඩ් නිෆ්ලාස් | 102 | 2022 මස්කඩ සඳහා ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීම | 50000.00 |
| 106 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 103 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය කිරීම | 24696.40 |
| 107 | එල්.එල්.එම්.මුණසිංහ | 104 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022/03/01 - 2022/03/31 දක්වා | 2500.00 |
| 108 | කේ.ඩී මිත්‍රානන්ද | 105 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022/01/01 - 2022/02/28 දක්වා | 5000.00 |
| | **2022.05.20** | | | |
| 109 | එස්.ඒ.එම්.ඒ කරුණාරත්න | 106 | ශ්‍රවණාගාර භූමිය අළුත්වැඩියාව සඳහා ගල්රෝල කුලියට ගැනීම (දිනකට 15000/- බැගින් දින 1 1/2 | 22500.00 |
| | **2022.05.23** | | | |
| 110 | මෙරිල් මුණසිංහ ඇතුළු 33 දෙනෙකු සඳහා | 110 | 2022 මැයි මස සභික දීමනා | 510000.00 |
| 111 | මෙරිල් මුණසිංහ ඇතුළු 30 දෙනෙකු සඳහා | 110 A | 2022 අප්‍රේල් මස සභික ගමන් වියදම් | 75000.00 |
| | **2022.05.25** | | | |
| 112 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 111 | ඉන්ධන ලබා ගැනීම (ඇමුණුම 01) | 208808.00 |
| 113 | සී/ස මතුගම වි.සේ.ස සමිතිය ඉන්ධන පිරවුම්හල | 112 | ඉන්ධන ලබා ගැනීම (ඇමුණුම 02) | 104454.21 |
| | **2022.05.26** | | | |
| 114 | ගෑස්ටෙක් එනජරී ලංකා පුද්ගලික සමාගම | 113 | ආදාහනාගාරය සඳහා 37 1/2 ලිට්රෝ ගෑස් සිලින්ඩර් 05 ක් මිලදී ගැනීම (18293 x5) | 91465.00 |
| | **2022.05.30** | | | |
| 115 | ගෑස්ටෙක් එනජරී ලංකා පුද්ගලික සමාගම | 114 | ආදාහනාගාරය සඳහා 37 1/2 ලිට්රෝ ගෑස් සිලින්ඩර් 05 ක් මිලදී ගැනීම (18293 x5) | 91465.00 |
| | **2022.05.31** | | | |
| 116 | සභාපති ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය | 115 | වාෂර්ක ප්‍රකාශන සඳහා මුදල් ගෙවීම | 3900.00 |

| | | | | |
|---|---|---|---|---|
| 117 | අගලවත්ත මෝටසර් | 116 | RF 1964 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරිම | 1890.00 |
| 118 | ආර්.ඒ.ඩී.කුමාර | 117 | ඖෂධ ප්‍රවාහනය කිරිම වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු ගෙවීම | 12000.00 |
| 119 | කේ.ඥාණසුන්දර | 118 | ශ්‍රවණාගාර ඇප තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| 120 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගිතා සමිතිය | 119 | ජල බිල්පත් ගෙවීම කොම්පෝස්ට් අංගනයට ජලය සැපයීම (2022/01/30 සිට 2022/03/30 ) | 17150.00 |
| 121 | එස්.ඩී ධනුෂ්ක සම්පත් | 120 | නවක සංවර්ධන නිලධාරීන් සඳහා ඉඩ ලබාදීමට ගිණුම් අංශය සකස් කිරීම | 6000.00 |
| 122 | මොබිටෙල් පුද්ගලික සමාගම | 121 | ESMS සේවා ගාස්තු | 122.60 |
| 123 | කේ.වී.එන් ද සිල්වා | 122 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022/02/05 - 2022/03/24 දක්වා | 1734.79 |
| 124 | රෙජිස්ට්‍රාර් මහාධිකරණය කළුතර | 123 | ශ්‍රවණාගාරය වෙන් කිරීම ඇප තැන්පත් ගෙවීම | 3000.00 |
| 125 | කළුතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 124 | ශ්‍රවණාගාරය වෙන් කිරීම ඇප තැන්පත් ගෙවීම | 3000.00 |
| 126 | ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් | 125 | ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් පියවීම | 51579.00 |
| 127 | ජී.එම් දිසානායක | 126 | රාජකාරී ගමන් වියදම් | 2400.00 |
| 128 | යූ.එස්. මුණසිංහ | 127 | රාජකාරී ගමන් වියදම් | 2100.00 |
| 129 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 128 | එච්.ජී.එන් තනූජා ඇතුළු 05 ක් සඳහා රාජකාරී දීමනා | 650.00 |
| 130 | මිහිඳු වන්න කුමාර | 129 | ක්ෂේත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 6022.13 |
| 131 | එන්.ඩී අජිත් | 130 | ක්ෂේත්‍ර කම්කරු 2022 අප්‍රේල් අතිකාල දීමනා | 727.74 |
| 132 | ඒ.කේ.ලාල් ඇපා | 131 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 2168.35 |
| 133 | මුදල් භාරකරු මතුගම ප්‍රාදේශිය සභාව | 132 | මෙරිල් මුණසිංහ ඇතුළු 08 ක් සඳහා 2022 අප්‍රේල් සැලසුම් කමිටු දීමනා | 12000.00 |
| 134 | ඩබ්.ඩී.සුනිල් ශාන්ත | 133 | 2022 අප්‍රේල් වැඩ බැලීමේ දීමනා | 4523.33 |
| 135 | ඩබ්.ඒ සුනිල් ප්‍රසන්න | 134 | 2022 අප්‍රේල් පරිවතරීත ගමන් වියදම් | 1500.00 |
| 136 | කා.හා.නි හොරවල | 135 | සංග්‍රහ වියදම් ප්‍රතිපූණර්ය | 1000.00 |
| 137 | කා.හා.නි හොරවල | 136 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය කිරීම | 2321.10 |
| 138 | අරුණ බුද්ධික ජිනදාස | 137 | ආදායම් බලපත්‍ර ලබා ගැනිමේ අත්තිකාරම් | 7980.00 |
| 139 | ආර්.එච්.ආර් පෙරේරා | 138 | රාජකාරී ගමන් වියදම් | 1000.00 |
| 140 | යූ.කේ.ඩී සුමිත් | 139 | රාජකාරී ගමන් වියදම් | 800.00 |
| 141 | කා.හා.නි වැලිපැන්න | 140 | සංග්‍රහ වියදම් ප්‍රතිපූණර්ය | 1000.00 |
| 142 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 141 | ජල බිල්පත් ගෙවීම | 3986.82 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | සේවක ණය | | | |
| | **2022.05.04** | | | |
| 01 | නියෝමි ගීතානි | 44 | ආපදා ණය | 245327.00 |
| 02. | බී.එස් සුනේන්ද්‍ර | 45 | ආපදා ණය | 109254.00 |

**6.1.2 2022 සාහිත්‍ය මාසය තේමා කර ගනිමින් මතුගම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කිරීමට යෝජිත සාහිත්‍ය මාසයේ වැඩ සටහන් සඳහා සහා අරමුදලින් වියදම් දැරීමට ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු බැවින්, එම වියදම් ඇස්තමේන්තු මුදල වන රු.138500 ක මුදල ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.**

**6.1.3 ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 07 කඩකාමරය වත්මන් බදුකරු වන ජී.අයි.ඩී නෙල්සන් විජේසිංහ මහතා විසින් ජානක ප්‍රදීප් අමරසිංහ මහතාට ලේඛණගත අයිතිය සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක වාතර්ාව හා අංක LGD/13/2016 (1) දරණ 2020.12.03 දිනැති දෙපාතර්මේන්තු චක්‍රලේඛ පරිදි ගල්මත්ත නයනසිරි ජයසිංහ වෙළඳ සංකීර්ණයෙහි අංක 07 කඩකාමරයෙහි ලේඛණගත අයිතිය ජානක ප්‍රදීප් අමරසිංහ මහතාගේ නමට සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය මහ සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.**

**6.1.4 මතුගම ප්‍රාදේශීය සභාව නගර සභාවක් බවට පත් කිරීමට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මේ ඉන්න මන්ත්‍රී සංයුතිය තුල තමයි මේ කටයුතු කරන්නේ.නැත්නම් ඒක අසාධාරණයි.බෙදා ගන්න කොටස් දෙකේ ඒ සංයුතියම තියා ගන්න පුළුවන්. නගරයේ තෝරා ගන්නා කොට්ඨාශ ටික නගර සභාවේ.ඡන්දයක් තියෙන කාලයක මේක කරගත යුතු මූලික දෙයක්.ඒකයි යෝජනාවක් විදියට ගෙනාවේ.**

**6.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරව්ට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**6.2.1 ග්‍රාම සේවා වසම් මට්ටමෙන් වගා කිරීමට හැකි, මෙතෙක් වගා නොකළ බිම් හඳුනා ගෙන වගා කිරීමට කැමති අය සඳහා එම ඉඩම් ලබාදීමට කඩිනම් වැඩ පිළිවෙලක්**

ලබාදීමට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**6.2.2** වරිපනම් ගෙවීමට බලාපොරොත්තුවෙන් සිටින ප්‍රදේශ වල අය සඳහා අවශ්‍ය පියවර කඩිනම් කිරීමට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**6.2.3** වැලිපැන්න උප කායර්ාලයේ සිටින මාගර් කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින්, අවම වශයෙන් කම්කරුන් 10 දෙනෙකු හෝ අනුයුක්ත කරන ලෙසට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**6.2.4** අළුත්ගම - මතුගම ප්‍රධාන මාගර්යේ වැලිපැන්න ආරියවංශගමට හැරෙන අතුරුමාගර්ය ඉදිරිපිට ප්‍රධාන මාගර්යට පදික මාරුවක් ලබාදෙන ලෙසට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමියන් විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.

මගේ පලවෙනි යෝජනාව මීට පෙරත් මේ ගැන කථා කරා.රජය විසින් තීන්දුවක් අරගෙන තිබුනා රජයට අයත් ඉඩම් හඳුනාගෙන වගා කටයුතු සඳහා කඩිනම් පිලිවෙලක් සකස් කරන්න කියලා.ඒ සඳහා අපේ ග්‍රාම සේවා වසම් 57 තුල වැඩපිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.පවතින ආර්ථික අබර්ුදය තුල මන්ත්‍රීවරු,රජයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන මේ වැඩ කටයුතු ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපි සභාවේ දැනුම් දුන්නා සභාවට අයිති පොදු ඉඩම් ටික අදාල මන්ත්‍රීතුමන්ලා ඉන්න කොට්ඨාශවල සමිතියක් මාගර්යෙන් සම්බන්ධ කරගෙන කෙටි කාලීනව, වෂර්යකට වගේ බද්දට වගා කටයුතු සඳහා ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඔබතුමන්ලාට අවස්ථාව දෙනවා ගමේ සමිති සහ වගා කරන පිරිස් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කරන්න.සභා භූමියේ ස්ථාන කීපයක් අපි වෙන් කරලා දිලා තියෙනවා සේවකයින්ට සහ නිලධාරීන්ට වගා කටයුතු කරන්න.කුරුදිප්පිට ඉඩමේ වගා කටයුතු ආරම්භ කලා.ගල්මත්ත උප කායර්ාලයේ වගා කටයුතු කරගෙන යනවා.ඒ වගේම යටදොල උප කායර්ාලයේ වගා කටයුතු පටන් අරන් තියෙනවා.දැනට පලාත් සභාවෙන් අපිව දැනුවත් කරලා තියෙනවා මේ වගාවන් සඳහා බීජ ලබා දෙනවා කියලා.අපි මන්ත්‍රීවරුන්ට දැනුම් දීලා ඇති මේ සඳහා වසමකින් 10 දෙනෙක් සම්බන්ධ කරන්න කියලා.අපි ඒක සංශෝධනය කරනවා වසමේ ඉන්න සියලු දෙනාට දෙන්න පුළුවන් ආකාරයට යෝජනාව දෙන්න.අපි වැඩි ප්‍රමාණයක් දෙන්න බලන්නම්.අනෙක් උපකරණ ගන්න අපේ තියෙන වැය ශීෂර් වලින් සංශෝධනය කරපු ඒවාට යටත් කරලා ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ගරු සභාපතිතුමා,මතුගම කෘෂිකමර් පයෙර්ෂණ ආයතනයෙන් පැල මිලදී ගැනීමක් සිදු කරලා තියෙනවා.ඒවා සභා අරමුදලින්ද අරගෙන තියෙන්නේ?කොපමණ ප්‍රමාණයක්ද කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
පැල බඳුන් 100ක් අරගෙන කායර්ාලයේ වගා කටයුතු වලට දීලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා
පොදු ඉඩම් කිච්චම සොහොන් භූමි වල විශාල වශයෙන් ඉඩ තියෙනවා.ඒවායෙත් පුළුවන් නේද?පල්ලේගොඩ,කොටගෙදර විශාල වශයෙන් භූමි ප්‍රමාණ තියෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ගමේ අයව සම්බන්ධ කරගෙන ඒ කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
මන්ත්‍රීවරු 34 දෙනාටම දෙනවද?
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඔව්.සියලු දෙනාට දෙනවා.කසුන් මන්ත්‍රීතුමා ඉල්ලපු විස්තර ටික ලබා දෙන්නම්.අපි පොලිතීන්,පෙහොර පස් ගෙනත් මෙහෙ පැල බඳුන් කරනවා. ඒවා නොමිලේ දෙන්න තමයි තියෙන්නේ.අපි ලොකු වියදම් කරලා නෑ.ඔය කියපු වියදම් විතරයි කරලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

යෝජනාව ගැන අදහස් ප්‍රකාශ කිරීමේදී තව දෙයක් කියන්න අවශ්‍යයි.කුරුදිප්පිට සොහොන් භූමියේ අපි වගා කරන්න කටයුතු ආරම්භ කරා.ඒකත් තියෙන ගැටළු එක්ක ඉවර කර ගන්න බැරි වුණා.ඒ අපි පටන් ගත් දේ සභාවට අගෞරවයක් නොවෙන්න කොටසක් හෝ ඉවර කරන්න ඕනා.ඊට අමතරව විශාල වශයෙන් වගා නොකරන භූමි ප්‍රමාණයන් තියෙනවා.ඒ සඳහා රජයෙනුත් තීන්දුවක් අරගෙන තියෙනවා ඒ ඉඩම් වගා කරන අයට ලබා දෙන්න කියලා.අපේ ප්‍රදේශවල විශාල වශයෙන් කුඹුරු ඉඩම් තියෙනවා.ඒ නිසා නිලධාරීන් සම්බන්ධ කරගෙන සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම් කායර්ාලය සම්බන්ධ කරගෙන මේ සඳහා කඩිනම් වැඩපිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.
ඊළඟට මගේ වරිපනම් සම්බන්ධ යෝජනාව ගැන කථා කරන කොට මම සභාවට ඇවිත් පලවෙනි අවුරුද්දෙත් මේ යෝජනාව ඉදිරිපත් කරා.මගේ ගම් ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් තුනේම ජනතාව කැමතියි වරිපනම් කලාපයක් බවට පත් කරනවට.මට දැන ගන්න ලැබුණා යටදොල ප්‍රදේශයේ ඒ සඳහා යම් වැඩපිලිවෙලක් සකස් වුණා කියලා.අපේ ප්‍රදේශය අධර් නාගරික ප්‍රදේශයක්.වරිපනම් ගෙවීම කඩිනමින් කරන්න අවශ්‍යයි.මේ

වෙනකොට 5 කණුවට පමණයි කසල එකතු කිරීම සිදු කරන්නෙත්.මේ තුල මිනිස්සුන්ගේ අවශ්‍යතා ඉටු වෙනවා වගේම සභාවට ආදායමකුත් ලැබෙනවා.ඒ නිසා මේ සඳහා කඩිනමින් ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ වරිපනම් කලාප පුළුල් කරන යෝජනාව අපි සභාව විසින් සාකච්ඡා කරලා වැලිපැන්න කොට්ඨාශයේ මීගම ප්‍රදේශයේ තියෙන කමර්ාන්තපුරය විශේෂයෙන් අවධානයට ලක් කරලා සිතියම් ගත කරලා නිලධාරීන් මේකට වැඩපිලිවෙලක් අරගෙන ගියා.යටදොල කලාපයෙත් එහෙම කරා.මතුගම නගර සීමාවේ ගැටළුවක් නෑ.සියලු ප්‍රදේශ තියෙනවා වරිපනම් කලාපයේ.මේක සමස්ථයක් ලෙස කරාම අඩුම ආදායම්ලාභීන්ටත් මේකේ ප්‍රශ්නයක් වෙනවා.ඒ වගේම සෑහෙන කාලයක් යනවා.අපි තක්සේරු දෙපාතර්මේන්තුවත් එක්ක මේ ගැන කථා කරා.මේ වෙනකොට අළුතින්ම ගැසට් කිරීමක් කරලා තියෙන්නේ බණ්ඩාරගම ප්‍රදේශයේ තමයි බල ප්‍රදේශය පුළුල් කරලා. ඒ අයව ආදශර්යට අරගෙන තොරතුරුත් අරන් තියෙනවා. ඊලඟට අපි මේ දේවල් හොයන්න ඕනා.දැනට වරිපනම් කලාපය විදියට ගැසට් කරලා තියෙන පරණ ගැසට් පත්‍රය පදනම් කරගන්න ඕනා.සභා යෝජනාව සම්මත වෙලා තියෙනවා ගැටළුවක් නෑ.නමුත් හඳුනාගන්න නිශ්චිත කොටස් වලට නැවත සභා යෝජනාවක් දාන්න ඕනා.බල ප්‍රදේශයේ සිතියම මිනින්දෝරු දෙපාතර්මේන්තුවෙන් ගන්න පුළුවන්.ග්‍රාම සේවා වසම් සියල්ලටම යන්නේ නැතුව තෝරා ගත් අත්‍යවශ්‍යම නිවාස ව්‍යාපෘති,කමර්ාන්තපුරය,ඒවා හඳුනා ගන්න ඕනා.ඒ විදියට ඒකක විදියට යන්න ඕනේ.නැත්නම් පුළුල් විදියට බල ප්‍රදේශයක් විදියට යෝජනා කරොත් සෑහෙන කාලයක් යනවා.ඒ වගේම සමීක්ෂණ අයදුම්පත පුරවන්න ඕනා.සාධාරණීකරණ වාතර්ාවක් සකස් කරන්න ඕනා වරිපනම් අය කිරීම සාධාරණයි කියලා කියන්න.වරිපනම් ගාස්තුවත් ලොකු මුදලක් වෙනවා.පොදු තීරණයකට ගියොත් පොඩි ගෙවල් වලටත් මේක ගෙවන්න වෙනවා.කරමාන්තපුරය,අධිවේගී ප්‍රදේශය ඉලක්ක කරලා කරන්න ඕනේ.ඒක නිසා මේ කටයුතු දැන් කෙරීගෙන යනවා.ඔබතුමාලට සහභාගී වෙන්න අදාල කමිටු රැස් කරලා දැනුම් දෙන්නම්.

මගේ 6.2.3 යෝජනාව ගැන කථා කරන කොට ගරු සභාපතිතුමා වැලිපැන්න උප කායර්ාලයේ මාගර් කම්කරුවන් 07දෙනයි ඉන්නේ.ග්‍රාම සේවා වසම් 27කට ඉන්නේ මේ සේවකයන් හත්දෙනා විතරයි.කිසිසේත් ප්‍රමාණවත් නෑ.මම හිතන්නේ හොරවල උප කායර්ාලයටත් ඒ ගැටළුව තියෙනවා.ඒක නිසා මේ සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන්න කියලා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපි සභාවෙන් තීරණයක් ගමු ක්ෂේත්‍ර කම්කරුවන් සියලු දෙනා මේ සඳහා යොදවන්න.පසුගිය කාලේ නිකුත් කරපු චක්‍රලේඛණ නිසා අපිට විශ්‍රාම ගිය අයට සේවකයින් බඳවාගන්න බැරි වුණා.ඒ වගේම ඉන්න අයව ස්ථිර කරේ නෑ 2014න් පස්සේ.
ඒක නිසා මේ තනතුරු වල ඉන්න අය කායර්ාලගත හෝ වෙනත් සේවයන්ට අනුයුක්ත කරලා ඉන්නවා.මේ ගැටළුව නිසා අපිට උප කායර්ාල වලට අවශ්‍ය සේවකයෝ ටික

ගන්න බැරි වුණා.අපි තීරණයක් ගමු සෑම ක්ෂේත්‍ර කම්කරුවෙක්ම මේ කටයුත්තට සම්බන්ධ කර ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා ඩෙංගු එකට බඳවා ගත්ත සේවකයන්ගේ මේ වෙනකොට රාජකාරිය මොකක්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මතුගම 3යි,ගල්මත්තේ 4 දෙනයි ඉන්නවා.ඉවත් වුණ අය ඉන්නවා පස් දෙනෙක්.දොලොස් දෙනයි අපිට ලැබුණේ.දැනට ඒ අය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු එක්ක ඩෙංගු වැඩසටහන් වලට යනවා.ගල්මත්ත උප කායර්ාලයේ වැඩ වලට යනවා.ඊට අමතරව මතුගම අය විෂබීජහරණ කටයුතු වලට යනවා.අපි ඒ කටයුතු වල විස්තර සභාවට දානවා. තවත් විධිමත් කරන්න ඕනේනම් රාජ්‍ය ආයතන අපෙන් ඉල්ලීමක් කරනවා ඩෙංගු සේවකයන් දෙන්න කියලා.අපි ඒ ගැන උත්සාහ නොකරේ ඒ අයට ගෙවන්නේ රු.950 නිසා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා
මගේ පුද්ගලික මතය මම කියන්නේ මේ සේවකයන්ට අමතරව රැකියා ලක්ෂයේ ලැබුණු සේවකයින් මේ සඳහා යොදා ගන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඇත්තටම දැනට ඒ අය අසරණ වෙලා ඉන්නේ.සමහර පවුල් වල සමෘද්ධිය පවා නැති කරා.දැනට ගෙවන්නේ රු.22500 යි.එක එක තැන්වලට දානවා.දැනට ඒ අය අපේ සභාවේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා
ඒ අය ඒ මුදලට දුර සේවයකට අනුයුක්ත කරාම ඒ ලැබෙන මුදලින් වැඩක් නෑ.ඒක නිසා මතුගම අයව සභාවට අනුයුක්ත කර ගන්න.ඩෙංගු අයට අපි සභාවෙන්නේ වැටුප් ගෙවන්නේ.ඒ අයව වෙන අයට දෙන්න එපා අපේ වැඩ කටයුතු තියෙනවානේ කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒ අයව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කායර්ාලයට දෙන්න අපි බැඳී සිටිනවා ඩෙංගු වැඩ සටහන් සඳහා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

දැනටත් ප්‍රාදේශීය ලේකම් එකේ ඉන්නවා කොහේටවත් අනුයුක්ත නොකරපු අය. මම කියන්නේ පාරවල් ශුද්ධ කරන එක,ලයිට් එකක් දාන එක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගෙන් විය යුතු අවම දේ.ඒ කටයුත්ත සක්‍රීයව සිදු නොවුණායින් පස්සේ ඒකත් බලපාන්නේ මේ සභාවටමයි.

මගේ අනිත් යෝජනාව 6.2.4 ගැන කථා කරන කොට මාගර් සංවධර්න අධිකාරියෙන් ඒකට අවසර ගන්න තියෙන්නේ.එම ස්ථානයේ තෙල් පිරවුම් හල ඉදි වීමත් සමඟම මාගර් අනතුරු වෙනවා වැඩියි.ඒ නිසා මේ ස්ථානයට පදික මාරුවක් ලබා ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා

අපේ කරවිට මන්ත්‍රීතුමාගේ 6.2.2 යෝජනාව ගැන කථා කරන කොට වරිපනම් ගන්න ඕනේ.නමුත් මිනිස්සු ඉතාමත් අසරණ වෙලා ඉන්න මේ වෙලාවේ මම හිතනවා මේ යෝජනාව කාලෝචිත නෑ කියලා.අනිත් කාරණය තමයි වරිපනම් කලාපයක් වීමට නම් ඒ මාගර් සංවධර්නය වෙන්න ඕනේ.ආලෝක පද්ධතිය සක්‍රීය වෙන්න ඕනේ.මිනිස්සුන්ට අවශ්‍ය පහසුකම් ටික ලැබෙන්න ඕනේ.එහෙම නැතිව වරිපනම් විතරක් ගන්න එක සුභදායකයි කියලා මම හිතන්නේ නෑ.බොන්දුපිටිය ප්‍රියංකා මන්ත්‍රීතුමියගේ ප්‍රදේශයේ හිස් ඉඩම් ඕන තරම් තියෙනවා.ඒවා මිනිස්සුන්ට තමන්ගේ භූමියේම වලදාගන්න පුළුවන්.ඒ වගේම ගරු මන්ත්‍රීතුමා සභාවක් ගෙනියන්න බෑ වරිපනම් නැතුව. හොඳ යෝජනාවක්.නමුත් මේ වෙලාවේ මිනිස්සුන්ට කරදර කිරීම කාලෝචිත නෑ කියලායි මගේ අදහස.
ඒ වගේම 6.2.3 යෝජනාව ගැන කථා කරන කොට කම්කරුවා කියන්නේ කායර්ාලයේ පුටුවල වාඩිවෙලා ඉන්න අය නෙවෙයි.දහඩිය මහන්සියෙන් වැඩ කරන පිරිසක්.ඒ නිසා මම දැක්කා මේ අයට බූට් දෙකක් නෑ.ග්ලවුස් දෙක නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒවා දීලා තියෙන්නේ.ඒවා දාන අවස්ථා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා

දාන්නේ නෑ.මේකේ දාහත්දහස් ගානක් ඒ සඳහා වැය කරලා තියෙනවා. මේ අය ඒවා භාවිතා නොකරට අනතුරක් වුනොත් ඒකේ නරක නාමය එන්නේ සභාවට.අපි ආපු දවසේ ඉඳලා දැකලා තියෙන්නේ මේ කම්කරුවන් හත්දෙනා විතරයි.කම්කරුවන් කොයි තරම් බඳවා ගෙන තියෙනවාද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒක තමයි මම කිව්වේ මේ තනතුරු වල ඉන්න අය කායර්ාලගත හෝ වෙනත් සේවයන්ට අනුයුක්ත කරලා ඉන්නවා කියලා.ඒකට සභාවෙන් තීරණයක් ගන්න ඕනා කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා

ඒ තීරණය අදම ගන්න.අපිට තව ටික කාලයයි තියෙන්නේ.ගරු මන්ත්‍රීතුමා,ඔබතුමා දාපු යෝජනා ටික කාලෝචිතයි.නමුත් මෙවැනි දේවල් ක්‍රියාත්මක කරන්න කියලා අපි කොයි තරම් කිව්වද?ඒ කිසි දෙයක් ක්‍රියාත්මක් වුණේ නෑ.ඒ සම්බන්ධව අපේ කණගාටුව මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒකට අද තීරණය ගත්තා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මිය

ගරු සංජය කරවිට මැතිතුමාගේ 6.2.2 යෝජනාව යටතේ වරිපනම් කලාප සිතියම්ගත කරලා අපිට ලබා දුන්නා.සමන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ වෙන්දේසි ඉඩම් සම්බන්ධයෙන් අපිට ප්‍රශ්නයක් තියෙනවා.මිනිස්සුන්ගේ ආදායම් තත්වය පිළිබඳ

ප්‍රශ්නයකුත් තියෙනවා.නමුත් මෙතුමාගේ යෝජනාව අපේ කාලසීමාව තුල ඉටු වෙනවානම් ඒක ලොකු දෙයක්.ඒ වගේම 6.2.3 යෝජනාව ගැන කථා කරනවනම් වැලිපැන්න උප කායර්ාලයේ ගොඩක් අවංක සේවකයෝ ඉන්නේ.එතුමන්ලාව සෑම කායර්කටම වගේ යෙදවීම කරනවා.ඒ නිසා තව සේවකයින් අනුයුක්ත කිරීමක් කරනවානම් අපිට තව දේවල් කර ගන්න පුළුවන්.ඒ වගේම කම්කරුවන්ගේ ස්ථිරභාවය සම්බන්ධව ගැටළුවක් තියෙනවා.මම ඒ සම්බන්ධව කළුතර කායර් සාධන බලකායටත් කථා කරා.එහෙම නම් ලැයිස්තුවක් ඇවිත් නෑ කියලා කිව්වා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒකට නෙවෙයි මන්ත්‍රීතුමිය යන්නේ.පලාත් සභාවේ ප්‍රධාන ලේකම් එකට.බහුකායර් අය හතර දෙනයි අපිට ලැබුණේ.ඒ අයව දැන් වෙන තැන්වලට දාලා තියෙනවා.පිරිවෙන්වලට තමයි දැන් දාලා තියෙන්නේ.එතන මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා.සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතනවල අය කැමති නෑ රැකියා ලක්ෂයේ අයව ඒකට දානවට.නමුත් ඒ අයව ගන්න කටුබැද්දේ විශ්ව විද්‍යාලය,නගර සභා වලින් කැමතියි.ඒ අයට සේවකයන් අවශ්‍යයි.අපි විරුද්ධ නෑ.අපේ රියදුරු පුරප්පාඩු තියෙන ටික අපි දැනුම් දුන්නේ නෑ.අපෙත් අය ඉන්නවානේ 2014 ඉඳන්.අපි හැම රැස්වීමේදිම දැනුම් දුන්නා මේ අයව ස්ථිර කරන්න කියලා.ඒක කෙරුණෙත් නෑ.අපිට ඒ වෙනුවට විකල්පව ගන්න දෙන්නෙත් නෑ.ඇත්තටම ඒ අයට ලොකු අසාධාරණයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මේ සභාවේ සභාපතිතුමා සේවකයන්ට වඩා ප්‍රශ්නේ තියෙන්නේ මැෂින් එකක් කැඩුනම හදන්නේ නෑ.හදන්නේ ගල්මත්තේ මැෂින් විතරයි.හේතුව තමයි සභාපතිතුමාගේ කොට්ඨාශයේ වැඩ ටික කරන්න.සභාපතිතුමාගේ කොට්ඨාශයේ ලයිට් ටික හැදෙනවා.තණකොළ කැපෙනවා.ජේ.සී.බී එකෙන් වැඩ ටික වෙනවා.සභාපතිතුමාට අනෙක් වසම් පිළිබඳ වගකීමක් නෑ.තාම යටදොල උප කායර්ාලයේ මැෂින් හදලා නෑ.දැන් මාස 2ක ඉඳන් කියනවා මේවා හදලා දෙන්න කියලා.ගල්මත්තේ මැෂින් නැත්නම් මෙහෙ ඒවායින් හරි ඒ පැත්තේ වැඩ කෙරෙනවානේ සභාපතිතුමා.අපේ වසම් වලට ගිහින් ඔබතුමා බලන්නකෝ.සභාවට කථා කරලා ඇහුවම කියනවා මැෂින් නෑ කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මේ කාලයේ තෙල් ප්‍රශ්නය තියෙනවා.නමුත් ඊට කලින් මැෂින් හැදුවා.මේ සභාවේ ලොකු බිල් ගෙවන්න ආවම ඒවා අපි කථා කරා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ඒවා කථා කරන්නේ මැෂින් එකක් හදන්න ගියාම මැෂින් එකක් ගන්න වියදම යනවා.මේ සියලු දේවල්වලට හේතුව වෙලා තියෙන්නේ ක්‍රමවේදයක් නැතිකම.ජේ.සී.බී එක කැඩිලා මාස ගානක් වෙනවා.ඇහුවම කියන්නේ සභාපතිතුමා හදන්න එපා කිව්වා කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

හදන්න එපා කියලා කිව්වේ වියදම වැඩි නිසා.ලක්ෂ නවයයි ගානක් වියදම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ඒ ලක්ෂ නවයයි ගානේ වියදම සම්බන්ධව කමිටුවක් දැම්මානේ.මම ඒ වෙලාවේ ඊට අඩුවෙන් හදන්න පුළුවන් කියලා සභාපතිතුමාවයි,ලේකම්තුමියවයි දැනුවත් කරා.අයට මාසයක් වෙනවා. ඔබතුමන්ලා මේකට ක්‍රමවේදයක් හදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
මෙතන සේවකයන්ගෙන් ඇහුවම කියන්නේ සභාපතිතුම හදන්න එපා කිව්වා කියලා.
රියදුරන්ව මෙතෙන්ට ගෙනත් අපහසුතාවයට පත් කරන්න එපා.කීයක් ගියත් ඔය ජේ.සී.බී එක හදන්නේ නැතුව ඉන්නද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම නොකියපු දෙයක් සම්බන්ධව අහන්න මට අයිතියක් තියෙනවා.මේ සභාවෙන්ම තමයි තීරණයක් ගත්තේ සභාවට දාලා මේක කරමු කියලා.මේකේ අවශ්‍ය දේවල් ගන්න යන මුදලට අපි අත්සන් කරලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මෙතන තියෙන ප්‍රශ්නේ ඔබතුමාගේ ප්‍රශ්නයක් ගියර් පෙට්ටිය ගෙන්නපු නැති එක.මාස දෙකක් ගියා තාම බැරි වුණා ඒක ගෙන්නන්න.රියදුරන්ගේ ප්‍රශ්නයක් නෙවෙයි ඒක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාපතිතුමා මම කඩවක ගල් වගයක් තියාදෙන්න කියලා මීට අවුරුද්දකට විතර කලින් ජේ.සී.බී එක ඉල්ලුවා.ඒක කෙරුණේ නෑ.ඔබතුමා එක එක දේවල් කියයි. මිනිස්සු අපිට බනිනවා.අපිට ලැජ්ජයි.එහෙන් ආණ්ඩුව අපිව විනාශ කරනවා.මෙහෙන් සභාවේ සම්පතක් දෙන්නේ නෑ වැඩක් කර ගන්න.ඔබතුමන්ලාගේ වැඩ කර ගන්නවා අපේ වැඩ කර නොදුන්නාට.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි
ඇත්තටම කරවිට මන්ත්‍රීතුමාගේ **6.2.1**යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්.මගේ කොට්ඨාශයෙත් **LRC** ඉඩම් විශාල ප්‍රමාණයක් තියෙනවා.සභාවෙනුත් අක්කර **20**ක් ඉල්ලුවා මේ කොම්පෝස්ට් එකට.මම කියන්නේ මගේ කොට්ඨාශයේ විතරක් නොවෙයි මතුගම කොට්ඨාශයේ පිරිස් හඳුනා ගෙන වගා කිරීම සඳහා සභාපතිතුමා මැදිහත් වෙලා මේ සියලු මන්ත්‍රීවරුන්ගේ ලේඛණයක් අරගෙන **LRC** එකට යොමු කරන්න ඒ සඳහා අවශ්‍ය කරන ඉඩම් ප්‍රමාණ ලබා දෙන්න කියලා. පසුගිය කාලේ කොළඹ ඉන්න අයත් මේවායින් ඉඩම් ගත්තා.ඒක නිසා සභා සතු ඉඩම් වල වගේම **LRC** ඉඩම් වලත් වගා කටයුතු කරන්න ලබා ගන්න ඉල්ලීමක් කරොත් අපිට ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම අදහසක් ඉදිරිපත් කරනවා.
ඒ වගේම **6.2.4** යටතේ කරවිට මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා.මමත් මේ යෝජනාව මීට පෙර සභාවට ඉදිරිපත් කරා.සභා සම්මත වුණා.ඒ යෝජනාව අරගෙන මම මාගර් සංවධර්න අධිකාරියට ගියා.එහිදී මම ඒ නිලධාරිනියත් එක්ක කථා කරාම

එතුමියගේ පුද්ගලික මතය වුණේ මාගර්යේ එලෙස පදික මාරු යෙදීම තුල රියදුරන් අපහසුතාවයට පත්වන බවයි.නිණර්ායක ගණනාවක් ඉදිරිපත් කරා. ඊට පස්සේ මම කරුණු පැහැදිලි කරාම එතුමිය තේරුම් අර ගත්තා.ඒ ගැන සොයලා බලලා අවශ්‍යද කියලා තව දුරටත් සොයලා බලන්නම් කියලා එතුමිය සිහිපත් කරා.කොහාම නමුත් මේ යෝජනාව හරි ක්‍රියාත්මක වෙනවානම් හොඳයි.විශාල පිරිසක් ගැවසෙන ප්‍රදේශයක් නිසා මේ යෝජනාව මාගර් සංවධර්න අධිකාරියට යොමු කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

මේ යෝජනාවට අදහස් දැක්වීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කරනවා.මගේ වරිපනම් සම්බන්ධ යෝජනාව ගැන සමන්ත මන්ත්‍රීතුමා අදහස් දක්වමින් කියා සිටියා මේ වෙලාවේ සුදුසු නෑ කියලා. බොන්දුපිටිය,පහේ කණුව,සහ අපේ ප්‍රදේශවල ගම්වාසීන්ට අමතරව වෙන්දේසි ඉඩම් වල විශාල පිරිසක් ඉන්න නිසා ලොකු ගැටළුවක් තියෙනවා.මේකට කැමති පිරිසක් ඉන්නවා. මේ තුලින් කුණු රැගෙන යාම පමණක් නෙවෙයි වෙන්නේ.ඒ ඉඩම් වලට යම් වටිනාකමක් එකතු වෙනවා.අමතර පහසුකම් ලැබෙනවා.ඒ නිසා අවම වශයෙන් ප්‍රධාන මාගර්යේ ටික හෝ කඩිනම් කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ නිසා මේක තව දුරටත් කල් නොදමා මේ වැඩ පිළිවෙල කඩිනම් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා

මේ යෝජනාවේ ඔබතුමා දාලා තියෙන්නේ ප්‍රදේශවල කියලා.ඔබතුමාගේ ප්‍රදේශවල කියලා තිබුණානම් හරි.අපේ ප්‍රදේශවල මිනිස්සුන්ට තව අවශ්‍යතා තියෙනවා.ඒවා ඉෂ්ඨ වෙලා නෑ.අපේ ප්‍රදේශයට වරිපනම් එපා කියන එක මම කිව්වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

ඔබතුමාගේ ප්‍රදේශයට අවශ්‍ය නැති වෙන්න පුළුවන්.මම මේ කථා කරන්නේ අවශ්‍යතාවය තියෙන අය වෙනුවෙන්.වාෂර්ිකව රුපියල් 1000කට වඩා අඩු මුදලක් අය වෙන්නේ.ඒක නිසා මම සභාවෙන් ඉල්ලන්නේ මේක නවත්තන්න හදන්න එපා.2019 ඉඳන් මම මේ ඉල්ලීම කරන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමා මම දැන් කිව්වානේ වරිපනම් අය කරන නිනර්ායක මොනවද කියලා.ඒකේ තියෙනවා හඳුන ගන්න ප්‍රදේශය නිශ්චිතව හඳුන ගන්නේ කොහොමද කියලා.එතකොට මේ මන්ත්‍රීතුමා කියන දේ අදාල වෙන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

වරිපනම් කලාප යෝජනාව ගැන කථා කරන කොට අපේ ප්‍රදේශයට අතවශ්‍ය දෙයක්.මිනිස්සු ඇත්තටම කැමතියි වරිපනම් ගෙවන්න.බොන්දුපිටිය කොට්ඨාශයේ වෙන්දේසි ඉඩම් 17 කට වඩා තියෙනවා.ඒ මිනිස්සුන්ට කුණු ටික දාගන්න තැනක් නෑ.ඒ නිසා ප්‍රධාන පාරට හෝ එනවානම් ඒ මිනිස්සු කැමතියි වරිපනම් ගෙවන්න.ඒ නිසා ඇත්තටම හොඳ යෝජනාවක්. ඒ සඳහා හැකි ඉක්මනින් ගන්න පුළුවන් ක්‍රියාමාගර්යක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී මිත්‍රානන්ද මහතා

කරව්ට මන්ත්‍රීතුමා ඇත්තටම හොඳ යෝජනාවක් කරලා තියෙන්නේ.මේ යෝජනාව මීට පෙර දෙපාරක් සභාවට ඉදිරිපත් කරා.මීට පෙරත් අපි ඉල්ලීම් කරලා තියෙනවා සතියට දවස් දෙකක් හෝ තුනක් කුණු ගන්න එවන්න කියලා.නමුත් වරිපනම් ගෙවන්නේ නැති කලාපයක් කියලා හඳුනාගෙන ඒ අයට ඒ අවස්ථාව ලැබෙන්නේ නෑ.ඇත්තටම මේ ප්‍රදේශවල තියෙන අවශ්‍යතා ඉෂ්ඨ කරන්න අවශ්‍යයයි.අපේ ප්‍රදේශවල තියෙන වෙන්දේසි ඉඩම් සහ ඒවායේ ඉඩ ප්‍රමාණය එක්ක මිනිස්සුන්ට මේ කසල ප්‍රශ්නය තියෙනවා..ඉතින් ඒ අය ඉල්ලනවා අපිට වරිපනම් ගෙවන්නවත් අවස්ථාව දෙන්න අපිට තියෙන මේ ප්‍රශ්න විසඳගන්න කියලා.ඊළඟට මගේ කොට්ඨාශයේ කමර්ාන්තපුරය තියෙනවා.ඒ අයගෙන් වරිපනම් අය කරන්නේ නෑ.නමුත් ඒක අත්‍යාවශ්‍යයි.ඒ අයට ගෙවීමට හැකියාව තියෙනවා.ඊළඟට සභාපතිතුමා යෝජනාවක් කරා අපේ ප්‍රාදේශීය සභාව නගර සභාවක් කරන්න කියලා.එතකොට ඇත්තටම අපේ කොට්ඨාශය වෙන් වෙනවා.එතකොට ඒවා ප්‍රාදේශීය සභා වෙන්න පුළුවන්.එතකොට ඒ සභාවට වත්කම් තියෙන්න ඕනා.ආදායම් තියෙන්න ඕනා.ආදායම් ලබන්න පුළුවන් පරිසරය නිමර්ාණය වෙලා තියෙන්න ඕනා.ඒ නිසා වරිපනම් ගෙවීම අත්‍යාවශයි කියලා කියනවා වගේම ඒ අයගේ ප්‍රශ්න විසඳීමත් අවශ්‍ය වෙනවා.

ඒ වගේම 6.2.3 යෝජනාව ගැන කථා කරන කොට ඇත්තටම වැඩ කරන්නේ සේවකයන් පස් හය දෙනයි.අපේ ප්‍රදේශයේ නොදියුණු මාගර් තියෙන්නේ.ඒ නිසා ඒ පාරවල් ශුද්ධ කරගන්න කම්කරුවන් අවශ්‍යයි.ඒ නිසා ඒ යෝජනා දෙක සම්බන්ධයෙන් මම මගේ ප්‍රසාදය පල කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා
වරිපනම් කලාප යෝජනාවට අපි කැමතියි.නමුත් අපි යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන කොට ඒකේ දෙපැත්තම බලන්න ඕනා.ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනයේ පාරේ කුණු දාලා තියෙන්නේ.ඒකෙන් ලොකු අපහසුතාවයකට මම පත් වෙනවා.කුණු එකතු කරන්න ඉස්සර වෙලා ඒකට ස්ථානයක් සොයා ගෙන කටයුතු කරනවානම් හොඳයි.මගේ කිසි විරුද්ධත්වයක් නෑ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මගේ වසමේ වෙන්දේසි ඉඩම් පහක් විතර තියෙනවා.ඒවා වරිපනම් කලාපය ඇතුලේ තමයි තියෙන්නේ.නමුත් යටදොලවත්ත ඉන්ධන පිරවුම් හල ඉදිරිපිට තියෙන වෙන්දේසි ඉඩමේ ඇතුලේ එක ලයිට් එකයි තියෙන්නේ. ගෙවල් 25ක් 30ක් පමණ තියෙනවා.කීප වතාවක් මම ඉල්ලුවත් ලැබුණේ නෑ.ඒක නිසා මම කරව්ට මන්ත්‍රීතුමාට කියන්නේ නැති ප්‍රශ්න දාගන්න එපා.අපේ සභාවේ තියෙන වෙන්දේසි ඉඩම් වල පාරවල් වල යන්න බෑ.ජේ.සී.බී එක දාලා තණකොළ ටික කපා ගන්න බෑ.ඒ නිසා මුදල් අය කරන්න ගිහින් ප්‍රශ්න ඇති කරගන්න වැඩක් කර ගන්න යන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

කරවිට මන්ත්‍රීතුමා, නිමාලක මන්ත්‍රීතුමා,මිත්‍රානන්ද මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශයේ තියෙන කසළ ප්‍රශ්නය ඉදිරිපත් කරා.ඔය නිවාස ව්‍යාපෘති තියෙන ප්‍රදේශවල වරිපනම් අය කරනවට වඩා කසළ බද්ධක් අය කරන එක තමයි කරන්න ඕනේ.ඒ අය කැමතියි ගෙවන්න.මේක කරන්න දැනුම් දීලා තියෙන්නේ.ඔබතුමන්ලා අපේ ප්‍රජා සංවධර්න මහත්තයාව සම්බන්ධ කරගෙන කසළ බද්ධ ගෙවන්න කැමති අයව සම්බන්ධ කර ගන්න.ඒ අයව හඳුන ගෙන ඒ කසළ තාවකාලිකව දාන්න පුළුවන් තැනක් ඒ ප්‍රදේශවලින් හොයා ගමු.විශ්මිත උයනේ ඒ වගේ ප්‍රශ්නයක් වෙලා අපි දැන් ඒ කසළ ගේනවා.කරවිට මන්ත්‍රීතුමා ඒක දන්නවා.ඒ නිසා කරපු දේවලුත් කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

කසල ප්‍රශ්නයට මම කෙටි උත්තරයක් දෙන්නම්.මේ කොම්පෝස්ට් අංගනය ඇතුලේ අපිට මේ කසළ කළමණාකරණය කර ගන්න පුළුවන්.අපි ඒක කරලා පෙන්නනන්නම්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මිත්‍රානන්ද මන්ත්‍රීතුමා,ඔබතුමන්ලා හෙට දවසෙම සම්බන්ධ වෙලා මේ ගැන කටයුතු කරන්න.සභාවේ කථා කරා කියලා ඉඳලා හරියන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

සභාපතිතුමා අවම වශයෙන් ප්‍රධාන මාගර්යේ වරිපනම් ගෙවන කටයුතු හරි ඉක්මන් කරලා කරලා දෙන්න.මිනිස්සුන්ට දෙයක් කරන්න ගිහින් ප්‍රශ්න ඇති වුණාට කමක් නෑ.ප්‍රශ්නවලට මුහුන දෙන්න තමයි අපි මෙතෙන්ට ඇවිත් තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

අපි වැඩක් කරනකොට විනිවිදභාවයකින් කරන්න ඕනා.සභාපතිතුමා කරන වැඩ වලින් නරකනාමය එන්නෙත් ඔබතුමාටයි.බොන්දුපිටියේ ලයිට් දාලා තියෙනවා හිතවත් අයගේ ගෙවල් ළඟට තමයි දාලා තියෙන්නේ.ඒ වගේ පහත් වැඩ කරනකොට මේ සභාව අප්‍රසාදයට ලක් වෙනවා.ඒ නිසා අඩු තරමේ කොට්ඨාශයට ඉන්න මන්ත්‍රීවරයා දැනුවත් කරලා මේ දේවල් හරියට කරන්න කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මිය

L.E.D බල්බ් සවි කිරීමේදි අපිට ඕන තැන්වල සවි කරන්න බෑ.ඒවා සිදුරු සහිත ලොකු කණුවල තමයි සවි කරන්නේ.අපි පක්ෂ විපක්ෂ බැලුවේ නෑ.සේවකයන්ගෙන් අහලා බලන්න.මේ සම්බන්ධව මම සභාපතිතුමාවත් දැනුවත් කරා.

**6.2** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

**6.3.1** පසුගිය සභා වාරයේ සාකච්ඡා වූ කරුණු ගැන කථා කිරීමට කාලයක් වෙන්කළ යුතු බවට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.3.2** **ප්‍රදේශයේ ජනතාව පත්වී තිබෙන අපහසුතාවය සඳහා සභාවේ කණගාටුව ප්‍රකාශකළ යුතු බවට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සහා සම්මත විය.**

**6.3.1** **යෝජනාව සම්බන්ධයෙන් මම ඉල්ලා සිටිනවා ලේකම්තුමියගෙන් හා සභාපතිතුමාගෙන් න්‍යාය පත්‍රයට යම් වගන්තියක් ඇතුලත් කරලා ඒ සඳහා කාලය ලබා දෙන්න කියලා.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මෙහෙමයි මන්ත්‍රීතුමා,සභාවේ අද කථා කරපුවා ලබන වාතර්ාවට යනවානේ.ඒ වාතර්ාවේ නැත්නම් කථා කරන්න අවස්ථාව තියෙනවා.නැත්නම් වාතර්ාව පිළිගන්නෙ නැතුව ඉන්න පුළුවන්.අපි සංශෝධන වලට අවස්ථාව දෙනවනේ.ඒ වෙලාවේදී ඒවට අවශ්‍ය ක්‍රියාමාගර් අරගෙන නැත්නම් ඒවා සාකච්ඡා කරන්න පුළුවන්.ලිඛිතව අපි දැනුම් දෙන ඒවට පිටපත් දෙනවනේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

**නෑ.එතකොට අපිට ගත්ත ක්‍රියාමාගර්ය දැන ගන්න පුළුවන්නේ.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**ඒකටත් අපි එකගයි.මම කියන්නේ මේක තමයි ක්‍රමය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

**ගිය සභා වාරයේ මම රක්ෂණය සම්බන්ධව කථා කරා.මේ මන්ත්‍රීතුමිය බෝඩ් සම්බන්ධව කථා කරා.ඒ ගැන අපි ආයි කථා කරන්න යෝජනාවක් දාන්න ඕනා .ඒකට මාස 3ක් ඉන්න වෙනවා.ඒ වෙනකොට කවුරුත් දන්නේ නෑ මේ යෝජනාව මොකක්ද කියලා.ඒ නිසා අපිට කථා කරපු දෙයකට පසු විපරමක් කරන්න ක්‍රමයක් නෑ.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**සුජීව මන්ත්‍රීතුමා අපිට ඉදිරිපත් කරා සමූපකාර රක්ෂණ සමාගම.ඒකේ නිලධාරිනියක් එක්ක අපි කථා කරා.නමුත් අපිට එතන පහසුකම් මදී.ඒක නිසා අපි MBSL ආයතනය එක්ක කතා කරා.අපි ඒ තොරතුරු ගත්තා.රක්ෂණ කාලය ඉවර වුණාම ඒකට යනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

**පසුගිය සභාපතිතුමාගේ කාලේ තමයි මේ රක්ෂණ ආයතනයෙන් වාහන රක්ෂණය කරේ.මේ වෙනකම් ඒ සම්බන්ධව ඔබතුමාට කවුරුත් පෙන්වලා දීලා නෑ.මේවා ඔබතුමාට තනියෙන් කරන්න බෑ කියලා අපි දන්නවා.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒක ඇත්ත.අපේ අදහස තිබුණේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පිලිගත් ආයතනයක්නේ.ඒකේ වැඩිවීමක් තියෙන එක ඇත්ත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා

නිලධාරීන් මේවා පෙන්වලා දෙන්න ඕනා.ලක්ෂ ගානක් සභාවේ මුදල් අපතේ ගිහින් තියෙනවා.මේවාට නිසි ක්‍රමවේදයක් හදන්න කියලා තමයි අපි මේ අවුරුදු හතරෙම කිව්වේ.ඊළඟට මේ වාතර්‍ා දෙකේම තියෙනවා තණකොල කපන්න නූල් ගෙනත් තියෙනවා.ප්‍රෙටලුත් නෑ.මේ තරම් නූල් යනවද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දැන් කිව්වානේ මැෂින් වැඩ කරේ නෑ කියලා තෙල් නැතිව.එතකොට ගිය සභා වාරයෙන් පස්සේ නැවතත් නූල් ගෙනත් තියෙන්නේ මොකටද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
රු.23000 ක මුදල් ගෙවලා නූල් අරගෙන වැඩක් කරේ නැත්නම් වැඩක් නෑනේ.අක්කරයක ප්‍රමාණයේ තණකොල කපන්න රු.100ක නූල් කැල්ලක් ඇති.එතකොට මේ තරම් නූල් ප්‍රමානයකින් මොකද කරේ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්දි තිරිමාන්න මිය
මම කථා කරන්නේ සුජීව මන්ත්‍රීතුමාගේ 6.3.1 යෝජනාව යටතේ පසුගිය සභාවේ සාකච්ඡා වුන බෝඩ් සම්බන්ධ සිද්ධිය ගැන.මට දැනගන්න ඕනේ එදා අපිට පොරොන්දු වුණා බෝඩ් ගලවනවා කියලා.බෝඩ් කීයක් ගැලෙව්වද?ඒ බෝඩ් වලට මුදල් ලැබුණද? ඊළඟට සභාවේ සේවකයෙක් මට කරපු බැණ වැදීමට තාම උත්තරයක් නෑ.ඔබතුමාලා ඒකට පියවරක් නොගත්ත නිසා තමයි ඔහු පන්නරය ලැබුවේ.ඔහු උපකාරක පන්ති ගුරුවරුන්ට කථා කරලා තජර්නය කරනවා.ඒ ගුරුවරු නිසා මම කතා කරනවා කියලා. ඒ තරම් ශක්තියක් ඒ සේවකයාට ලැබෙන්නේ මේ සභාව ඇතුලේ ඉන්න මහා පරිමාණ නිලධාරීන් ඔහුව රකින නිසා. ඊලඟට බෝඩ් ගලවනවා කිව්වා ජුනි 15 සභාවේ.ජුනි 17 මම සභාවට ඇවිල්ලා මම ඉල්ලුවා ගෙවපු බිල් ටික.ඒ බිල් ඉල්ලපු දවසේ හවස තමයි මේකේ සේවකයෝ දෙන්නෙක් බෝඩ් වලට මුදල් ගෙව්වේ. කරුණාකරලා සභාපතිතුමා මේ ගැටළුවට විනිවිදභාවයකින් විසඳුම් දෙන්න.මම ඔබතුමාට සහ ලේකම්තුමියට කිව්වාම හෙටම බෝඩ් ගලවනවා කිව්වා. මටත් එන්න කිව්වා. එච්චරයි.බෝඩ් ගැලෙව්වේ නෑ.මේවා කරන කෙනා මගේ පෞද්ගලික හිතවත් අයට මේකට බලපෑම් කරනවා.ඒ නිසා මට මේ සිද්ධිය පෞද්ගලිකව පොලිසියට අරන් යන්න ඕනේ නෑ.මේ සිද්ධිය සභාව ඇතුලේ විසඳන්න.මේක 2018 විසඳන්න ඕනේ ප්‍රශ්නයක්.2018 විසඳුවේ නැති වුනාට මම යේජනාව දැම්මට පස්සේ මුදල් අය කරන එක නතර කරා.ඒක මෙහෙන් නතර කරාට එලියේ ගුරුවරුන්ගෙන් සල්ලි ගත්තා.ඒ අවුරුදු හතරේ ආදායම ගැන තාම කථාවක් නෑ.බෝඩ් ගලවන්න කියපු දවසේ හවස තමයි එම ව්‍යාපාරය කරන සේවකයෝ දෙන්නෙක් බෝඩ් වලට මුදල් ගෙව්වේ.මම දැන ගන්න කැමතියි එදා මුදල් ෙගව්වේ මතුගම නගරයේ බෝඩ් වලට විතරද? අතුරු මාගර්වල තියෙ බෝඩ්වලට මුදල් එනවද කියලා අපි දන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා ගිය සභා වාරයේ සම්මත වුණා බෝඩ් ගලවනවා කියලා.අපි දැක්කේ නෑ.කිසිම බෝඩ් එකක් ගලවලා තියෙනවා.අනිත් කාරණය සල්ලි ගන්න බැනේ.අපි කිව්වානේ සල්ලි ගන්න එපා කියලා.අපි පැහැදිලිව කිව්වා බෝඩ් ගලවලා ඒකට ක්‍රමවේදයක් හදලා මුදල් අය කරන්න කියලා.එදා තමයි මුදල් ගෙවලා තියෙන්නේ. ඒ වගේම ඊට පෙර අය කර නොගත් මුදල් අය නොකිරීමට හේතුව කියන්න.

ගරු සභාපතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ආදායම් පරීක්ෂක සුනිල් ප්‍රසන්න මහතා විසින් දැනට ඇති බෝඩ් සහ මුදල් අය කිරීම් සම්බන්ධව වාතර්‍ාවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ගිය සභා වාරයේ ලේකම් මිස් කිව්වා 2019,2020,2021,මුදල් අය කරේ නෑ කියලා.

ලේකම් ඩබ්.ඒ.එම් අයි.එස් තෙන්නකෝන් මිය

2020 න් පස්සේ කියලා කිව්වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
හරි 2020න් පස්සෙ කියන්නකෝ.2020,2021කියන්නකෝ. දැන් මුදල් අය කිරීමක් කරලා තියෙනවානේ.2020,2021,මුදල් අය නොකරපු හේතුව මොකක්ද?

ආදායම් පරීක්ෂක සුනිල් ප්‍රසන්න මහතා

කමිටු තීරණයක් තියෙනවා.2019.12.31 පරිසර කමිටු කාරක සභාවේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා මේකට තීරණයක් දෙන්න.මේ බෝඩ් ඉවත් කරනවද නැද්ද?නැත්නම් ඔතනින් අයින් වෙලා යන්න.අපිට හොරුත් එක්ක මේක කරන්න බැහැ.ඔබතුමා තවත් නිලධාරීන්ව රකින්න එපා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ ටික හැමෝම අහගන්න.2019 වෂර්යේ ප්‍රශ්නයක් මේ සභාවේ මතු කළා. ඊට පස්සේ තමයි මේ කමිටුව තියන්න තිරණය කලේ. උප සභාපතිතුමාට මතක ඇති රුවන්දි මන්ත්‍රීතුමිය මතුකරයින් පසු තමයි 2019.12.31 පෙ.ව. 10.00ට තිබ්බා. මේ තියෙන්නේ අත්සන් ලේඛනය හැමෝම දක්කානේ, ඒ කමිටුවේ දී සාකච්ඡා කරපු කරුණු තමයි සියළුම නාම පුවරු ඉවත් කළයුතු බව. සභාපති, උප සභාපති, සුදේශ් ලක්මාල්, කමිල් කුමාර, නාරවිල සමිතවංශ හිමි, රුවන්දි තිරිමාන්න, තුසිතා ප්‍රියංගනි යන අය.නිලධාරීන්

විදියට ලේකම්තුමිය,තාක්ෂණ නිලධාරීන් සහ ආදායම් පරීක්ෂක මහත්වරු ඉන්නවා. මාගර් වල ඇති නාම පුවරු ඉවත් කිරිම සලකා බැලිම ගැන ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා කරුණු ඉදිරිපත් කරලා තියෙනවා. සියළු නාම පුවරු ඉවත් කිරිම හා මාගර් අනතුරුවලට ප්‍රබලව බලපාන්නේ තැන් තැන්වල සවිකර ඇති අවිදිමත් නාමපුවරු බව ප්‍රකාශයට පත්කලා. මුදල් ලබාගත් බෝඩ් වල කාලය ඉවර වී ඇති බැවින් ඒවා ඉවත් කිරිම සුදුසු බව මම ප්‍රකාශ කරලා තියෙනවා. ඒ වගේම අහිමිවන ආදායම එකතු කර ගැනිම සඳහා 2021 වෂර්යේ සියළුම නාම පුවරු ඉවත් කර ප්‍රධාන මාගර් හතර ආවරණය වන පරිදි ඩිජිටල් නාමපුවරු සවි කිරිමට අපි තීරණයක් අරන් තියෙනවා.තවද අනුමත සැකිල්ල අනුව හා නියම කරන තැන්වල පමණක් නාම පුවරු ගැසිය යුතු බවත් අළුතෙන් සවි නොකළ යුතු බවත් සඳහන් කරලා තියෙනවා. අදාල ස්ථාන මේ වාතර්ාවේ දාලා තියෙනවා.අපි විසින් සැකිල්ලක් හදලා මේක වෂර්යකට යම් මුදලකට ගන්න පුද්ගලයාට ලබා දෙනවා.ඊට පස්සේ අපේ අතුරු ව්‍යාවස්ථාවේ තියෙන හැටියට වගර් අඩි ගානට අය කරන්න ඕනා. ඒක අපිට ගෙවන්න ඕනා.වෂර්යට දෙන බදු මුදල ගන්නත් ඕනා අපි.වගර් අඩි ගානට මුදල් ගන්නත් ඕනා.උපකාරක පන්ති ගුරුවරු දෙන මුදල ඒ ඒ සවි කරන ආයතන එක්ක යන්නේ.අපි දැනුවත් කිරීම් කරාම ගුරුවරු තමයි ඒක තීරණය කරන්නේ කලින් විදියටම එනවද නැත්නම් ආදශර් බෝඩ් හරහා එනවද කියලා. ඒක තමයි අපි යෝජනා කරලා පෙන්නලා දුන්නේ. මේකේ ආකෘතියක් පෙන්වලා දීලා තියෙනවා.මේ තීරණය ක්‍රියාත්මක කරන එක තමයි නිලධාරීන් කරන්න ඕනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දැන් ඔය වාතර්ාවේ කොතනකවත් මුදල් අය කර ගන්න එපා කියලා සඳහන් වෙලා නෑ.අනවශ්‍ය පුවරු ඉවත් කරලාත් නෑ.ඉවත් කරලා නැත්නම් ඒවායේ මුදල් ගන්න ඕනානේ.එහෙනම් දැන් තියෙන අවශ්‍ය පුවරු වලටත් මුදල් අය කරලා නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
දැනට තියෙන බෝඩ් වලට අනිවායර්යෙන් මෙහෙට මුදල් ගෙවලා තියෙන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඒක තමයි 2020,2021 අවුරුදු දෙකේ මුදල් ඇවිල්ලා නැනේ.රු.420,000ක මුදල ඊලඟ අවුරුද්දේ රු.160,000 ට අඩු වුනේ කෙහොමද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාපතිතුමා අනිත් කාරණය තමයි මම ඇවිල්ලා ගිය මාසේ සභාවෙන් පස්සේ 16 වෙනිදා මම සුනිල් මහත්තයාගෙන් රිසිට් ටික ඉල්ලුවා.එදා කිව්වා ඊළඟ දවසේ උදේ 10.00ට දෙන්නම් කියලා.නමුත් එදා හවස 3.00ට තමයි බිල් කැඩුවේ.ඒක සුනිල් මහත්තයා පිලි ගත්තා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මේ 6 වෙනි මාසේ වෙනකම් මුදල් ගෙවන්නේ නැතුව ඉන්න හේතුව මොකක්ද?මේ වංචාවට මොකද කරන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අය නොකර ඉන්න හේතුව කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඔය අය නොකිරීමට හේතුව අපි ගිය සභා වාරයෙත් ඇහුවා.මේ සභා වාරයෙත් අහලා ගෙදර යන්න නෙවෙයි අපි අහන්නේ.මොකක්ද මේකට ගන්න ක්‍රියාමාගර්ය කියලා අද කියන්න ඕනා.සමාජයට යන අපිටයි මේකේ දෝෂාරෝපණය එන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ බෝඩ් ගලවන්න පොලිසියේ මහතත්තයකුත් සම්බන්ධ කරලා දීලා ඒක කරේ නැත්තේ ඇයි කියලා කියන්න.ආදායම් පරීක්ෂක මහත්තයාට ලියුම් මගින් දැනුම් දීලා තියෙනවා.අද ඉඳලා මේ බෝඩ් ගලවන්න.බෝඩ් ගලවන්නේ නැතුව මේ සභාව ගෙනියන්න බෑ.හරිම අවිධිමත් විදියට බෝඩ් ගහලා තියෙන්නේ.මම කිසිම දේකට එපා කියන්නේ නෑ. ආදායම් පරීක්ෂක මහත්තයාගේ වැඩ නවත්වන්නකෝ කරන්න බැරිනම් වෙන කෙනෙක්ව දාන්න. රාජකාරිය නොකරන අයගේ වැඩ නවත්තන්න තාවකාලිකව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
මේ සභාවේ මුදල් අය කර ගන්න එපා කියලා තියෙද්දි මුදල් අය කරලා තියෙනවා.එතනම තියෙන්නේ වංචාවක්.සභාව තීරනයක් ගත්තාම ඒක ක්‍රියාත්මක නොකර ඒ තීරණය අභියෝගයට ලක් කරලා තියෙනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
සභාපතිතුමා මේකේ මේ කටවුට් කපන්නේ නැත්නම් අදම අතුරු ව්‍යාවස්ථාවෙන් යෝජනා වුණ මුදල අය කරන්න කටයුතු කරන්න ඕනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දැන් තියෙන බෝඩ් වලට මුදල් ආපහු ගෙවනකම් බෝඩ් ටික ගලවන්න.ඒක තමයි යෝජනාව.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
කිසිම බෝඩ් එකක් අලුතින් සවි කරන්න අවසර දෙන්න එපා.අනවසර සියලු බෝඩ් අයින් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
සභාපතිතුමා දැන් මේකට ගන්න තීන්දුව මොකක්ද?අපි හැමදේටම කතා කරනවා.සභාපතිතුමා බෝඩ් අයින් කරන්න කිව්වට ඒක ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් මොකද කරන්නේ?නිලධාරීන් කියන දේ කරන්නේ නැත්නම් මේ විදියට සභාව පවත්වාගෙන යන්න බෑනේ.රුවන්දි මන්ත්‍රීතුමියට මරණ තජර්නය කරපු එකට මොකද කරන්නේ?එහෙම දෙයක් තියෙනවානම් විධිමත් පරීක්ෂනයක් කරන්න ඕනේ.අනිත් එක ලේකම්තුමිය දැන ගන්න ඕනේ මේ වගේ දේකට පරීක්ෂණයක් කරන්න.සභාපතිතුමා ඒ අදාල සේවකයාව ගෙන්වලා මේ ගැන කථා කරන්නකෝ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සුනිල් මහත්තයා හෙට දවසේ මේ අනවසර සියලු බෝඩ් ගලවන්න පටන් ගන්න.පොලිසිය ළග තියාගෙන ගලවන්න.ඔයාට පුළුවන්ද?බැරිද?

ආදායම් පරීක්ෂක සුනිල් ප්‍රසන්න මහතා

වාහන දෙනවානම් මට ගැටළුවක් නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඩීසල් දෙන්නම්.ලොරියත් දෙන්නම් යන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා
සභාවට ලැබිය යුතු මුදල් අය කර ගන්නේ කොහෙන්ද එතකොට?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා,අපි ගිය සභාව තිබ්බට පස්සේ තමයි ගෙවලා තියෙන්නේ.6/15 ගෙවලා තියෙනවා රු.20500 ක්.6/15,රු.30750යි.6/15 රු.21250යි.6/16 රු.2250යි.මේ අහගන්න.සභාවේ මන්ත්‍රීවරුන්ට දැන ගන්න මේ කියන්නේ.අපි සභාවේ කථා කරාට පස්සේ රු.54200ක් ගෙවලා තියෙනවා.පොඩි මුදලක්ද සභාවට අහිමි වෙන්න ගියේ.මම කියන්නේ ඔය ලේකම් මිසුයි,සභාපතිතුමායි දෙන්නම අස්වෙන්න ඕනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මම අයින් වෙන්නම්.ඒක ගැටළුවක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
අයින් වෙන්නේ නැතුව කෙහොමද?ඔබතුමා කියන දේ ලේකම් මිස් අහන්නේ නැත්තම්,ලේකම් මිස් කියන දේ නිලධාරීන් අහන්නේ නැත්නම් මේ සභාව ගෙනියන්නේ කෙහොමද?අපි ද හොරකම් කරලා තියෙන්නේ?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපි මෙහෙම තීරණයක් ගන්නවා.හයවෙනි මාසේ ගෙවපු සල්ලි ආපහු ගෙවලා සියලු බෝඩ් ගලවනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා,ගිය සභා වාරයේ කථා කරාට පස්සේ ඇයි මේ මුදල් එකතු කරේ?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒක මම දන්නේ නෑ.බෝඩ් ගලවන්න මේ අයට තීන්දු දුන්නා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
2019ට වඩා 2020 අදායම අඩු වෙලා තියෙනවා.ඒකට කවුද වග කියන්නේ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
ගිය මාසේ සභාවෙන් පස්සේ රු.285000ක් බැදලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා
ශුවණාගාර භූමියේ වාහන කීයක් දවසට පාක් කරනවද?මාසෙට කොපමණ මුදලක් ඒ වෙනුවෙන් සභාවට බදිනවද?ඔය ශුවණාගාරයේ වැඩ කරන සේවකයෙක් තමයි සමාජ මාධ්‍යවල දාලා තිබුණේ මන්ත්‍රිවරු හොරු කියලා.අපි පෙන්වන්නම් කවුද හොරු කියලා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

සභාපතිතුමා මේ සේවකයාව ගෙනැල්ලා ප්‍රශ්නය නිරාකරණය කරලා ඉන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
ගරු සභාපතිතුමා, මේකේ ගරුත්වයක් තියෙන හොඳ රජයේ නිලධාරීන් ඉන්නවා.මේ ආයතනයේ ඉන්න නිලධාරීන්ම රජයේ නිලධාරීන් ගැන විගණනයක් ඉල්ලලා සමාජ මාධ්‍යවල දාලා තියෙනවා.අපි ඒ අයට ගරු කරන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා
ඔබතුමා මේවට සම්බන්ධ නැත්නම් මේවාට නිසි ක්‍රියාමාගර් අරගෙන ඔබතුමා මේවායෙන් නිදහස් වෙන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
අදවත් කෙලින් තීරණයක් ගන්න සභාපතිතුමා.දැන් කටවුට් ප්‍රශ්නේ කොහොමද විසඳන්නේ?තජර්නය කරපු එකත් තියෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මන්ත්‍රීතුමිය එන්න මාත් එක්ක පොලිසියට යන්න.සභාව ඉවර වෙලා යමු.මන්ත්‍රීතුමියට උදව්වට මම ඉන්නවා.මරණ තජර්න කරාම පොලිසියට පැමිණිලි කරන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
මේක සභාවේදි කරපු ප්‍රකාශයකට කරපු දෙයක්.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒකට පරීක්ෂණයක් යනවානේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඕනැම ආයතනයක හොරකමක් හෝ වංචාවක් කරලා තියෙන සේවකයෙක් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා මුලින්ම කරන්නේ මොකක්ද කියන්නකෝ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
විමශර්නයක් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
විමශර්නය කරන්නේ ඒ අදාල කෙනාව වෙන තැනකට දාලා.මෙච්චර වෙලා තාම මේ සේවකයාට මුකුත් කරේ නෑ.මේ අය ඒ සේවකයගෙන් උදව් ගන්න නිසා ඔහුට විරුද්ධව මුකුත් කරන්නේ නෑ.ඒකයි වෙලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා

ශ්‍රවනාගාරයේ පාකින් එකේ කඩපු බිල් තාම ලැබුණේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම ළඟ තියෙනවා.මේ සම්බන්ධව සමාජ මාධ්‍යවල ගිය වෙලාවේ මම හොයලා බැලුවා.මේ සම්බන්ධව කටයුතු කරපු නිලධාරිනිය එයාගේ කාල සීමාවේ හරියට හදලා තියෙනවා.වෂර්යෙන් වෂර්ය සියලු විස්තර තියෙනවා.මම සියලු වාහන ඡායාරූපගත කරලා අංක කරා.මටත් තේරුනා මේ තියෙන සියලු වාහන වලින් මුදල් අය කරලා නෑ කියලා.මම සමිතියේ දෙන්නෙක් සභාවට ගෙන්නලා මුදල් ගෙවීම් පිළිබඳ විමසීමක් කරාම ඒ අය මුදල් ගෙවනවා කිව්වා.ඒ නිසා මේ ප්‍රශ්නය හරියට හොයා ගන්න ඕනා.ඒ නිසා මේ ෆයිල් එක ඕනෑම වෙලාවක ඔබතුමන්ලාට විවෘතයි.මේක දැනට කරගෙන යන සිද්ධියක්.මම කියන්නේ මන්ත්‍රීවරු ගැන හොයන්න ඉස්සර වෙලා සභාවේ සේවකයෝ නිවැරදි වෙලා ඉන්න ඕනා. පාසල් වහපුවට,කොවිඩ් කාලයට අදාල සහනය දෙනවා.අපි වාහන වලට දැනට රු500 ගානේ අය කරන්නේ.වැඩි කරන්න යෝජනාවක් දැම්මට ඒක ක්‍රියාත්මක කරන්න වුණේ නෑ රටේ තිබුණු තත්වය උඩ.

අපේ අනිත් කාරණා ටික බලමු.මෙතන තියෙනවා කෘෂිකමර්යෙන් පැල ගෙනාපු බිල්පත.මන්ත්‍රීතුමන්ලාට බලන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

සභාපතිතුමා හොරකම් කරේ නෑ කියනවානම් මම ඒවත් කියන්නම්.ඇත්ත නැත්ත දන්නේ නැතුව ඔබතුමාලා අනිත් අයට චෝදනා කරනවා.ඔබතුමා කියනවා වරදක් කථා කරනවා නම් ඒ අය නිවැරදි වෙලා ඉන්න ඕනේ කියලා කියනවා.සභාපතිතුමා, මූණමල්වත්තේ හාමුදුරුවන්ගේ පාර සභාවේ සේවකයන්,යන්ත්‍ර සූත්‍ර භාවිතා කරලා කොන්ක්‍රීට් කරලා කියක් හම්බුණා කියලා ඔබතුමා දන්නවා ඇතිනේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මට මුදල් ලැබුනේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

හාමුදුරුවන්ව ගෙන්නලා අහන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

හෙට ගෙන්නනන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

දේශපාලනය කරන හැමෝම ශුද්ධවන්තයෝ නෙවෙයි.වැරදි කරපු අයත් ඉන්නවා.සභාපතිතුමා ගන්න ඇතැම් තීන්දු තීරණ එක්ක අපිටම කණගාටුදායක තත්වයන් ඇතිවෙලා තියෙනවා.සභාපතිතුමාගේ ගෙදර ජේ.සී.බී එක,සභාවේ සේවකයින් කොයි තරම් වැඩ කරනවාද?අද මම ඇත්තටම සතුටු වෙනවා 09 වෙනදා වුණ සිද්ධිය සම්බන්ධයෙන්.ඒ නිසා තමයි මෙහෙම හරි කමිටුවක් දාලා මේ සභාවේ හොරකම් හොයන්න ගත්තේ.කොම්පෝස්ට් අංගනයේ වෙලා තියෙන හොරකම් ගැන සභාපතිතුමා දන්නේවත් නෑ.ලේකම්තුමියට ඕන විදියට ලේකම්තුමිය වැඩ කරනවානම්,නිලධාරීන් ඒ අයට ඕන විදියට වැඩ කරනවානම්,මන්ත්‍රීවරු ඒ අයට ඕන විදියට වැඩ කරනවානම් ඔබතුමා මුලාසනයේ ඉඳලා ඇත්තටම වැඩක් නෑ.ජනතාවගේ මුදල් වලින් නඩත්තු කරන මේ සභාව විදියට අපි ජනතාවට වගකියන්න ඕනේ. මම ගොඩක් දේවල් දැනගෙන කථා නොකර ඉඳියේ මට වැඩක් නැති නිසා.මාව කොටු කරන්න ඔබතුමාලා ගොඩක් උත්සාහ කරා.මම වරදක් කරලා තියෙනවානම් මම ඕන තැනකට එනවා.මම බය නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා
ලේකම්තුමිය,මේ පාක් එකේ රු.500 අය කරන වාහන 29ක් තියෙනවා.රු.300 ගානේ අය කරන වාහන 5ක් තියෙනවා.එතකොට රු16000ක් වෙනවා.මේකට අනුව කිසිම මාසෙක රු.10000ක් ලැබිලා නෑ.ඉතුරුවට මොකද වුණේ?

ශ්‍රවණාගාර භාරකරු වන සාලිත ඩිලාන් මහතාව සභාවට ගෙන්වන ලදී.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඔයා ශ්‍රවණාගාර භාරකරු විදියට බිල් කඩනවනේ. ශ්‍රවණාගාරේ තියෙන වාහනවලට වඩා අඩුවෙන් තමයි බිල් එන්නේ කියන එක සොයාගෙන තියෙනවා.
ශ්‍රවණාගාර භාරකරු  සාලිත ඩිලාන් මහතා
වාහන ඔක්කොම එන්නේ නෑ.එන වාහන අඩු වැඩි වෙනවා.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
පාසල් සේවාවල සමිති නියෝජනය කරන කීප දෙනෙක් ගෙන්වලා මේ ලේඛනත් එක්ක අපි සාකච්ඡාවක් තියමු බ්‍රහස්පතින්දා උදේ..පුළුවන් අය එන්න.එතකන් සාලිත වෙනුවට අපි වෙන කවුරු හරි දාමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ල් විජේසිංහ මහතා
ගරු සභාපතිතුමනි,එතුමට චෝදනාවක් කරනවානේ.ඒකට සාධාරණ පරීක්ෂණයක් කරන්න.කෙනෙකුට චෝදනාවක් කරනකොට එයා නිවැරදි කෙනෙක් වුණොත් ඒක මහ අපරාධයක්.වැරදිකරුවෙක්නම් නිසි දඩුවම දෙන්න ඕනේ.ඒකයි වෙන්න ඕනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
දැන් සභාපතිතුමාගෙන් ඇහුවාම කිව්වා ඒ ගැන පරීක්ෂනයක් කර ගෙන යනවා කියලා.මාස එකහමාරක් තිස්සේ පාක් එක ගැන පරීක්ෂණයක් කරනවා.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මෙහෙමයි.පාසල් වාහන ආවේ නෑ සැරෙන් සැරේ.ගිය සතියට ඉස්සෙල්ලා සතියෙත් පාසල් වැහුවා.එතකොට අසම්පූණර් වාතර්ාවක් වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දවසට එක පාරක් ආවත් සල්ලි ගන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපි අවස්ථාවක් දීලා බලමු.කරුණු ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
අපි සභාවේ කථා කරන්නේ සභාවට ලැබෙන්න තියෙන ආදායමක් නිසියාකාරව ලැබෙනවද කියන එකයි.ඒකට නිලධාරියෙක් පත් කරලා තියෙද්දි ඒක නිසියාකාරව කරනවද නැද්ද කියලා සොයා බලන්න ඕනා. දැන් මේ ශ්‍රවණාගාර භාරකරුගෙන් කරුණු විමසීමක් කරා.එතකොට එයා දෙන උත්තරයක් තියෙනවානේ.ඒ අනුව විමශර්නය කරගෙන යන්න.නැතුව මේ මෙයා හොරෙක් කියලා කියනවා නෙවෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
ඒ වුනත් සභාපතිතුමා එයාගේ හිතේ අපි ගැන වෛරයක් තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මේකට සභාපතිතුමාට දෙන්න බැරි විසඳුම අපි දෙන්නම්.හෙට දිනයේ කැඳවන්න ඔය වාහන තියෙන අයගේ සභාපතිවයි ලේකම්වයි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
හෙට දිනයේ පාසල් නිවාඩු දීලා නිසා ගෙන්නන එක සාර්ථක වෙන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
සභාපතිතුමා,ගිය සභාවෙන් කොම්පෝස්ට් එක ගැන පරීක්ෂණයක් කරන්න කමිටුවක් පත් කරානේ.අපි ඔය ගැන හොයනකොට යම් පුද්ගලයෝ මට දූරකථනයට කතා කරලා ඇහුවා මන්ත්‍රීවරුන්ට දැන්ද මතක් වුනේ සභාවේ හොරකම් ගැන හොයන්න කියලා.මම කිව්වා දැන් හරි හොයලා මේක හරි මාගර්යට ගන්න හදන එකට ඔයගොල්ලෝ සතුටු වෙන්න කියලා.සභාපතිතුමාට ඕනතරම් බලතල තියෙනවා මේ කටයුතු කරන්න.අද මන්ත්‍රීවරු හැල්ලුවට ලක් වෙලා තියෙන්නේ සභාපතිතුමා නිසි වෙලාවට නිසි තීන්දු තීරණ ගත්තේ නැති නිසා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

දැන් බෝඩ් සම්බන්ධ තීරණය මොකක්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
බෝඩ් සම්බන්ධව ඔය කියපු කමිටු වාතර්ාව ආදායම් පරීක්ෂකවරු ක්‍රියාත්මක කරලා නෑ.ඊළඟට ඒ වෂර්වල අය වෙලා නැති ආදායමට විසඳුමක් දෙන්න ඕනා.ඒකට ඒ බෝඩ් එක ඒ තැන්වල තිබුණු බවට හඳුන ගන්න ඕනා.ඒකට සාක්ෂියක් තමයි උපකාරක පන්ති ගුරුවරු ළඟ තියෙන බිල්.ගනනය කරන්නේ එහෙමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

2019 ගණනය කිරීමට සල්ලි ගන්න.මේ වෙලා තියෙන්නේ වංචාවක්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
2019 ට පස්සේ අපි දැකලා තියෙනවා අළුත් ස්ථානවල බෝඩ් තියෙනවා.පාසල් අසල,අපේ කායර්ාලය ළඟ බෝඩ් වැඩි වුණා.අපි කියන්නේ ඒවට අය කරලා දෙන්න ඕනේ.

ශ්‍රවණාගාර භාරකරු වන සාලිත ඩිලාන් මහතාව නැවත ගෙන්වා ඔහුගේ හැසිරීම පිලිබඳ අවවාද කරන ලදී.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
දැන් කටවුට් වලට කරන්නේ මෙහෙමයි.ගිය අවුරුද්දේ ජුනි දක්වා අවුරුද්දටම මුදල් අය කරලා තියෙනවා කියලා මට කිව්වා.ඒ අවුරුද්ද මාසෙකට කරලා අපි බෝඩ් සියල්ල

ගලවන්න තීරණය කරමු.අපි කියන තැන්වල විතරයි බෝඩ් සවි කිරීම කරන්න ඕනේ.මේ යෝජනා මම දුන්නේ ඔබතුමන්ලාගේ සහයෝගයෙන්.කමිටුවෙන් දුන්න තීරණය ක්‍රියාත්මක නොකිරීම වරදක්.මේක විදිමත් කරන්නනම් අපි කියන විදියට අනතුරුදායක නොවෙන්න බෝඩ් ගහන්න ඕනා.එතකොට බෝඩ් ටික ඔක්කොම ගලවනවා.මුදල් අය නොකර කිසිම බෝඩ් එකක් පාරේ තියෙන්න බෑ.ඒකටනේ සභාව තියෙන්නේ.අතුරු ව්‍යාවස්ථාව දැනට තියෙනවා වගර් අඩි ගානට අය කර ගන්න.ඒක වැඩි කරගන්න නම් අතුරු ව්‍යාවස්ථාව නැවත සංශෝධනය කරන්න ඕනා.හෙට දවස ඇතුලත අනවසර ඒ කියන්නේ මුදල් අය කරලා නැති බෝඩ් ගලවන්න කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ඒ කියන්නේ මුදල් අය නොකරපු බෝඩ් තියෙනවා.එහෙම තියෙන්නේ කොහොමද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
බෝඩ් සවි කරන එක අවිධිමත්ව වුණ නිසා තමයි තැන තැන තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මීට අමතරව සභාපතිතුමා සභාවට අහිමි වුණ ආදායම ලබා ගන්නේ කොහොමද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපි ඒක ගණනය කරලා අදාල නිලධාරීන්ගෙන් අය කරන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ගණනය කරන්න දෙයක් නෑ.2019 රු.420000ක් තියෙනවානම්.2018 කරන්න දෙයක් නැනේ.ඒ ඉතුරු මුදල 420000ට එකතු කරන්න.ඒක ලේකම් මිස් ගෙවන්න.නැත්නම් එකතු කරන අය ගෙවන්න.එහෙම නැත්නම් සභාපතිතුමා ගෙවන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය

ඔය බෝඩ් සියල්ලම ගලවනවා වගේම සභාවේ සේවකයෝ බෝඩ් ගහන එකත් නවත්වන්න ඕනා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සුනිල් මහත්තයා මේක ආයි සභාවට ගේන්න තියන්න එපා.අනිත් වැඩ නවත්වලා හරි මේක කරන්න.

ආදායම් පරීක්ෂක සුනිල් ප්‍රසන්න මහතා

මට තීරණයක් දෙන්න සභාපතිතුමා මම මේ බෝඩ් වලට මොකක්ද කරන්න ඕනේ කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
**ඒක තමයි දැන් කිව්වේ.මුදල් ගෙවලා නැති සියලු බෝඩ් අයින් කරන්න.තියෙන බෝඩ් වල මෙන්න මේ බෝඩ් වලට අපි මුදල් අය කරලා තියෙන්නේ මේ දවසට කියලා අපිට දන්වන්න.ඊට ඉස්සෙල්ලා ඒ බෝඩ් එක තිබුණානම් ඒ ආදායම හොයලා දෙන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

**සභාපතිතුමා මෙතන තියෙන්නේ පොඩි ප්‍රශ්නයක්.2019 රු.420,000ක් මුදල් අරන් තියෙනවා.ඒක ඊළඟ අවුරුද්දේ රු. 160,000ට අඩු වුණේ කොහොමද?එතන සභාවට අහිමි වුණ ලොකු මුදලක් තියෙනවා.ඒක කාගෙන්ද අය කරන්නේ?එතකොට මුදල් අය කරගෙන විතරක් මේක අතාරින්න පුළුවන්ද?මේකේ මුදල් අය කර ගන්නේ කොහොමද කියලා අද උත්තරයක් දෙන්න.මේ ගැන මේ කථා කරන තුන්වෙනි සභාව.පරිසර කමිටුවෙන් මුදල් අය කරන්න එපා කියලා තීරණයක් දීලා නෑ.2019 න් පස්සේ සභාවට අමතර පන්ති වලින් අහිමි වූ මුදල සභාවට ගන්නේ කොහොමද කියලා කෙටියෙන් ලේකම් මිස් අපිට කියන්නකෝ.**

**ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය.**

**ඒ ඒ වෂර්වල සමීක්ෂණයක් කරනවානේ.ඒකෙන් තමයි බෝඩ් ගාන හඳුන ගන්නේ. එතකොට අය වුණ මුදලයි සමීක්ෂණ බෝඩ් ගණනයි අතර වෙනස තමයි  අය කර ගන්න ඕනේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

**සමීක්ෂණ කරලා හඳුනගෙන තියෙනවානම් අය නොකර ඉන්න හේතුව මොකක්ද?**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
**මේ කමිටු වාතර්ාවේ ස්ථාන 29ක් පෙන්වලා දීලා තියෙනවා බෝඩ් ගහන්න පුළුවන් ස්ථාන.ඒ ටික තියලා අනෙක් ඔක්කොම ගලවන්න.මේකේ මතභේදයට ලක්වෙලා තියෙන ටියුෂන් බෝඩ් මේ ස්ථාන 29 විතරයි ගහන්න පුළුවන්.අපි අනුමත කරලා තියෙනවානේ.මේකට පිටින් ගිය සියල්ල ඉවත් කරන්න.දීඝර්කාලීනව තිබුණු බෝඩ්වලට හිඟ මුදල් අය කරලා දෙන්න.කැමති දින ගණනක් ඉල්ලලා පොලිසිය සම්බන්ධ කරගෙන හරි කරන්න.**

**අභ්‍යන්තර විගණන නිලධාරී පාලිත කුලරත්න මහතාව සභාවට කැඳවන ලදී.**

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
**පාලිත මහත්තයා අද ඉඳලා බලන්න ශ්‍රවණාගාරයේ වාහන 29 අඩු වුණේ මොකද?එතකොට ඒකට හේතු එයාගෙන් අහන්න.ඊළඟට බෝඩ්වල ආදායම අඩු වුණේ මොකද කියලා ඔබතුමා  බලන්න ඕනා.මොනවාද මේවාට හේතු කියලා.අපි මේ දක්වා ඔබතුමාට මේ වගකීම පවරලා තිබුණේ නැනේ.අද ඉඳලා ඒ වගකීම ඔබතුමාට පවරනවා.මේ ගැන හොයලා සභාව දැනුවත් කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න  මහතා

මේකේ තියෙන්නේ මතුගම කටවුට් ගැන විතරයිනේ.ගල්මත්ත,යටදොල තියෙන කටවුට් ගැනත් ක්‍රියා කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මෙ කටවුට් ආදායම මේ විදියට වුණේ 2019 ඉදලා මේ ස්ථාන කිව්වට ඒ වැඩපිළිවෙළ ඉදිරියට ගිය නැති එකයි වැරුද්ද.2020 ආදායම අඩු වුණා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා තණකොල කපන මැෂින්වලට ගෙනාපු නූල් සම්බන්ධව පිලිතුරක් ලැබුණේ නෑ.ඒක වාතර්‍ා දෙකේම දාලා තියෙනවා.

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය.

එක වාතර්‍ාවක තියෙන්නේ අත්තිකාරම ලබා ගත්ත එක.අනිත් වාතර්‍ාවේ දාලා තියෙන්නේ අත්තිකාරම් පියවපු එක.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ජේ.සී.බී එක ගැන කථා කරන කොට රු.42000ක් ගෙවන්න ඕනා බඩු ටික ගේනකොට.ෆිල්ටර් එකේ වැඩේ ඉවර කරලා තියෙන්නේ.මේ ටිකේ ඩීසල් නෑ වැඩ කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
යෝග්‍යතා සහතික ලබා ගන්න රු.14960ක මුදලක් දාලා තියෙනවා.ඒ වගේ මුදලක් ගියේ කොහොමද කියලා පැහැදිලි කරන්න.

කළමනාකරණ සේවා නිලධාරී අරුන බුද්ධික මහතා

එතන 14960ක් වෙලා තියෙන්නේ ආදායම් බලපත්‍රය,දුම් සහතිකය,යෝග්‍යතා සහතිකය කියන ඒවට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
ගරු සභාපතිතුමා අපි මේවා අහන්නේ තරහට නෙවෙයි.අපිට මේවායේ ගැටළු තියෙනවා.ඒවා නිවැරදි කර ගන්න ඕනා.මම මේ සභාවට ඇවිත් දාපු මුල්ම යෝජනාව තමයි වෘත්තියවේදීන්ගේ හා විද්වතුන්ගෙන් යුත් කමිටුවක් දාලා අපි මේ සභාව කරගෙන යමු කියන එක.ඒ කිසි දෙයක් වුණේ නෑ.ඔබතුමාට කිසිදේක වාතර්‍ාවක් එන්නේ නෑ.අපි කොම්පෝස්ට් එකේ වෙලා තියෙන දේවල් පෙන්වලා දුන්නා.මේ රටේ විනාශයට 60%ක් වගකියන්න ඕනා රාජ්‍ය නිලධාරීන්.මේ රට විනාශ කරලා තියෙන්නේ වැඩියෙන්ම මේ රාජ්‍ය නිලධාරීන්.කායර්‍ාල කායර් සහයක ඉදලා ජනාධිපති ලේකම් දක්වාම මේ රට විනාශ කරලා තියෙන්නේ.මේ සභාවේ නිලධාරීන්ටත් ඒක පොදුයි.කවුරු තරහවුනත් මට කමක් නෑ.අපි කියන්නේ මේ රට හැදෙන්න ඕනා.රක්ෂණයට මේ දක්වා ලක්ෂ ගානක් ගෙව්වා.මේ කිසිම නිලධාරියෙක් ඔබතුමාට ඒක පෙන්වලා දුන්නේ නෑ.ඔබතුමා කිසි කෙනෙක් ආරක්ෂා කරන්න එපා.මේ සභාව මතුගම තියෙන්න ඕනා.මේ සැරෙත් ටිපර් එකක් සවරීස් කරන එකක් දාලා තියෙනවා.අපිට වගේ දෙගුණයක් වියදම ගිහිල්ලා

තියෙනවා.බිල් දාන්න පුළුවන් ඕනතරම්.මේවා සත්‍ය වියදම් ද කියලා තමයි සොයලා බලන්න ඕනේ.මේවා අභ්‍යන්තර විගණක හරි කවුරුහරි බලන්න ඕනේ.අපි පරිගණක,ටයර් සම්බන්ධව පෙන්වලා දුන්නා.මොනවද පෙන්වලා නොදුන්නේ?පොලේ ආදායම දෙගුණ කරලා දුන්නා.නමුත් කිසිදේකට ඔබතුමා පිලිවෙලක් හැදුවේ නෑ.මේ ආයතනය කවදාවත් ආදායම වැඩි කර ගත්තේ නෑ.ලැබුණ ආදායම රැක ගත්තෙත් නෑ. වියදම් පාලනය කරෙත් නෑ.ඒක තමයි මේ ආයතනයේ හැමදාම සිද්ධ වුණේ.ඔබතුමා මන්ත්‍රීවරු ගැන විශ්වාසය තිබ්බේ නෑ.මේ මන්ත්‍රීවරු ආවේ මේ සභාවට සේවයක් කරන්න.නමුත් ඔබතුමා ඒ අයගෙන් ප්‍රයෝජනයක් ගත්තේ නෑ.කොම්පෝස්ට් එකේ ඔබතුමාට සාධාරණ චිත්‍රයක් බලාගන්න පුළුවන් වෙයි.ඒ වගේම මම යෝජනා කරනවා මේ බෝඩ් සම්බන්ධවත් කමිටුවක් පත් කරලා අධ්‍යනය කරන්න කියලා.ඔබතුමා පාකර් එක ගැන මාස එකහමාරක් අධ්‍යනය කරා කිව්වා.අපිට කිව්වානම් අපි සතියෙන් හොයලා දෙනවා.මේ මන්ත්‍රීවරු ඔබතුමාගේ හතුරෝ නෙවෙයි.ඔබතුමාට උදව් කරන්න ඇවිත් තියෙන්නේ.ඒ නිසා කරුණාකරලා මේ මාස කීපයට හරි මේ සභාව නිවැරදිව හදා ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් දැන්වීම් පුවරු සම්බන්ධව සොයා බලා කටයුතු කිරීමට කමිටුවක් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිලූකා දශර්නී මහත්මිය විසින් එය ස්ථිර කරන ලදී.එම කමිටු සාමාජිකයින් පහත පරිදි වේ.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා මේකේ PRO දීමනාවක් දාලා තියෙනවා.අපි දැකලාවත් නෑ.අපි හිතුවේ මේ ඉන්න කෙනා විතරයි කියලා.මෙයාට ආදේශක පත්වීමක් දීලා තියෙනවා.මේවා දෙන ක්‍රමවේදය මොකක්ද?අපි දැනුවත් නෑ.මේකට සුදුසුකම් තියෙන අය කීප දෙනෙක් මේ සභාවෙම ඉන්නවා.අවුරුදු 10,12 ඉඳපු අය.සභාපතිතුමාට තියෙන චෝදනාව තමයි මේ පුද්ගලයාව මාස 3 ඇතුලත ස්ථිර කරේ නෑ කියලා ලේකම් මහත්තයාව අයින් කලා කියන එක.ඇත්තටම අපි දන්නේ නෑ ලේකම් මහත්තයා යනකම් මොකද වුණේ කියලා.දැන් මෙයාව ස්ථිර කරලා තියෙනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ගල්මත්තේ කායර්ාලයේ මගේ වැඩ ටික කරන්නේ ඒ PRO තමයි.ආදේශක පත්වීම් තියෙන්නේ.අපි ස්ථිර කරලා නෑ.ඕන වෙලාවක අයින් කරන්න පුළුවන්.ස්ථිර කරන්න දෙපාතර්මේන්තු අවසරය ඕනා.අනෙක් පත්වීම් මන්ත්‍රීවරුන්ට එක එක දුන්නා.ඒවා දාලා ගිය අය ඉන්නවා.ඔයගොල්ලන්ටත් දුන්නා.විපක්ෂයට දෙන්න බැරි වුණ එක තමයි වැරුද්ද.සභාපතිට පුළුවන් එහෙම පත්වීමක් දෙන්න.කවුද මේ බොරුව කිව්වේ ස්ථිර කරා කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

වසන්තව අයින් කරන්න හේතුව මොකක්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

වසන්තව අයින් කරන්න හේතුව එයා වැටුප් දෙකක් ගන්නවා.එයා විතරක් නෙවෙයි PRO වත් මේ මාසේ ඉඳලා අයින් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ලේකම් මිස් කියන්න මොන පදනමකින්ද මේ ආදේශක පත්වීම දුන්නේ.

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය.

සභාපතිතුමාගේ නියෝගය අනුව තමයි දුන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ආදේශක පුරප්පාඩුවක් ආවම සභාපතිට බලය තියෙනවා දෙන්න.ඔයාගේ යටදොල පත්වීම් දුන්නෙත් එහෙම තමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාවේ අවුරුදු ගානක් ඉඳපු අය ඉන්නවා.ඒ මිනිස්සුන්ට වයස පැන්නම මේ පත්වීම ගහන්න පුළුවන්ද?මේකට ආපු හැම සභාපති කෙනෙක්ම කරේ ඔය දේ තමයි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒ අයට වයස වැඩියි.ස්ථිර පත්වීමකට යන්න බෑ.ආදේශක පත්වීම්,කොන්ත්‍රාත් පත්වීම්,ව්‍යාපෘති පත්වීම් දෙන්නේ සභාපති.වසන්ත කියන්නේ හමුදා සේවයේ එක්කෙනෙක්.මම යනකොට මේවා අයින් කරලා යන්න ඕනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා

සභාපතිතුමා ඔය වසන්තගේ ප්‍රශ්නේ ගැන ආපු අවුරුද්දෙම මම කථා කරා.ඒ විස්තර මං ළඟ තියෙනවා.එදා ඔය මන්ත්‍රීවරු 17 දෙනා සභාව ආරක්ෂා කරගන්න හින්දා එදා අපිට ඉඩ දුන්නේ නෑ.නමුත් අපි එදා කියපුවා අද හරි ගිහින් තියෙනවා.සතුටු වෙනවා වගේම ස්තුතිවන්ත වෙනවා අදවත් ඒ අඩුපාඩුව පෙනුන එක ගැන.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

ඇත්තටම මම මේ ගැන කථා නොකර ඉන්න හිටියේ.කථා කරන්න හේතුව තමයි මේ අපේ ස්වාමින් වහන්සේගේ කොට්ඨාශයේ දරුවෙක්.පිළිකා රෝගය හැදිලා ඉඳියේ.ඒ දරුවගේ අම්මා කිව්වා රැකියාවට ගන්න කියලා.මම ලේකම් කෙනෙක් ගත්තේ නෑ.මම අරගෙන රු2000 වැටුප මගේ අතින් දුන්නා.නමුත් ඒ වෙලාවේ තිබුණ පක්ෂෙට මම උදව් කරලාත් ඒ දරුවව මෙතනින් අයින් කරා.මම ඉල්ලීමක් කරා පුස්තකාලෙට දාන්න කියලා .ඒ දැම්මෙත් නෑ.ගෙදර ඇරියා. මම ඕවාට දාලත් නෑ.ස්ථිර කරලත් නෑ. ඒක නිසා මම ඕවට අයිති නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මම ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අර ජේ.සී.බී එකේ රු 42000ක මුදල ගෙවලා තමයි ට්‍රාන්ස්මිෂන් පද්ධතියේ කොටස් ගෙන්නන්නේ.

කාරක සභා අවස්ථාව අවසන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

ගිය සභා වාරයේ කොම්පෝස්ට් අංගනයේ සිදුවෙලා තියෙන අක්‍රමිකතා පිළිබඳව සොයන්න මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබුවා.ඒකෙදී අපි විසින් සාදන ලද වාතර්ාව සුරේශ් මන්ත්‍රීතුමා සභාවට ඉදිරිපත් කරයි.අපි සභාවට,කොම්පෝස්ට් අංගනයට කීප වරක් ඇවිත් තමයි මේ කටයුත්ත කරේ.අපේ කමිටුවේ ලේකම්තුමා වාතර්ාව ඉදිරිපත් කිරීමෙන් පසු මම අදහස් දැක්වීම කරන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් දශර්න ජයසේකර මහතා

කොම්පෝස්ට් අංගනයේ අක්‍රමිකතා සම්බන්ධයෙන් කල පරීක්ෂණයේ වාතර්ාව සභාගත කරන ලදී.

ඇත්තටම අපි 2009 ඉඳලා තොරතුරු මේ සඳහා ඉල්ලුවා.මේ තොරතුරු ගැන අපි ඇත්තටම කණගාටු වෙනවා.මේ තොරතුරු ඇත්තටම සභාව සතු ඒවාද නැත්නම් හිතාමතා කමිටුව නොමඟ යැවීම සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු කියන එක ගැන ගැටළුවක් තියෙනවා.තොරතුරුවල කිසිම ගැලපීමක් නෑ.මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ටත් පිටපත් ලබා දීලා තියෙනවා.කොම්පෝස්ට් නිෂ්පාදනය,අලෙවිය,නොමිලේ ලබා දීම්,සමහර වෂර්වල කොම්පෝස්ට් අතිරික්ත තිබිලා තියෙනවා.ඒවට වුණ දෙයක් නෑ.මන්ත්‍රීවරු මේවායේ තොරතුරු බලන්න.මේකේ වුණ වංචා සම්බන්ධව අපි ළඟ තව තොරතුරු තියෙනවා. මේ සම්බන්ධව අදහස් දැක්වීමට සියලු මන්ත්‍රීවරුන්ට අවස්ථාව තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

අපි ලේකම්තුමියගෙන් ලිඛිතව කල ඉල්ලීමක් කලා.ඊට අනුව තමයි සභාවේ තියෙන තොරතුරු එක්ක අපිට වාතර්ාවක් ලබා දුන්නේ. මම සභාපතිතුමාටත් මේ ගැන කිව්වා.ප්‍රාථමික මට්ටමේ තොරතුරු තමයි මේකේ තියෙන්නේ.ඒ ගැන ඇත්තටම කණගාටු වෙනවා.මේ දීලා තියෙන වාතර්ාවේ එකතුව පවා වැරදියි.ඒ නිසා මේ වාතර්ාව අපිට පිලිගන්න බෑ.අපි ඊට අනුව ලේඛණයක් හදා ගත්තා.ඒ ලේඛණයට අනුව කිසිසේත්ම සෑහීමකට පත්වෙන්න බෑ.වාතර්ාවල දෝෂයක්ද? තොරතුරු වල අඩුපාඩුවක්ද?මොකක්ද කියන්න දන්නේ නෑ.අපිට දීපු වගකීම අපි ඉටු කරා.කොහොම නමුත් අවුල් සහගත තත්වයක් තමයි තියෙන්නේ.අපිට සංජීව මහත්තයාව මේ සඳහා ලේකම්තුමිය ලබා දුන්නා.අපි කමිටුවෙන් තීරණය කරා තව නිලධාරියෙක් දෙන්න කියලා.ඒ අනුව උපාධිධාරී නිලධාරීතුමෙක් අපිට ලබා දුන්නා. ඒ අයත් එක්ක මේ මාසේ ඇතුලත යම් ප්‍රවණතාවයක් ඇති කරමින් වෙනස්කම් කීපයක් ඇති කරලා තියෙනවා. කිසිම මුදල් වෙන් කිරීමකින් තොරව.අපි බලාපොරොත්තු වෙනවා මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ අවසරය තියෙනවානම් මේ අක්‍රමිකතා පිළිබඳ සොයා බලමින් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාගර් ඔබතුමන්ලාගේ යෝජනා ස්ථිරත්වය ඇතුව ඉදිරියට අරගෙන යන්න.අපිට දීලා තියෙන වගකීම අනුව ඉදිරියට ගතයුතු ක්‍රියාමාගර් පිළිබඳ අපි කමිටුව විසින් දැනටමත් තීරණයක් අරගෙන තියෙනවා.ඒ වගේම අපේ අතුල මන්ත්‍රීතුමාට තමයි මේකේ ලොකුම ගැටළුව තියෙන්නේ.එතුමාගේ කොට්ඨාශය තුල.එතනට ගියාම අපිටත් ඒක තේරුණා.ඒ සේවකයොත් දැඩි දුෂ්කරතාවයෙන් තමයි එතන සේවය කරන්නේ.ඒවා නිවැරදි කරලා කටයුතු කරන්න අපි යෝජනාවලියක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මෙහිදී සිදු වූයේ කුමක්ද යන්න පිළිබඳ විමශර්නයක් අවශ්‍ය වෙලා තියෙනවා.ඒ සඳහා ඉදිරි කටයුතු කරගෙන යන්න කියලා යෝජනා කරමින් අනෙක් මන්ත්‍රීවරුන්ට අවස්තාව ලබා දෙනවා.ඒ වගේම අපිව මේ කමිටුවට පත් කරපු කාන්ත මන්ත්‍රීතුමා හා සුරේශ් මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා.ඒ වගේම මේ සඳහා අවශ්‍ය කරන වැඩපිලිවෙල ඉදිරියේදී අපි ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා,මුලින්ම මම උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධව කමිටුවක් පත් කිරීමට කටයුතු කිරීම ගැන.අපිට දීලා තියෙන වාතර්ාව සත්‍ය වාතර්ාවක් නෙවෙයි.ඒ වාතර්ාවවත් මේ සභාවට හරියට හදා ගන්න බෑ.මේකේ දාලා තියෙනවා කොම්පෝස්ට් අලෙවියේ ධාරිතාවය කියලා එකක් දාලා තියෙනවා.මේක ගත්තේ කොහොමද කියන එකයි ගැටළුව.කොම්පෝස්ට් නිෂ්පාදනය,අලෙවිය,නොමිලේ දීපුවා එක්ක බැලුවාම මේ ධාරිතාවය කෙහොම ගත්තාද කියලා හිතාගන්න බෑ.අපි මුලින්ම කොම්පෝස්ට් අංගනයට ගියාම දැක්කේ ඉතාම අවිධිමත් වැඩපිලිවෙලක්.කිසිම සටහනක් නෑ.ඒ වගේම කිසිම සටහනක් නැතුව ඩාටන්ෆිල්ඩ් එකට කොම්පෝස්ට් දීලා තියෙනවා.ඒ අයගේ ගිවිසුමේ තියෙන්නේ දින 07ක් ඇතුලත ගෙවනවා කියලා.නමුත් මාස 08ක කාලසීමාව තුල මේ මුදල් ලබා ගෙන නෑ.එතනම අක්‍රමිකතාවයක් වෙලා තියෙනවා. අපි දැනුවත් වුණ ආකාරයට කොම්පෝස්ට් එම ආයතනයට සපයන්නේ ලේකම් මිස්ගේ පුතා.සභ ාවේ වාහන වල තමයි ගෙනිහින් තියෙන්නේ.විවිධ ප්‍රමාණ ගෙනිහින් තියෙනවා.නමුත් අපිට ඒවා අල්ලන්න බෑ.සේවකයෝ දුන්න තොරතුරු විතරයි.මේක

තනිකරම හොරකම තමයි වෙලා තියෙන්නේ.මේක මෙතනින් එහාට ගිහිල්ලා පරීක්ෂණයක් කරන්න ඕනා.සභාපතිතුමාගේ සහයෝගය ලැබෙයිද කියන්න දන්නේ නෑ.විගනණයක් කරනවා නම් ඊට අදාල තොරතුරු අපි ලඟ තියෙනවා.එතන වැඩ කරන කෙනා අවුරුද්දෙම පොත එක දවසේ ලියලා තියෙන්නේ.අපි ළඟ සියලු දේ ඡායා පිටපත් කරලා තියෙනවා.මේක නිවැරදි කරන්න අපි ඕනෑම තැනකට මේ කමිටුව හරහා තොරතුරු දෙන්න ලෑස්තියි.ඒ වගේම සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මේ සඳහා බලාපොරොත්තු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා
කොම්පෝස්ට් එකේ ඒ දවස් වල පිරිලා තියෙන කොට මම ඇවිත් කිව්වාම නාකන්දල මන්ත්‍රීතුමා එතුමාගේ ඉඩමට කුණු ටික දැම්මා. ඒ වෙලාවේ ඒක ලොකු දෙයක් වුණා. ඇත්තටම අද තියෙන ප්‍රශ්න නිසා මේකට එන කුණු ප්‍රමාණය අඩුයි.මේකට ගේන ඒවායින් රොඩු ඉවත් කරාම පොහොර වෙන ප්‍රමාණය අඩු වෙනවා.කොම්පෝස්ට් අංගනයේ ඔබතුමාලා කියන විධියට සංඛ්‍යාලේඛන අනුව මොනවා හෝ ගැටළු ඇති නෑ කියන්නේ නෑ.මේ කොම්පෝස්ට් අංගනය විධිමත් කරන්න මට කරන්න පුළුවන් දේ මම කරා.නමුත් මම විතරයි මේකේ හිටියේ.ඒක නිසා ඒක අසාර්ථක වෙන්න පුළුවන්.මේක කරන්න ඕනේ සභාවෙන්.මම කරන්න ඕන දේත් කිව්වා.මට කරන්න යන්න බෑ.දැන් මේ කමිටුවෙන් මේක කරන්න පුළුවන්.මේ ගැන මටත් ලොකු උනන්දුවක් තිබුණා.මොකද මගේ කොට්ඨාශයේ නිසා. මේකේ ඉන්න මිනිස්සුන්ට කෑම කන්න විදියක් නැති වුනාම මම ලේකම් මිස්ට කිව්වා.අංගනයේ ඉන්න කම්කරුවන්ට මම යෝජනා දාලා 50% ක් කරන්න ඕන දේ කරලා දුන්නා.ඒ ගැන මම සතුටු වෙනවා. කමිටුවේ නැති වුනත් මට උදව් කරන්න පුළුවන්.ඒ නිසා මේකේ තියෙන වැරදි අඩුපාඩු සෙවීම සම්බන්ධයෙන් මම මගේ උපරිම සහයෝගය ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
මුලින්ම කමිටුව පත් කරන්න අවසර දුන්න උපසභාපතිතුමාට ස්තුතිය පුද කරනවා.ඒ වගේම කාන්ත මන්ත්‍රීතුමාටත් ස්තුතිය පුද කරනවා.අපි කොම්පෝස්ට් අංගනයට ගියා. එතන ඇත්තටම අවිධිමත්.අපි සේවකයන්ගෙන් ඇහුවා වැඩ කරගෙන යන්න සභාවෙන් ලැබෙන සහයෝගය කොහොමද කියලා.අත්වලට ග්ලවුස් නෑ.ඉල්ලීම් කරලා තියෙන්නේ ලැබුණේ නෑ කියලා කිව්වා.මේ සභාවට අවුරුදු ගානකට බල්බ් ගෙනත් තියා ගන්න පුළුවන්නම් ඇයි ඒ සේවකයන්ට අවශ්‍ය ඒවා ගෙනත් තියාගන්න බැරි. එතන ඉඳපු අය කිව්වා ඇඳුම් මාරු කර ගන්න තැනක් හදා දුන්නා කියලා. ඒකට ලේකම්තුමියට ස්තුතිවන්ත වෙනවා .දැන් අතුල මන්ත්‍රීතුමා කිව්වාම තමයි ඒක දැන ගත්තේ එතුමාගේ යෝජනාවක් කියලා.සභාපතිතුමා එන්නේවත් නෑ කියලා ඒ මිනිස්සු කිව්වා.එතන හදපු ගොඩනැගිල්ල විවෘත කර ගන්න බැරුව හිටියා කිව්වා සභාපතිතුමාගේ බලපෑම මත. ඒ වගේම අපි මුදල් ගෙවලා කසල ගන්න ආයතන ගෙනැල්ලා දැනුවත් කිරීමක් කරා කසළ වෙන් කරලා දෙන්න කියලා.ඒ අය එකඟතාවය පල කරා.ඒ වගේම අපි දැනුවත් කිරීමක් කරා පවතින තත්වය යටතේ කසළ ගාස්තු වැඩි කිරීමක් කරන්න වෙයි කියලා.ඒ අය ඒකටත් එකඟ වුණා.ඒ වගේම කොම්පෝස්ට් එකේ ඉන්න අයට නිල ඇඳුම් අරන් දීලා

නෑ.මේවා සේවකයෝ අපිට කිව්වේ.මේවාට සභාව මුදල් වියදම් කරන්න ඕනේ නෑ.ඉල්ලීමක් කරාම ලබා ගන්න පුළුවන් ආයතන ඕනතරම් තියෙනවා.

ඒ වගේම මේකේ ආදායම් තිබුණට ගිය දිහාවක් නෑ.වාෂරීකව මේවා ගිණුම්ගත වීමක් වෙන්න ඕනානේ.මේවා ඇත්තටම අවිධිමත් විධියට ගිහින් තියෙන්නේ.මම සභාපතිතුමාට තමයි මේ සම්බන්ධව චෝදනා කරන්නේ.සභාපතිතුමා මේකට සෘජුව වගකියන්න ඕනේ.ආදායම නැති වෙනකොට බලන්න ඕනා.අපි මේකේ වාතර්ාවක් ඉල්ලුවා.ඒ කිසි දෙයක් හරියට දුන්නේ නෑ.අපි ඇහුවා නොමිලේ දුන්නේ කාටද කියලා.ඒවායේ ලේඛණ නෑ.නොමිලේ දීලා කියලා තියෙනවා.කාටද කුමක් සඳහාද දුන්නේ කියලා අපි ඉල්ලුවා.ඒ විස්තර මුකුත් නෑ.අපි කියන්නේ මේවා රාජ්‍ය ආයතන.මේවාට විධිමත් ලේඛණ තියා ගන්න ඕනා.ලේකම්තුමියගේ ගණුදෙණුව සම්බන්ධව ලේකම්තුමියට චෝදනාව එල්ල වෙන්නේ ඔබතුමිය රබර් පයෙර්ෂණ ආයතනයට ගිය අවුරුද්දේ ඔක්තෝබර් දීලා තියෙනවා කොම්පෝස්ට් කිලෝ 5000ක්.මේ අවුරුද්දේ කිලෝ 3000ක් දීලා තියෙනවා.නමුත් ඒ අදාල වෂර්වල අදාල ආදායම ගිණුම් ගත වෙලා නෑ.ඒකයි ඔබතුමියට තියෙන චෝදනාව.ඒ වගේම අතුල මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා ඔබතුමාගේ මැදිහත් වීමෙන් කොම්පෝස්ට් අංගනයට විවේකාගාරයක් ලබා දීම සම්බන්ධව.ඒ වගේම ලේකම්තුමිය ලොකු සහයෝගයක් දෙන බවත් කොම්පෝස්ට් එකේ සේවකයන් කිව්වා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා
ඇත්තටම අපිට මේ වාතර්ාව බැලුවාම තේරෙනවා වාචික ප්‍රකාශන වලින් තමයි සියලු දේ දීලා තියෙන්නේ.කිසිම විධිමත් භාවයක් නෑ.ඒකෙන් තේරෙන්නේ මේ දක්වා හිටපු කිසිම සභාපති ,ලේකම් කෙනෙක්  මේ ගැන සොයා බැලීමක් කරලා නෑ කියලා.ඇත්තටම කණගාටුයි.අද රටේ කොම්පෝස්ට් වලට මේ තරම් ඉල්ලුමක් තියෙනවා.මේ සඳහා නිසි වැඩ පිළිවෙලක් යෙදුවානම් සභාවට ආදායමක් ලබා ගන්න තිබුණා.අපි ඉදිරියට මේ සභාවේ නැති වුනත් අපේ දරුවන්ට මේවා තියෙන්න ඕනා. මේ විදියට ගියොත් ඉස්සරහට මන්ත්‍රී කෙනෙක්ට පාරේවත් යන්න බැරි වෙනවා.එහෙම තත්වයක් තමයි ඇති වෙලා තියෙන්නේ.නමුත් මේ සියල්ලට වගකියන්න ඕනේ රාජ්‍ය නිලධාරීන්.ඒක නිසා අපි කියන්නේ මේවාට නිසි ක්‍රමවේදයක් තියෙන්න ඕනා.දැන් වැඩපිළිවෙලක් හැදිලා තියෙන වෙලාවේ ඔබතුමා නායකත්වය ගන්න.අපි ඔබතුමා එකක් ඉන්නවා සහයෝගය ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත ද සිල්වා මහතා
ගරු සභාපතිතුමනි,මම මේ වාතර්ාවෙන් පටන් ගන්නම්.ඉස්සර මේ වාතර්ාව හැම මන්ත්‍රී කෙනෙක්ගේම අදහස් වලින් පිරිලා තිබුණා.යෝජනා තිබුණා.අද මේ සභාවේ වාතර්ාව බෙදන්නේ ඊයේ දවසේ.කසුන් මන්ත්‍රීතුමාට මේ වෙලාවේ ස්තුතිවන්ත වෙන්න ඕනා.ලේකම්තුමිය පත් වුණ වෙලාවේ එතුමා කිව්වා ඔබතුමිය මේ සභාවට ගැලපෙන්නේ නෑ කියලා.ඒ ක කියන්නම ඕනේ.අද මේ වෙනකොට අපිට පරේ ගිහින් ජනතාව එක්ක ගැටිලා මිනිස්සුන්ගේ අවශ්‍යතා ටික ඉටු කරන්න බැරි  වුණ සභාවක් කියලා මම එදාත් කිව්වා.ඒ වගේම අද මේ වෙනකොට දැන්වීම් පුවරුවලින් හොරකම් වෙලා ,කොම්පෝස්ට් එකේ හොරකම් වෙලා. ඒ විතරක් නෙවෙයි කඩන බිල්පතෙන් පවා

හොරකම් වෙලා තියෙනවා.එතකොට සභාපතිතුමා දෙවරක් මේකේ සභාපති වෙලා තියෙනවා.හොඳ පරිනත දැනුමක් තියෙනවා.ඒ වගේම කපටිකමත් තියෙනවා.ඒක නිසා මන්ත්‍රීවරුන්ගේ තිබුන සබඳතාවය ඔබතුමා බිඳ ගත්තා.එක යෝජනාවක් සභාවට දාන්නේ නැති තත්වයට පත්වුණා. අද න්‍යාය පත්‍රයට යෝජනා දාන්නේ නෑ.මීට වඩා මිනිස්සුන්ට ප්‍රශ්න තියෙනවා සභාපතිතුමා.ඒ අවශ්‍යතා ඉටු කරගන්න මිනිස්සු බලන් ඉන්නවා.ඒ කිසිවක් ඔබතුමා ඉටු කරේ නෑ.මේ සියලු මන්ත්‍රීවරු මෙතෙන්ට ආවේ මිනිස්සුන්ට සේවයක් කරන්න.නමුත් මිනිස්සුන්ට සේවය කරන්න තියෙන ආදායම හොරා කනවානම් ඒක හොඳක් වෙන දෙයක් නෙවෙයි.මේ රාජ්‍ය සේවයට ඔබ එන්නේ ප්‍රතිඥාවක් දීලා.මේ රජයට ජනතාවට ඔබ වගකියන්න ඕනේ.ඒ නිසා ලේකම්තුමිය අපි දැකලා තියෙනවා ලයිට් වල වගකීම් කාලය ඉවර වෙනතුරු ඒවා කණුවල.ඒ නිසා මේවා යහමගට ගන්න කවදාවත් ක්‍රියාකරේ නෑ. ඒ නිසා ඔබතුමාගේ පරිනතභාවය ඔබතුමා පත් කරපු නායකයින්ට කියන්න ඕනේ.අපි එදත් විරුද්ධ වුණා ඔබතුමාට.ඔබතුමා කිසිම දක්ෂතාවයක් නැති බව අද මේ සභාවේ ඔප්පු කරා. ඒ වගේම මේ රාජ්‍ය නිලධාරියෙක් වශයෙන් ලේකම්තුමියට ශක්තියක් නෑ මේ සභාව තව දුරටත් පාලනය කරන්න.මේ ඉන්න නිලධාරීන්ට නායකත්වය දෙන්න මේ ලේකම්තුමියට බෑ.ඒ නිසා ලේකම් වහාම ඉල්ලා අස් වෙන්න ඕනේ.තමන්ගේ පිරිස මේකට දාලා රස්සාවල් දීලා හොරකම් කරලා අයථා ලෙස මේ සභාව කරගෙන යනවානම්

ඒකට අනිවාර්යෙන් ලේකම්තුමිය වග කියන්න ඕනා.ඒ නිසා ලේකම් ඉල්ලා අස්වෙන්න ඕනේ.අපි ඉල්ලා සිටින්නේ සභාපතිවරයාත් ඉල්ලා අස්වෙන්න ඕනේ.අපේ ගම්වල තියෙන අවශ්‍යතා ටික ඉෂ්ඨ වෙන්නේ නැතිනම් මේ සභාවේ ක්‍රියාකාරකම් ටික වෙන්නේ නැතිනම් අනාගත සැලසුම් ක්‍රියාත්මක කරලා නැතිනම් මේ දුවර්ල පාලනයෙන් ඔබතුමා බැහැලා යන්න ඕනා. මම ඉදිරියට දේශපාලනය කරන්නේ නෑ.ඒ වගේම කිසිම දේකට නායකත්වයක් ගන්නේ නෑ මින් ඉදිරියට.හේතුව මෙවැනි මිනිස්සු,මෙවැනි රාජ්‍ය නිලධාරීන් එක්ක ගැටිලා අවංක මිනිස්සුන්ට දේශපාලනය කරන්න අද රට ඉතුරු කරේ නෑ. ඒ නිසා මේ තරුණ පිරිසට කියලා දෙන්න මේක අවංකව කරන්න.අද ඔබතුමාට අවංකව මෙතනින් බැහැලා යන්න බැහැ.මේ හැම දේකටම ඔබතුමා,ලේකම්තුමිය හවුල් වෙලා තියෙනවා.ඒ නිසා හොරකම් කරපු පිරිසත් එක්ක ලේකම් ඉල්ලා අස් වෙන්න ඕනා. අනිත් එක තමයි අපේ ප්‍රදේශයේ පුස්තකාලය.මම යෝජනා ගානක් දැම්මා.ඒක අබලන් වෙලා තියෙන්නේ.ඒ නිසා ඒතරම් අපේ ගම්වලට කිසිම දෙයක් නොකරපු නායකයෙක් කියලා මම සභාපතිවරයාට ඇඟිල්ල දික් කරලා කියනවා. ඒ වගේම පලාත් සභා අරමුදල් වලින් සභාපතිවරයාගේ ගම් ප්‍රදේශවල සංවධර්නය වෙනවා.බැකෝ එක යනවා,ලයිට් ටික වැටෙනවා.පාරවල් ශුද්ධ කරනවා.මන්ත්‍රීවරුන්ට ගමට ගිහින් වැඩක් කරන්න ඔබතුමා කිසි දෙයක් ඉෂ්ඨ කරේ නෑ කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින් සභාපතිවරයා හා ලේකම් අනිවාර්යෙන් ඉල්ලා අස්විය යුතු බව මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා
මුලින්ම කොම්පෝස්ට් එක සම්බන්ධව සෙවීමට පත් කල කමිටුවට ස්තුතිය පුද කරනවා.ඒ කමිටුවේ සාමාජිකයන් සියල්ලම කිව්වේ දීපු වාතර්ාව පිළ ගන්න බෑ

කියලා.මේ එකකටවත් ගැලවෙන්නේ නැති මිල ගනන් තමයි දාලා තියෙන්නේ.මේ සභාව පත් වුණ දවස්වල පොලේ විශාල වංචාවක් අල්ලලා දුන්නා.ආදායම වැඩි කරලා දුන්නා.ඒ කරපු නිලධාරීන්ට කරපු නීතිමය කටයුත්තක් කරේ නෑ මේ සභාවෙන්.අරගලයෙන් ඉල්ලන්නේ කැබිනට් මණ්ඩලයේ අය අධීක්ෂණයට අරගලයේ අය දාන්න කියලා.නමුත් මෙතන වෙලා තියෙන්නේ නිලධාරීන්ගේ හොරකම් අල්ලන්න මන්ත්‍රීවරුන්ව දාන්න.මේකයි ඇත්ත තත්වය.අද බෝඩ් සම්බන්ධව තජර්නය කරන ඒ සේවකයාගේ තාවකාලිකව වැඩ තහනම් කරලා හෝ ඒ සම්බන්ධව කටයුතු කරන්න බැරි වෙලා තියෙනවා.අනිත් සියලු නිලධාරීන් මෙතනට ගෙන්වූවා.නමුත් ඔහුව ගෙන්නුවේ නෑ.

ඇයි ඒ?පරිපාලනය පාලනය කරන්න බලයක් ඔය කියන කෙනාට තියෙනවද කියන්න මම දන්නේ නෑ.හැබැයි මන්ත්‍රීවරුන්ව නම් එහෙම පාලනය කරන්න බැහැ.ඒ නිසා මේවට ගන්න ඕන ක්‍රියාමාගර් ගන්න.දේශපාලනයේ හොරකම් කරපු අය ඉන්නවා.නැහැයි කියන්න බැහැ.නමුත් අද අපිට ඉල්ලන්න වෙලා තියෙන්නේ මේ ලේකම්ලාගේ ඉඳලා සියලු පරිපාලන නිලධාරීන් පිලිබඳ විමශර්නයක් කරන්න කියලා.ඒ නිසා මේ පිලිබඳ විමශර්නයක් කල හැකි ස්ථානයකට භාර දෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා

ගරු සභාපතිතුමනි,ප්‍රථමයෙන් කියන්න ඕනේ මන්ත්‍රීවරුන්ගෙන් සැඳුම්ලත් කණ්ඩායම කොම්පෝස්ට් අංගනයේ කරන ලද සමීක්ෂණයේ වාතර්ාව බැලුවාම මම ඇත්තටම කණගාටු වෙනවා. මට හරි ප්‍රශ්නයක් මේක ඇයි මේ තරම් නොමිලේ දෙන්නේ කියලා. මම කොම්පෝස්ට් කොට්ට **50**ක් ගෙනිච්චා මුදල් ගෙවලා.කිලෝග්රෑම් **61485**ක් නොමිලේ දීලා තියෙනවා.බලන්න කොයි තරම් අපරාධයක්ද කියලා.විකුණලා තියෙන්නේ ඊට අඩු ප්‍රමාණයක්.මේක තේරුමක් නැති වැඩක්නේ. මේකට යම් පිරිවැයක් වැය වෙනවානේ.මම යෝජනා කරනවා අද ඉඳන් මේ කොම්පෝස්ට් නොමිලේ දෙන එක නතර කරන්න කියලා.ඒ වෙනුවට සභාවේ මන්ත්‍රී කෙනෙක්ට,සේවකයෙක්ට,යම් සමිතියකට දෙනවානම් සහන මිලකට ලබා දෙන්න කටයුතු කරන්න.නොමිලේ දීලා ආදායම හොයලා වැඩක් නෑ.ඒක නිසා මේ නොමිලේ දෙන එක වහාම නතර කරලා සුභසාධන කටයුතු වලට සහන මිලට ලබා දෙන්න කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
ගරු සභාපතිතතුමනි,අද වෙනකොට තියෙන මේ කටවුට් මාෆියාව සහ කොම්පෝස්ට් අංගනයේ මාෆියාව පිළිබඳ දැඩි ලෙස කම්පාවට පත් වෙනවා.මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු විදියට මේ වගේ කූට උපක්‍රම මගින් සභාවේ ගරුත්වය නැති කරන තැනට මේ නිලධාරීන් පත් වුනේ ඇයි කියන එක ගැටළුවට කාරණාවක්.ගරු ලේකම්තුමියනි,මේ ඩාටර්න්ෆීල්ඩ් එකට පොහොර ලබා දෙන්න අනුමැතිය දුන්නේ කවුද ?එහෙම දුන්නත් ඒවා වෂර් අවසානයේ ගිණුම්ගත වීමක් වෙන්න ඕනා.නමුත් ඒ කිසිම දෙයක් වෙලා නෑ.ඒ වගේම මේ මහ සභාවේ ඔබතුමන්ලා ඔබතුමියන්ලා කරන ප්‍රකාශ

ගැලපෙන්නේ නෑ.ඔබතුමිය ගිය සභාවේ කිව්වා කටවුට් වලට වසර තුනක් යනකන් මුදල් අය කර ගත්තේ නෑ කියලා.නමුත් ආදායම් පරීක්ෂක මහත්තයා කියනවා 2019 ඉඳන් මුදල් ගත්තා කියලා.එතකොට අය කරන්න එපා කිව්වේ කවුද කියලා තීරණයක් නෑ.අපි සහභාගී වුණ කමිටුවේ එහෙම අය කරන්න එපා කියලා අපි අත්සන් කරලා නෑ.ඒ වගේම ඒකේ කථා වුණ දේවල් ඉෂ්ඨ වෙලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා මෙන්න මේ විදියට තමයි ඩාටර්න්ෆීල්ඩ් එකෙන් දීලා තියෙන්නේ.මට දැන් මේක ලැබුණේ.එයාලාගේ ඉල්ලීම් ලිපිය අනුව කොම්පෝස්ට් මිලදී ගත් දිනයේ සිට සතියක කාලයක් ඇතුලත මුදල් ගෙවීම් කල හැකි බව දන්වලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්දි තිරිමාන්න මිය
මම හිතන්නේ එවැනි ඉල්ලීම් ලැබුණාම මේ සභාවේ මන්ත්‍රීවරු දැනුවත් වෙලා හිටියා නම් අද ඔබතුමියට මේ චෝදනාව නෑ.ඒක නිසා අද උත්තරයක් නැති වෙලා තියෙනවා.ඔබතුමියන්ලාට වෙනත් රාජකාරී ස්ථානයකට ස්ථාන මාරු වෙලා යන්න පුළුවන්.නමුත් අපි ගමට යන්න ඕනා.මම වගකිවයුතු ග්‍රාම සේවා කොට්ඨාශ හතරක් තියෙනවා.එතකොට මිනිස්සු බලනවා අපිත් ඇවිත් කරන්නේ හොරුන්ව පෝෂණය කරන එකද කියලා.2021 මමත් මේ කොම්පෝස්ට් සම්බන්ධව කථා කරා.මම ඉල්ලුවා බෝපිටිය මදාරා ගෙවිළියන්ගේ සමිතියට කොම්පෝස්ට් බෑග් 30ක් සහ පැරකුම් ගොවි සමිතියට ගොවි මහතුන්ට ලබා දෙන්න. මට ඒ වෙලාවේ පොහොර නෑ කියලා 15යි දුන්නේ.අපිට ඒ සහනය ලැබුණේ නෑ. අපි ඒවා ලිඛිතව අරගෙන තියෙන්නේ.වංචා සහගතව කිසිම දෙයක් අරගෙන නෑ.ඒ වගේම සභාපතිතුමා ඔබතුමා අරගෙන බලන්න මේ අවුරුදු හතරට අපි දාපු යෝජනාවලින් එකක් හෝ දෙකක් ඉටු කරන්න ඇති.පසුගිය කාලේ වෙනකොට එකම යෝජනාවක්වත් දැම්මේ නෑ.අද වෙනකොට රටේ ජනාධිපතිතුමාට,අගමැතිතුමාට හා පාලර්මේන්තු මන්ත්‍රීවරුන්ට වුණ දේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට වුණේ ආණ්ඩුව නිසා නෙවෙයි,සභාවේ ක්‍රියාකාරකම් නිසා.අපි මීට වඩා දෙයක් ගමට අරගෙන ගිහින් තිබුණානම් රටේ මොන ප්‍රශ්න ආවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ආරක්ෂා කරන්න ගමේ මිනිස්සු බැඳිලා ඉන්නවා.අද වෙනකොට මේක කූට සභාවක් වෙලා.මේවා මාධ්‍ය හරහා එලියට යන්න ඕනේ.එතකොට මිනිස්සු තේරුම් ගනියි මන්ත්‍රීවරයා කියන්නේ කවුද රාජ්‍ය නිලධාරියා කියන්නේ කවුද කියලා.ඉදිරියට අපි මේ සභාවට ආවත් නාවත් මේ සඳහා ඉදිරියේදී පත්වෙලා එන මන්ත්‍රීවරුන්ට මේකේ වැඩ කරන්න පුළුවන් වෙන විදියට මේ සභාව හදන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරව්ල සමිතවංශ හිමි

මේ දක්වා කතා කරපු කරුනුත් එක්ක බලනකොට අපිට ලොකු කණගාටුවක් තියෙනවා.ඒ මොකද මේ සභාව රැක ගන්න කටයුතු කරපු මන්ත්‍රීවරු අතර එක් මන්ත්‍රීවරයෙක් මම.නමුත් අපි ඒ කටයුතු කරේ මේ සභාවේ හොරුන්ව ආරක්ෂා කරන්න නෙවෙයි.අපි මේ සභාව,සභාවේ ගෞරවය,සභාපතිතුමා ආරක්ෂා කරන්න සියලු මන්ත්‍රීවරු කටයුතු කරා.මේ සභාව පෙරලෙන්න යනකොට,අයවැය පරදින්න යනකොට

අපේ ස්වාධීන මන්ත්‍රීවරු,ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරු පුදුම තරම් කැපකිරීම් කරා.මේ සභාව මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා පරදින්න තිබුණේ.ඒ තීන්දු ගත්තානම් අපි වෙනස්වුණා නම් අද බොහෝ දුරට සභාපතිතුමාත් මෙතන නෑ.අපිට සුරේශ් මන්ත්‍රීතුමාන්ලා කිව්වා.ඒවා පෙන්වලා දුන්නා.නමුත් අපි ඇහුවේ නෑ.මේ සභාව ආරක්ෂා කරන්න කටයුතු කරා.ඒ නිසා මෙවැනි තත්වයට පත්වෙලා තියෙනවානම් අපි අතිශයින් කණගාටුවට පත්වෙනවා.ඒ වගේම මම කලිනුත් කිව්වා වගේ මම නැවත දේශපාලනයට එන්නේ නෑ.මට ඒක නිසා ඕන මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්.ඒ වගේම රුවන්දි මන්ත්‍රීතුමිය කිව්වා එක කාරණයක්.මම ඒකට එකඟ වෙන්නේ නෑ.එතුමිය කිව්වා මිනිස්සුන්ට මීට වඩා යමක් කරානම් මිනිස්සු අපිව ආරක්ෂා කරනවා කියලා.අපි පුද්ගලිකව මොනතරම් කරාද?නමුත් අද මිනිස්සු සියලු දේශපාලඥයන් හොරු විදියට දාලා ගනන් ගන්නේ නැති තත්වයකට ඇවිල්ලා තියෙනවා.මේ සභාවේ 90%ක් සේවකයන්,නිලධාරීන් සමස්ත ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විවේචනය කරන තත්වයට පත්වෙලා තියෙනවා.මේ සභාවේ සේවය කරන සේවකයෝ තමයි කිව්වේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විගණනය කරන්න ඕනේ කියලා.අපි හොරකම් කරලා නෑ ,කොමිස් අරගෙන නෑ.මේ දීමනාව අරගෙන සේවය කරපු අපිව තමයි පහුගිය කාලේ හොරු බවට පත් කරේ.ඒකයි අපිට කලකිරීමක් තියෙනවා කියන්නේ.ඒ වගේම මේ කථා කරන කොට විශේෂයෙන් මතක් කරන්න ඕනේ.සභාපතිතුමා අපිට උදව් කරලා නෑ කියලා මම කියන්නේ නෑ.මේ කියන්නේ සභාපතිතුමා ආරක්ෂා කරන්නවත්, ලේකම්තුමිය ආරක්ෂා කරන්නවත්,සභාපතිතුමා නැවත ගේන්නවත් නෙවෙයි මේ කියන්නේ.අපි කිව්වාම අපිට උදව් කරලා තියෙනවා.මේ සභාවේ කොම්පෝස්ට් මමත් අරගෙන තියෙනවා.ඒ වගේම මීට පෙර ඉඳපු ලේකම්තුමා ඉන්න කොට මන්ත්‍රී කෙනෙක් විදියට සල්ලි දීලා කොම්පෝස්ට් අරගෙන තියෙනවා.ඊට පස්සේ කොරෝනා කාලේ අපිට කොම්පෝස්ට් ලැබුණා.නෑ කියන්නේ නෑ.ලයිට් පුළුවන් විදියට හැදුවා.වාහනයක් ඉල්ලුවානම් මට ඒ දේ ලේකම්තුමියත් සභාපතිතුමත් දීලා තියෙනවා.ඒ වගේම අනිත් මන්ත්‍රීවරුන්ටත් ඒ දේ ලැබෙන්න ඕනා.ඒ වුනත් එහෙම උපකාර කරා කියලා මේකේ හොරකම් කරලා තියෙනවානම් ඒවායින් අපිට ආරක්ෂා කරන්න බෑ.අපි ඒවාට විරුද්ධයි.අද මේ සභාවේ මන්ත්‍රීවරු කරපු විවේචන පිළිබඳව මම මීට පෙර සභාපතිතුමාට සහ ලේකම් මිස්ට කිව්වා.ඒ දේ මම දැක්කේ සභාවේ සේවය කරපු සිරිල් මහත්තයාගේ අභාවය වුණ වෙලාවේ, සභාවේ මන්ත්‍රීවරු අදහස් දැක්වුවා.මම ඒ වෙලාවේ කිව්වා ඒ මළ ගෙදරට ලේකම්තුමිය ආපු වෙලාවේ එතන හිටියා නිලධාරීන්,සභාවේ සුළු සේවකයින්.මම කියන්නේ නෑ නැගිටින්න ඕනේ කියලා.නමුත් එතුමියට ආසනයක් දුන්නේ නෑ. උපසභාපතිතුමා සාක්ෂි දරනවා ඇති.ඒක අපි දැක්කා.ඒ වගේම සභාපතිතුමා යම් කායර්යක් කරන්න ගියාම සභාපතිතුමාට සලකන්නේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
හැමෝම නෙවෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

ඒක තමයි මම මේ කියාගෙන එන්නේ.ඒක අපි දැක්කා.තාමත් සභාපතිතුමා ඒක තේරුම් අරගෙන නැති ඒකයි කණගාටුව.මම කියන්නේ නෑ සමස්ථය එහෙමයි කියලා.සමහර නිලධාරීන්,සේවකයින් ඇති.ඒ නිසා අපි කියපු දේවල් අහපු නැති එකේ ප්‍රතිඵල තමයි අපි අද දකින්නේ.ඒ නිසා අද රට අගාධයට වැටිලා තියෙනවා.මේ සභා තොරතුරු එලියට යනවා.හෙට වෙනකොට මාධ්‍යට යයි.මම මාධ්‍යයෙන් ඉල්ලා සිටිනවා හරි තොරතුරු දාන්න.මම මාධ්‍ය පිළිබඳවත් කණගාටු වෙනවා.මේ රට විනාශ කරපු එක කොටසක් තමයි මාධ්‍යය.මේ මාධ්‍යයේ යන්න ඕන ඒවා කසුන් මන්ත්‍රීතුමාලා කතා කරා සභාවේ.ඒවා ගියේ නෑ.වෙන ඒවා යන්නේ.මම යෝජනාවක් ගෙනාවා මේ සභාවේ දිවා ආහාරය නතර කරලා,දුරකථන දීමනාව නතර කරන්න රටේ තියෙන තත්වය මත.නමුත් ඒක පත්තරේ ගියේ වෙන විදියකට.යෝජනාව ගෙනාවේ මම.නමුත් ඒකේ දැම්මේ නෑ.සභාපතිතුමා යෝජනාව ගෙනල්ලා සම්මත කරා කියලා තමයි පත්තරේ ගියේ.ඒකටත් මිනිස්සු බැනලා තිබුණා වතුරවත් දෙන්න හොඳ නෑ කියලා.නමුත් අපි නියඟය තියෙන කොට දිවා රෑ බලන්නේ නැතුව අතින් වියදම් කරගෙන  තෙල් ගහපු මන්ත්‍රීවරු මේ ඉන්නේ.අපි එහෙමයි කරේ.එහෙම ගුණමකු ජාතියක් ඉන්නේ. ඒ නිසා මේ රටත්  අසික්කිතයි.රට අසික්කිත වෙන්නේ රටේ ඉන්න මිනිස්සු එක්ක. ඒ නිසා මේ මාධ්‍ය පිළිබඳවත්,සභාව පිළිබඳවත්,සභාවේ කටයුතු පිලිබඳවත් දැඩි කණගාටුව ප්‍රකාශ කරනවා.ඒ නිසා මින් ඉදිරියට අපි හොරු ආරක්ෂා කරන්නේ නෑ.සභාපතිතුමා,ලේකම්තුමිය ඔබතුමන්ලා ඍජු තීන්දු තීරණ ගන්න.එහෙම ගන්නවානම් මේ මන්ත්‍රීවරු 34 දෙනාව ඔබතුමන්ලා එක්ක ඉන්නවා.ඒ වගේම විශේෂයෙන් මතක් කරනවා රුවන්දි මන්ත්‍රීතුමියට වුණ සිද්ධිය සම්බන්ධයෙන් අතිශය කණගාටුව ප්‍රකාශ කරනවා.සියලු දෙනාව මෙතෙන්ට ගෙන්නුවා.මේ පුද්ගලයාව මෙතෙන්ට ගෙන්වන්න පුළුවන්කමක් මේ සභාපතිතුමා ඇතුළු නිලධාරී කිසි කෙනෙකුට තිබුණේ නෑ.අපි ඒ ගැන ලැජ්ජාවට පත්වෙනවා.මේ මන්ත්‍රීතුමියට වුණ දේ හෙට අනිත් මන්ත්‍රීවරුන්ට වෙන්න පුළුවන්.පුබුදු මන්ත්‍රීතුමාට,කසුන් මන්ත්‍රීතුමාට මේවගේ ප්‍රශ්න වුණා.අපි පක්ෂ විපක්ෂ බලන්නේ නැතුව ඒවාට එකට හිටියා.අපි මෙතනින් යනකොට හොරකම් නොකරපු වැඩක් කරපු කෙනෙක් විදියට යන්න ඕනේ.ඒ නිසා ඒ ගැන කණගාටු වෙනවා.තව දුරටත් මෙවැනි තත්වයට පත්වෙනවා නම් අපි මේ සභාව තව දුරටත් ආරක්ෂා කරන්නේ නැති බව මතක් කරමින් නිමාලක මන්ත්‍රීතුමාන්ලා,සුදේශ් මන්ත්‍රීතුමන්ලා එදා ගත්ත තීන්දු ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කණගාටුවට පත්වන බවත් අවසාන වශයෙන් සිහිපත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා

මම මේ සභාව නියෝජනය කරපු දවසේ ඉඳලාම මේ කොම්පෝස්ට් එක ගැන තමයි කථා කරේ.මේ අතුල මන්ත්‍රීතුමා මේ ගැන කථා කරා.මම සතුටු වෙනවා මේ අවසාන කාලයේ හෝ කමිටුවක් පත් කරලා නිසි කළමණාකරනයකට කටයුතු කිරීම ගැන.ඒකේ තියෙන වංචා දූෂණ නැති කරන්න පුළුවන්.ඇත්තටම ඒ මන්ත්‍රීවරුන්ට ස්තුති කරනවා.මේ සභාවට තිබුණ ලොකු ප්‍රශ්නයක් තමයි මේ කොම්පෝස්ට් එක.හිටපු සභාපතිතුමාටත් මේ නිසා ප්‍රශ්නයක් වුණා.ජනතා උද්ඝෝෂණ ආවා.ඒ නිසා මාසයක් වැනි කෙටි කාලයක් තුල මේ වගේ තත්වයකට මේ ගැටළුව නිරාකරණය කිරීම ගැන ස්තුතිය පුද

කරනවා.සභාපතිතුමනි,ඔබතුමා ඊට අවශ්‍ය ශක්තිය, සහයෝගය ලබා දීලා මේ කොම්පෝස්ට් එකේ ආදායම වැඩි කර ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මිය

මුලින්ම මම ස්තූතිය පල කරනවා කොම්පෝස්ට් අංගනය පිලිබඳ විස්තර සොයා දීම සම්බන්ධව ඒ කමිටුවේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට.එතුමන්ලා දැඩි ලෙස මහන්සි වෙලා අපිට ඒ පිළබඳ කරුණු අනාවරණය කරලා තියෙනවා.ඒ වගේම අතුල මන්ත්‍රිතුමා ඉදිරිපත් කරපු කරුණු එක්ක සභාවටත් අවස්ථාව තියෙනවා නිරවද්‍යභාවය ඔප්පු කිරීමට හෝ කරුණු දැක්වීමට.ඒ අනුව තමයි අවසාන නිගමනයකට එන්න වෙන්නේ.ඒ වගේම අපි කණ්ඩායම් රැස්වීම්වලදී මේ ප්‍රශ්න දිගින් දිගටම කථා කරා.කරුණු පෙන්වලා දුන්නා.ඔවුන්ට අවස්ථාවක් දීලා ක්‍රියා කරානම් මේ ප්‍රශ්න අද ඇති වෙන්නේ නෑ.දේශපාලඥයන්ට වගේම රාජ්‍ය ආයතන වලට,රාජ්‍ය නිලධාරීන්ට ලොකු විවේචන තියෙනවා.මිනිස්සු ඉස්සර වගේ නෙවෙයි දැනුවත්. මේ කරුණු එලියට ගියාම යම් දවසක මේ සභාව ඉදිරිපිටත් උද්ඝෝෂණ කරන්න පුළුවන්.ඒ වගේම රුවන්දි මන්ත්‍රිතුමියගේ ප්‍රශ්නය බැලුවාම එතුමිය අවුරුදු හතරක් තිස්සේ මේ ගැටළුව නිවැරදි කරන්න යන්නේ.ඒකට ඉඩක් නෑ කියන්නේ ඇත්තටම ඒ මන්ත්‍රීධූරයෙන් වැඩක් නෑ.ඒ වෛරය නිසා තමයි මෙතුමියට මරණ තජර්න කරන්නේ.ඒ සම්බන්ධව අදටත් ගත්ත ක්‍රියාමාගර්යක් නෑ.ඒ නිසා මේ සම්බන්ධව නිවැරදි මාගර්යට යොමු වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ටෙක්ලා ෆ්ලෝරි මිය

ඇත්තටම මම කාලෙකින් තමයි මේ කතා කරන්නේ.අපි දන්නවා මේවා යන ක්‍රමය.ඒ නිසා කතා කරන්නෙම නැති තරම්.නමුත් කාන්තා මන්ත්‍රීවරියක් විදියට ඇත්තටම මේ මන්ත්‍රීතුමියට වුණ දේ සම්බන්ධව සමස්ත කාන්තාවන් වෙනුවෙන් හෙලා දකිනවා.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
මම මුලින්ම කියන්න ඕනේ අපේ ස්වාමීන් වහන්සේ කියපු සියලු කරුණු සත්‍යයි කියන එක.මටත් කීප වතාවක් කථා කරා මේ සභාව පෙරලන්න.මම කිව්වා බැහැ කියලා.අපි පරිනත දේශපාලඥයෝ විදියට ඇවිල්ලා ඒ වගේ දේවල් කරන එක හරි නෑ.අපේ පැරණිම මන්ත්‍රීවරයෙක් ඉන්නවා මෙතන.එතුමත් කථා කරයි.නමුත් අපි සභාපතිතුමාට කිව්වා මේ තියෙන කමිටු සක්‍රීය කරන්න.ඒවට බලය දෙන්න කියලා අධීක්ෂණය කරන්න.මොකද නවක මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා වගේම ඒ අය වේගවත් කියලා.නමුත් ඒක කෙරුණේ නෑ.එච්චරයි මම දකින්නේ.හොරනාමයක් නම් මම ගාන්නේ නෑ.මට කොම්පෝස්ට් ලබා දුන්නා.ඇත්තටම සභාපතිවරයෙක්ට යම් තැනකට ගියාම වගාවක් දැක්කම ඒවාට එහෙම දෙන්න බැරිනම් වැඩක් නෑ.මුදලෙන් භාගයක් අය කරලා දෙන්න කියනවා.ඒක වැරදියි.මේ කොම්පෝස්ට් එක ලාභ ලබන්න නෙවෙයි කටයුතු කරන්නේ.නමුත් මේකේ විනිවිදභාවයක් තියෙන්න ඕනා.ඇත්තටම මම මේ කමිටුව පත්කරන්න කටයුතු කිරීම ගැන සතුටු වෙනවා.මම කමිටුව පත්කරේ සභාපතිතුමාගෙන්වත් ලේකම් මිස්ගෙන්වත් පලි ගන්න නෙවෙයි.මම කියන්නේ මේ

කොම්පෝස්ට් අංගනය හා ඒ කටයුතු අතුල මන්ත්‍රීතුමාට දුන්නානම් මේ කිසි ප්‍රශ්නයක් වෙන්නේ නෑ.එහෙනම් එතුමා වගකියන්න ඕනානේ.ඒ වගේම ලයිට් වලටත් කමිටුවක් පත් කරානම් හරි.දැන් කාලේ ගිහින් ඉවරයි.මම හිතන්නේ නෑ රාජ්‍ය සේවකයෝ සියල්ල ශුද්ධවන්තයෝ කියලා. ොකාහොම වුනත් දැන් කොම්පෝස්ට් අංගනය නිවැරදි මාගර්යට වැටිලා තියෙනවා. ඒ වගේම මම තව දෙයක් කියන්න ඕනා මේ ලේකම්තුමියත් යම් කිසි මෙහෙවරක් කරපු කෙනෙක්.ඒ නිසා සභාපතිතුමා අපිට තියෙන්නේ මේ ටික කාලෙට හරි මේ ගත්ත තීරණ ක්‍රියාත්මක කරන්නයි අපිට තියෙන්නේ.සභාපතිතුමා ඒකට බලය දෙන්න.ඔබතුමන්ලාත් මේක ඉස්සරහට ගෙනියන්න.එතකොට වැරදි සියල්ල නවතියි.නමුත් මම එකම දේකට විරුද්ධ වෙනවා.සභාපතිතුමාට මුදලෙන් භාගයක් ගෙවලා කොම්පෝස්ට් ගන්න කියන එක හරි නෑ.කාගේ හරි වගාවක් බලන්න ගියාම කොම්පෝස්ට් ටිකක් ඉල්ලුවම දෙන්න බැරිනම් ඒ සභාපතිකමෙන් වැඩක් නෑ.නමුත් ඒවා දැනුවත් කරලා නීත්‍යානුකූලව සටහන් වීමක් වෙන්න ඕනා. ඒ වගේම අද තව දෙයක් වුණා.මේ සභාවේ ආදායම අඩු වෙනකොට නිලධාරියෙක් ඉන්නවා බලන්න.අද ඒකට ඔහුට බලය ලබා දුන්නා අධීක්ෂණය කරන්න.ඒ නිසා මේවා ක්‍රියාත්මක වෙනකොට ප්‍රාදේශීය සභාව හොඳ තත්වයට එයි කියලා විශ්වාස කරනවා.ඒ වගේම මම එදා කමිටුවට අතුල මන්ත්‍රීතුමාව දැම්මේ නැත්තේ එතුමාගේ කොට්ඨාශයේ නිසා.ඒක මගෙන් වුණ අඩුපාඩුවක් කියලා හිතනවා.දැන් ඒ පත් කරපු කමිටුව ඒ විදියටම ස්වාධීනව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා
අද මතුගම ප්‍රාදේශීය සභාවේ සුවිශේෂී දවසක්.ඒ මොකද කියන්න අවශ්‍ය හැමදේම හැම කේෂ්ත්‍රයටම කියවුණා.අපි ගිය සභාව ඉවර වෙලා ගිහින් ටික දවසක් යනකොට ගම්වල අපිව හොරු විදියට හංවඩු ගහන තැනට මාධ්‍ය පත් වුණා.මොකද මතුගම ප්‍රාදේශීය සභාව හොර ගුහාවක්,කොම්පෝස්ට් එකේ හොරකම් කරලා,සභාවේ හොරකම් කරලා කියලා මාධ්‍යයේ පලවුණා.එතකොට මන්ත්‍රීවරු විදියට අපිටත් ඒ චෝදනාව එනවා.ඒ නිසා ඒවා නිවැරදිව සටහන් වෙන්න ඕනා.අපි මතුගම ප්‍රාදේශීය සභාව වශයෙන් සභාපතිතුමාට,සියලු මන්ත්‍රීවරුන්ට ගරු කරන්න ඕනා.නමුත් අපි යම් වැරුද්දක් දැක්කාම නිශ්ශබ්දව ඉඳලා හරියන්නේ නෑ.ඒක වැරදියි.අනිත් එක තමයි අපි මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් පෙනී සිටින්නේ නැතිනම් ඒකේ අපහාසය සියලු මන්ත්‍රීවරුන්ට එනවා.රුවන්දි මන්ත්‍රීතුමියට නෙවෙයි ඒ තජර්නය කරේ.සමස්ථ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට.අපි ඒ විදියට හිතුවානම් මීට වඩා පියවරක් මේකට අරගෙන තියෙන්න ඕනා.ඒ පිළිබඳ මන්ත්‍රීවරු වශයෙන් අපිත් නිලධාරීනුත් ලැජ්ජාවට පත්වෙන්න ඕනා මේ දක්වා ක්‍රියාමාගර්යක් නොගැනීම සම්බන්ධව.අද නිලධාරීන්ට චෝදනා එල්ල වුණා.නමුත් සමස්ථ නිලධාරීන් වැරදි නෑ.සමහර නිලධාරීන් අතින මුදල් වියදම් කරගෙන,කාලය,ශ්‍රමය වැය කරලා සභාවට සේවය කරනවා.අපි ඒ පිළිබඳ සතුටු වෙන්න ඕනා.ඒ නිසා අද මේ කතා කරපු දේවල් එක්ක ඉදිරියේදි මතුගම සභාව අදශර්මත් සභාවක් වෙයි කියලා මම හිතනවා.ඒ වගේම විශේෂයෙන් කියන්න ඕනා මේ කොම්පෝස්ට් එක සම්බන්ධව පත් කල කමිටුව තමන්ගේ යුතුකම නිවැරදිව ඉටු කරලා තියෙනවා.ඒ ගැන අපිට සතුටු වෙන්න පුළුවන්.ඒ සඳහා කමිටුවක් පත් කරන්න කටයුතු කල උප සභාපතිතුමාටත්

ස්තුතිය පුද කරනවා.ඒ වගේම අද මන්ත්‍රීවරුන්ට තියෙන්නේ ඉතාම පහත් තැනක්.ඒ අපි කරපු වැරදි නිසා නෙවෙයි.සමහර අය කරපු වැරදි,රාජ්‍ය සේවකයෝ කරපු වැරදි,හිතාමතා දැඩි තීරණ ගත්ත අය කරපු වැරදි නිසා.ඒ තත්වයෙන් මිදෙන්න ඉදිරියේදී අපි සියලු දෙනා කටයුතු කරමු කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
සභාපතිතුමා කොම්පෝස්ට් අංගනය ගැන කථා කරන කොට මේ වෙනකොට කොට්ට 690ක් තියෙන්න ඕනා.ඒවාට මොකද වුණේ කියලා දැන ගන්න ඕනේ.ඒ වගේම මේ වෙනකොට ලේකම්තුමියගෙන් ඉල්ලීම් කීපයක් කරලා තියෙනවා.ඒ වගේම කොම්පෝස්ට් අංගනයේ පෙ.ව6.00-8.00 දක්වාත් ප.ව 4.30-6.00 දක්වා එතන මුරකරුවෙක් නෑ.ඒ නිසා ඒ කාලය තුල හොරකමක් වෙන්න පුළුවන්. ඊට අමතරව එතන වැඩ බලන කෙනා ජේ.සී.බී එක ඉල්ලලා තියෙනවා.එදා ඉඳලාම ඉල්ලුවා කිව්වා එතන තියෙන කසළ ඉවත් කර ගන්න.නමුත් ලබා දීලා නෑ.ඒ නිසා සභාපතිතුමා මේ සම්බන්ධව ඉතා ඉක්මනින් විධිමත් පරීක්ෂණයක් කරලා අවශ්‍ය තීන්දු තීරණ ගන්න ඔබතුමාට පුළුවන්.ඒ වගේම අපේ සභාවේ මුදල් වියදම් කරලා තියෙන්නේ අනවශ්‍ය දේවල් වලට.කඹුරුගොඩ ලක්ෂ 15ක් වියදම් කරලා බැම්මක් බැන්දා. ඒක අදටත් වැඩක් නෑ.වැඩ අවසන් කරලාත් නෑ.නමුත් මුදල් ගෙවලා ඉවරයි.ඒකේ මිනිස්සුන්ට ප්‍රයෝජනයක් ගන්න බැහැ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒකේ 10% ගෙව්වේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
10% ගෙව්වේ නැති වුණාට සභාපතිතුමා ඒ බැම්ම ඇද වෙලානේ.ඒකෙන් ප්‍රයෝජනයක් නෑ.ඒ වගේ මුදලක් වියදම් කරලා දෙයක් කරන කොට අඩුම තරමේ ගමේ සමිතියකින්වත් අහන්න තිබුණා.මේවා හොරකම් කරන්න කරපු ව්‍යාපෘති.මේ සභාවේ වැදගත් කිසිම ව්‍යාපෘතියක් කරලා නෑ මේ වෙනකොට.මෙතන අපි නිලධාරීන්ට චෝදනා කරනවා.ඒ ව්‍යාපෘති යෝජනා කරපු අය,ඒවා කරපු අය හොරකම් කරන්න තමයි මේවා කරලා තියෙන්නේ.එතකොට වැලිපැන්න පිට්ටනියේ බැම්ම,මේවාට ප්‍රදේශයේ මිනිස්සු දොස් කියනවා.ඒවා කාගෙන් අහලද මොකටද කරේ?රම්සාන් මන්ත්‍රීතුමා හැමදාම ප්‍රශ්න කරනවා මේ ගැන.මේවා කරලා තියෙන්නෙම හොරකම් කරන්න.අද රටේ දේශපාලඥයින්ට තියෙන ගෞරවය නැති වෙලා තියෙනවා. පොලිස් නිලධාරීන්ට,හමුදාවට තියෙන ගරුත්වය නැති වෙලා තියෙනවා.ඒ මොකද රටේ හිටපු නායකයා නිසි වෙලාවට තීන්දු තීරණ නොගැනීම නිසා.ඇත්තටම මේ සභාවෙත් සභාපතිතුමා නිසි වෙලාවට තීන්දු තීරණ ගන්නේ නැතුව මේ සභාව හැල්ලුවට ලක් කරලා තියෙන්නේ.ඒක නිසා මම හිතනවා මේ කටයුතු කරන කොට සභාපතිතුමා මේ පුටුවේ ඉන්න එකත් සුදුසු නෑ කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි තුසිතා ප්‍රියංගනී මිය

මම කථා කරන්නේ නිමාලක මන්ත්‍රීතුමා කරපු චෝදනාව සම්බන්ධයෙන්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මට කථා කරන්න අවස්ථාව දෙන්න.මගේ හිතට එකඟව මම කියන්නේ මම හොරෙක් නෙවෙයි.ඔය ව්‍යාපෘතිය කරේ චින්තක මහත්තයා.අපේ සමන්ත මන්ත්‍රීතුමා තමයි අධීක්ෂණය කරේ.සෑම කොට්ඨාශයකම වැඩවල අධීක්ෂණයට මම නෙවෙයි ගියේ.ඒ අදාල මන්ත්‍රීවරයාට භාර දුන්නා.එතකොට ප්‍රශ්නයක් ආවා.ගමේ සමිතියක් නෙවෙයි වෙන එකක් අත්සන් කරේ.ඔබතුමියට ඒ ප්‍රශ්නය ආවා.මේක ඇලවුනා.ඒක වැරදි ඉදිකිරීමක්.මේවා සපිරි ගමක් ව්‍යාපෘති.සභා අරමුදල් නෙවෙයි.ඇස්තමේන්තු සභාවේ ඒවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි තුසිතා ප්‍රියංගනී මිය

ඔය ප්‍රශ්නේ මම ඒ දවස්වලම කිව්වා සභාපතිතුමා.අද බැම්මක් පේන්නවත් නෑ.ගමේ සමිතියකට ඔය ව්‍යාපෘතිය දුන්නානම් අපිට ඒ අයට කියන්න තිබුණා.හොරවල සුභසාධක සමිතියට තමයි දීලා තියෙන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට විමශර්නයකට දාන්න.වෙන මොකක්ද කරන්නේ?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
එතකොට මොනවා හරි වැරදි ව්‍යාපෘති කරලා ඒකේ ප්‍රතිඵලය කවුරුවත් භාර ගන්නේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
එතන වුණේ මෙහෙමයි.කඹුරුගොඩ වේල්ල කියන්නේ ගැඹුරු කුඹුරක්.මේකේ ඇස්තමේන්තුව මදි.අඩි හතරක්වත් යට අත්තිවාරම යන්න ඕනා.එතන වරදක් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි තුසිතා ප්‍රියංගනී මිය

ගමේ සමිතියකට ඔය ව්‍යාපෘතිය දුන්නානම් අපිට ඒ අයට කියන්න තිබුණා.ගමේ සමිතියකට අත්සන් කරලා හොරවල සුභසාධක සමිතියට තමයි දීලා තියෙන්නේ. අපේ සමිතියකට දුන්නානම් අපේ ගම සංවධර්නය වෙනවානේ.මම නිතරම කිව්වාත් ඇහුවේ නෑ.අනිත් කාරණය තමයි බැම්ම සීමාවේ හොඳට තිබුණ පාරත් දැන් කැඩිලා තියෙන්නේ.ඒ වගේම මම ලේකම්තුමියටත් කිව්වා පාර ශුද්ධ කරලා දෙන්න කියලා.මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉඳලාත් මේවා කෙරෙන්නේ නෑ කියලා මිනිස්සු දොස් කියනවා.ඒ වුනාට කුණු ගෙනත් දාන ඒවා සේරම ගෙනත් දාන්නේ ඒ පැත්තට.මම ඒකයි කිව්වේ මෙහෙන් එන දවසට දැනුවත් කරන්න.එතකොට අපිට ගමේ අයවත් යොදවලා කරන්න පුළුවන්.නැත්නම් සේවකයන් හරියට කරන්නේ නෑ.ඒ නිසා මම හිතනවා ඊළඟ සභා වාරයට කලින් මේ ටික කරලා දෙයි කියලා.මේ අවුරුදු හතරටම මට සභාවෙන් කියලා කරලා දීපු දෙයක් නෑ.අපි ඉස්සර යෝජනා දැම්මා.අපේ ස්වාමීන් වහන්සේ කිව්වා යෝජනා වැඩියි කියලා.ඒ නිසා එක්කෙනෙක්ට යෝජනා තුනකට සීමා කරා.එහෙම කාලයක් තිබුණා මේ සභාවේ.නමුත් අද කවුරුවත් යෝජනා දාන්නේවත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් දශර්න ජයසේකර මහතා

මම කමිටු වාතර්ාව ඉදිරිපත් කරා විතරයි.අදහස් දැක්වීමක් කරේ නෑ.අපි සභාවෙන් ඉල්ලපු දත්ත අනුව නොමිලේ ලබා දීලා තියෙනවා පොහොර කිලෝ 61485ක්.අපි නැවත ඉල්ලීමක් කරාම පොහොර අංගනයෙන් හා අලෙවි මධ්‍යස්ථානයෙන් ලබා ගත්ත විස්තර අනුව පොහොර කිලෝ 48180ක් නොමිලේ නිකුත් කරලා තියෙනවා.මෙතන කිලෝ 13305 ක වෙනසක් තියෙනවා.මේ තොරතුරු බැලුවාම කමිටුව නොමඟ යැවීමක් කරලා තියෙන්නේ.ඒ නිසා මේ ගැන විමෂර්ණයක් කරන්න වෙනවා.අපිට දීපු දත්ත එක්ක තමයි අපි කථා කරන්නේ.විශේෂයෙන් අපි කථා කරන්න ඕනේ සභාව නඩත්තු වෙන්නේ මිනිස්සුන්ගේ බදු මුදල් වලින්.2018 ඉදන් මේ වෙනකම් සභාවේ සියලු වැටුප් විදියට ගෙවලා තියෙන මුදල රු.27720000 ක්.නමුත් අපි සභාවට පත්වෙලා මේ දක්වා සභාවට කොම්පෝස්ට් එකෙන් අලෙවි ආදායම විදියට ලැබිලා තියෙන්නේ රු880616.00 ක මුදලක්.මේ වගේ තත්වයක් තුල සභාවට ආදායමක් උත්පාදනය වන වැඩපිළිවෙලක් මේ දක්වා හැදුවේ නෑ.අපි මේ දක්වා සොයා ගත් තොරතුරු සහ සේවකයන්ගෙන් ලබා ගත්ත තොරතුරු අනුව ඔබතුමා දන්නවද දන්නේ නෑ 2021 පොහොර වංචාවක් සිද්ධ වුණා.පෙහොර කොට්ට 45ක වගේ.ලේකම්තුමියත් දන්නවා.ඒ පරීක්ෂණ භාගෙට කරලා නතර කරලා තියෙනවා.ඒ වගේම මේකේ තියෙනවා සභාපති නියෝග,මන්ත්‍රීවරුන්ට,හිටපු සභාපතිවරුන්ට,සභා සේවකයන්ට නොමිලේ කොම්පෝස්ට් ලබා දීලා තියෙනවා.මේවාට ලිපි ගොනුවක් තියෙන්න ඕනා.මුදලට ගත්තානම් එහෙම අවශ්‍ය වෙන්නේ නෑ.අපි කියන්නේ කමිටුවේ අවශ්‍යතාවය මත ඒ නොමිලේ නිකුත් කරපුවට අදාල ලිපි ලේඛණ කමිටුවට ඉදිරිපත් කරන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මේ කොම්පෝස්ට් අංගනය පටන් ගත්තේ ආරියවධර්න මහත්තයාගේ කාලේ.ඊටපස්සේ කරුණාරත්න මහත්තයාගේ කාලේ සාමාන්‍ය විදියට තිබුණා.පසුව 2006 දී අතුල මන්ත්‍රීතුමාත් දන්නවා හොඳට හදලා සවර් සම්පූණර් කරා.2010 දී අපි අයින් වුණා.ඊට පස්සේ 2011ඉදන් 2017 වෙනකන් පොහොර අලෙවි කරේ මේ මුර කුටියේ.එතකොට අපිට අපද්‍රව්‍ය අධිකාරියෙන් ලක්ෂ 10කට වැඩි මුදලක් දීලා තිබුණා අලෙවිසැල හදන්න.ඒක වහලා තිබුණේ.අපි 2007 පාඨලි චම්පික ඇමතිතුමා ඇවිල්ලා කසළ එකතු කරලා වගර් කරන්න ගොඩනැගිල්ල සෙන්ට්‍රල් එක ළඟ ඉඩමේ හැදුවා. නගරයේ ගම්වල කකළ වෙන් කරලා ගන්න ට්‍රැක්ටරයක් දාලා ඒ කටයුතු කලා.පසුව අපි 2017 පත් වෙනකොට සෙන්ට්‍රල් එක ළඟ ඉඩමේ ගොඩනැගිල්ල රු.10000කට කුලියට දීලා තිබුණා.ඒක නිදහස් කරලා ගත්තා.ඊළඟට පොහොර අලෙවිසැල විවෘත කරලා සේවකයෙක් දැම්මා දෛනික පඩියට.එතැනට පොහොර අංගනයෙන් ගෙනැල්ලා අලෙවි කරන්න තමයි ක්‍රමවේදය හදලා තිබුනේ. ඒ සේවකයාගෙන් වාතර්ාවන් මම ලබා ගත්තා.ඊට පසුව පොහොර අංගනය අවිධිමත් විදියට තිබුණේ.අපිට මේක දියුණු කරන්න මුදල් ලැබුණේ නෑ. ලක්ෂ අනූ ගානක් වියදම් කරලා හැදුවා.අතුල මන්ත්‍රීතුමාත් දන්නවා ඒවා ඉදි කරලා තිබුණ ආකාරය.ඊට පස්සේ ඉඩම සම්බන්ධ ප්‍රශ්නයක් ආවා.මට ලොකු

චෝදනාවක් ආවා ලක්ෂ 35ක් අල්ලස් ඉල්ලුවා කියලා. මම අල්ලස් එකට ගිහිල්ලා ඒ මහත්තයාගෙන් ඇහුවා.මේ ලේකම්තුමියයි තව නිලධාරීතුමියක් ඉඳියා.මම ඇහුවා ඔයා කියන්න මම සල්ලි ඉල්ලුවද කියලා.අන්තිමට එතුමා කිව්වා නෑ ඔබතුමා ඉල්ලුවේ නෑ.මම දෙන්න හිටියේ කියලා.මම ඒකෙන් නිදහස් වුණා.මගේ ඥාතියෙක්.මේ අතුල මන්ත්‍රීතුමාගෙත් ඥාතියෙක්.ඒ මහත්තයා මට විරුද්ධව ජනාධිපතිතුමාට,ආණ්ඩුකාරතුමියට කරුනු ඉදිරිපත් කරා.ඇත්තටම ඒ ඉඩම විකුණුවේ පොලිසියේ රාලහාමි කෙනෙක්.ඊට පස්සේ මට චෝදනා කරා සහරාන්ගේ මාගර්යෙන් පල්ලියක් හැදුවා කියලා.ඒකේ හඩපටිය තියෙනවා සභාවේ වැඩ කරන කාන්ති මහත්මිය ළඟ.ඒ ඇත්ත කථාව ස්වාමින් වහන්සේනමක් ඇවිත් කිව්වා.මමයි,තාක්ෂණ නිලධාරී මධුරි මිසුයි ගිහින් තමයි ඒ ගොඩනැගිල්ල තහනම් කරලා ආවේ.ඒ මුස්ලිම් මහත්තයා අපිට රසකැවිලි වගයක් දුන්නා.මට ඇවිත් කිව්වා මුහුදේ ගිලුණු නැවක් දෙන්නම් කියලා විකුණගන්න.මම කිව්වා මට ඕනේ නෑ.රම්සාන් මන්ත්‍රීතුමා හිටියානම් කියනවා.එතුමාව එක්කගෙන ආවා ඔබතුමාට සලකන්නම් කියලා.ඇත්තටම මට සල්ලි ගන්නවානම් අවස්තාවල් තිබුණා තමයි.ඒවා කලේ නෑ.ඊළගට පොහොර එක ගැන කථා කරන්නේ.මගේ නමට දාලා තියෙනවා කිලෝ 5500ක්.මට අපේ ඉන්න අභ්‍යන්තර විගණන මහත්තයා කිව්වා ඔබතුමාගේ නමට පොහොර වගයක් දාලා තියෙනවා කියලා.මම ඒක පිළි ගන්නවා.මම කහ වගාවට,පොල් පැල දුන්නම ඒවට,සමිතිවලට,ප්‍රාදේශීය ලේකම්ට දීපුවා තමයි මගේ නමට දාලා තියෙන්නේ.ඒවාට විධිමත් ලේඛණ නැති නිසා පොහොර එකෙන් කියන්නේ සභාපතිතුමා ගෙනිච්චා කියලා.මම ඒ මුදල් ඔක්කොම මම අද භාගයක් ගෙවනවා.මේ කහ වලට දීපුවා,මන්ත්‍රීවරුන්ට දීපු ඒවා මගේ නමට දාලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා,වැරදි වැටහීමක ඉන්න එපා.අපි මේ වෙනකම් නොමිලේ දීපු ඒවා සම්බන්ධව ප්‍රශ්න කරලා නෑ.සභාපතිතුමාට,ලියනආරච්චි සභාපතිතුමාට දීපුවා සම්බන්ධව අපි කතා කරලා නෑ.ඒ දිලත් මේකේ අක්‍රමිකතාවයක් තියෙනවානේ.සභාපතිතුමා මුදල් ගෙවනවා කියපු නිසායි මම කිව්වේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම ඒක කොහොමත් ගෙවනවා.දැන් මේක මාධ්‍යවල ගිහිල්ලා මාව හොරෙක් කරලා ඉවරයි.මන්ත්‍රීතුමාලගේ නමින් නෙවෙයිනේ මේවා දාලා තියෙන්නේ මගේ නමටනේ.ගිය මාසේ ඉඳලා සමාජ මාධ්‍යයේ යනවා සභාපති පොහොර හොරකම් කරලා කියලා.ඒක නිවැරදි කරන්න කවුරුත් නෑ.09 වෙනිදා අපේ ගෙදරට ඇවිත් කිව්වේ හොරා කාපු සල්ලි දෙන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

අපි කියන්නේ මේ හොරකම් නවත්තන්න සභාපතිතුමා අපිට උදව් කරන්නෑ කියන එකයි.ඒක දවසක් කමිටුවට ඔබතුමා සහභාගී වුණේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මට ආරාධනා කරේ නෑ.මම මෙතන හිටියා.මම කමිටුවට අනවශ්‍ය බලපෑමක් කරේ නෑ.මම මුලින්ම  අභ්‍යන්තර විගණක මහත්තයාට ලිඛිතව දුන්නා දින තුනක් ඇතුලත මේ සම්බන්ධව වාතර්ාවක් දෙන්න කියලා.මන්ත්‍රීතුමන්ලාගේ වාතර්ාව මෙතෙන්ට එන්න ඉස්සර මට ආවානම් මටත් වැටහීමක් ගන්න තිබුණා.මම මේවා හංගන්න යන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මේ වාතර්ාව හදලා ඉවර කලේ ඊයේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒකට මම මුකුත් කියන්නේ නෑ.මේ සභාවෙන් පොහොර අංගනය සම්බන්ධව මේ වෙනකොට මට කිසිම වාතර්ාවක් දීලා නෑ.පාලිත මහත්තයා මේක නිවැරදිව කරලා තියෙනවා.මේකත් අහගන්න.2021 මුදලට නිකුත් කිරීම් තියෙනවා ජුනි,සැප්තැම්බර්,ඔක්තෝබර්,නොවැම්බර් තියෙන්නේ 6750යි.බිල් අංක,රිසිට් අංක තියෙනවා.ඒ සඳහා රු.65500ක් තියෙනවා.2021 නොමිලේ නිකුත් කරලා තියෙනවා මාතර්ු ඉඳලා දෙසැම්බර් වෙනකම් දාලා තියෙනවා.2022 නොමිලේ නිකුත් කරපුවා දාලා තියෙනවා. ඒ වගේම අලෙවිසැලට නිකුත් කරපුවා දාලා තියෙනවා. මම මේකේ පිටපතක් දෙනවා.එතකොට එකතුව අරන් බලන්න පුළුවන්.මේකත් බලලා ඔබතුමන්ලා නිවැරදි දේ හොයා ගන්න.මම මේ මුදල ගෙවන්න ඕනේ.නැත්නම් මේක නිවැරදි වෙන්නේ නැනේ.ඊළඟට පොහොර එකේ ගොඩනැගිල්ල විවෘත කරන්න තිබුණ බාධාව ගැන කතා කරන්න ඕනා.ඒක මේ අය කටර්න් එකකින් වෙන් කරන්න හැදුවේ.මම කිව්වා පාටිෂන් කරලා හදන්න කියලා.ඒ වගේම නම ගහන කොට මතුගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලදී කියලා ගහන්න කිව්වේ.මගේ නම් ගහන්න යන්නේ නෑ මම.අපි නම් ගැහුවේ දෙකයි ඒ දෙකේම මන්ත්‍රීවරුන්ගේ නම් එක්ක තමයි ගැහුවේ.

මම කියන්නේ මේ පරීක්ෂණය කරගෙන යමු.මම ලබන මාසේ කොහොමත් තීරණයක් ගන්නවා.අද දවසෙත් මේ දීමනාව දෙන්න ආවේ.දැන් ඒක කරන්න විධියක් නෑ.ඒ දීමනාවෙන්ම මම භාගයක් මුදල් ගෙවනවා.මට සහතික වෙන්න පුළුවන් මම පොහොර විකුණලා නෑ.මම එක දෙයක් ගැන කණගාටු වෙනවා.අපි ආණ්ඩු පක්ෂයක් විදියට සභාවේ තීරණ ගත්තා.නමුත් විපක්ෂ මන්ත්‍රීවරුන්ට මම එක ලයිට් එකක්වත් දීලා නෑ.අපි සහයෝගයෙන් වැඩ කරගෙන ගියා.අපේ මන්ත්‍රී කණ්ඩායම හොඳ සහයෝගයක් දුන්නා.පොහොර එක සම්බන්ධව මම හැමදාම කිව්වා අට්ටි ගහන්න,තල්ලු කරන්න,ගේන කසල වාතර්ා කරන්න කිව්වේ  නැද්ද?ඒවා කරන්නේ නැතුව ගිය නිසා තමයි විධිමත් භාවයක් නැති වුණේ.සේවක ප්‍රශ්න ගැන බැලුවේ නැද්ද ?සේවක මැරු කිරීමක් කරා.ඒක මම නැවැත්තුවා.ඒ වගේම සුරේශ් මන්ත්‍රීතුමා මාගර් සංවධර්න අධිකාරියේ ඉන්න කොට  නිවාඩු අත්සන් කරලා දුන්නා.ධම්මික මන්ත්‍රීතුමාට නිවාඩු අත්සන් කරලා දුන්නා.ඒ දුන්නේ කොම්පෝස්ට් අංගනය අධීක්ෂණය කිරීම,වෙළඳපල අධීක්ෂණය යන ඒවාට.මම පුදුම වෙන්නේ මම කරේ නැති එක මට කියන්න තැනක් නෑ.මම වංචා කරානම් ඒ යන දවස්වල ඔබතුමාලට අහු වෙන්න ඕනේ.පරිපාලනයේ දුවර්ලකම් මම පිළි ගන්නවා.ඒ නිසා තමයි ප්‍රශ්න මේ තරම් උග්‍ර වුණේ.මේ පොහොර අංගනයේ මට ලොකු ප්‍රහාරයක් ආවා.මම ඒකේ සේවකයෝ ගැන හොයලා බැලුවා.ඒ අය

කියනවා නම් සභාපති වෙනකම් විතරයි ආවේ ඊට පස්සේ ආවේ නෑ කියලා මම ඒ අයත් එක්ක සාකච්ඡාවක් දානවා.මම ඔබතුමන්ලා ගැන අහිතක් හිතන්නේ නෑ.ඔබතුමන්ලා කරේ ඔබතුමන්ලාගේ වගකීම.මාව හොරෙක් හැටියට පෙන්වුවම මට නිවැරදි කරන්න තැනක් නෑ.ඒ වගේම අද මම පත්වීම් දීපු අය පවා කියනවා ඔබතුමා නෙවෙයි අපිව දැම්මේ කියලා.මම තව කාරණයක් කියන්නම්.වසන්ත මහත්තයාට මම මහජන සම්බන්ධතා නිලධාරී දෙන්න හැදුවම කිව්වා නෑ මට කොම්පෝස්ට් එක දෙන්න කියලා.ඒකට දැම්මා.ඊට පස්ේස එකේ ඉන්න බෑ කිව්වාම මම චක්‍රලේඛණ ගෙනැල්ලා සභාවට දාලා තමයි දුන්නේ.මොකද එයා හමුදා සේවයේ ඉඳපු කෙනෙක්.ගන්නකොටම කිව්වේ ඔබතුමා ඉන්නකම් විතරයි මම වැඩ කරන්නේ කියලා.මම ලබන මාසේ යනකොට මේවා අයින් කරලා යන්න ඕනේ.දැන් ඉන්න  කෙනාට දුන්නේ මෙතන වැඩ කර ගන්න කෙනෙක් නෑ.ඒ ළමයා කායර්ාලයේ කායර්ාල කායර් සහයක වැඩ ටික කරනවා.කාන්තිලාව ස්ථිර කරන්න බැහැ.වයස ප්‍රශ්නය නිසා.ඒක නිසා මම කියන්නේ අපි වගකීමෙන් වැඩ කරමු.මේ රටේ තියෙන තත්වය උඩ දේශපාලඥයන්ට අනුකම්පා කරන සමාජයක් නෙවෙයි තියෙන්නේ.ඒ නිසා අපි බුද්ධිමත්ව වැඩ කරමු.මගේ නෝනටයි දරුවෝ දෙන්නටයි නිදහසේ ඉන්න තිබුණම ඇති.මට ජීවිතේ නැති වුනාට ප්‍රශ්නයක් නෑ.මම කාටවත් වෛර කරන්නේ නෑ.මන්ත්‍රීතුමා මට චෝදනාවක් කරා හාමුදුරුවන්ගෙන් මම සල්ලි ගත්තා කියලා.හාමුදුරුවෝ තමයි මට එදා ඉඳලා උදව් කරන්නේ.මේ ලලිත් මහත්තයා දන්නවා.මම කිසිම කොන්ත්‍රාත් කරන කෙනෙක්ගෙන් සල්ලි අරගෙන නෑ.ඒ වගේම මම ගිය සැරේ යනකොට කෝටි දෙකහාමාරක් ගිණුමේ තිබුණා.වෙළඳපළ හදන්න ආපු මුදල්.ඒක අපිට කරන්න බැරිවුණා.ඒකටත් මට කිව්වා ඇයි සල්ලි ගෙනාවේ නැත්තේ කියලා.එහෙම සල්ලි ගිනියන්න බෑ.හොරකම් කරන්න බෑ.මිනිස්සුන්ට වැඩක් කර දුන්නාම ඡන්දෙකට උදව් කරනවා.ඒ වගේ දේවල් කරන්න පුළුවන්.ඒක නිසා අද මම තනියෙන්.ඔබතුමන්ලා ඔක්කෝම එක පැත්තක්.මම කණගාටු වෙන්නේ නෑ.මම මේකේ අවුරුදු **25**ක් ඉඳලා තියෙනවා.මම නැවත ඡන්දේ ඉල්ලන්නේ නෑ.මෙතන ගැටළුවක් වෙලා තියෙන එක මම පිළිගන්නවා.අපි ඒකට විමශර්නයකට යමු.ඒකනේ ක්‍රමය.නමුත් මෙහෙමයි කෙනෙක්ට එක පාරට මාධ්‍යයෙන් හොරනාමය ගාවන්න එපා.අපේ දරුවෝ,නෑදෑයෝ අහනවා ඇයි මේ හොරකම් කරේ කියලා.මම කියන්නේ ඔප්පු වෙනකම් මේ චෝදනාවලින් මාව නිදහස් කරන්න.

ඒ වගේම තව දෙයක් කියන්න තියෙනවා.කාන්ත මන්ත්‍රීතුමාගේ ඕවිටිගල ප්‍රදේශයේ මාගර් දෙකක් පිලිබඳ අපිට ඉල්ලීමක් කරලා තිබුණා මාගර් ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් කරන්න කියලා.පුස්වැල්තැන්න මාගර්යයි.සඳසිරිගම මාගර්යයි.දැන් මෙහෙම ගැටළුවක් තියෙනවා.ෙම් මාගර් සඳහා මුදල් වෙන් කරපු ඒවා අපිට කරන්න වෙලා තියෙන්නේ කොන්ත්‍රාත් දෙන්නේ නැතුව.අපි මේ සඳහා අවශ්‍ය බඩු කෙලින්ම ගල් වලවල් හරහා ගන්නවා.මේවා කරනකොට මන්ත්‍රීවරුන්ව දැනුවත් කරනවා.

**7.** කාරක සභා වාතර්ාව සලකා බැලීම

**7.1** **2022.06.20** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති  කමිටු රැස්වීම් වාතර්ාව සභාවේ අනුමැතිය සඳහා සභාගත කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින්

ස්ථිර කරන ලදී.එම යෝජනාවට බෙදීමක් නොවූ හෙයින් සියළු දෙනාගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**8.** ආදායම් හා වියදම් වාතර්ා සලකා බැලීම

**8.1** **2022** මැයි මාසයේ ආදායම් හා වියදම් වාතර්ා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කිරීම

**9.** **පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

නැත.

න්‍යාය පත්‍රානුකූලව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව 4.40 ට පමණ අවසන් විය.